**වර්ෂ 2025. 11.17 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මූලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිළිගන්නා ලදී. මහ සභාව පෙ.ව. 9.30 ට ආරම්භ කරන ලදී.මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගි විය.

| අනු | තනතුර | පක්ෂය | නම |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | ජා.ජ.බ. | එම්. විකසිත පුෂ්පසූරිය මහතා |
| 2. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ | කේ.වී.ආර්.ධර්මසිරි මහතා |
| 3. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ඩී.කේ. පී. කුමාර ජයනෙත්ති මහතා |
| 4. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා |
| 5. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා |
| 6. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | අජිත් නන්දසිරි මනම්පේරි මහතා |
| 7. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඩී.ජී. ජස්ටින් රණවීර මහතා |
| 8. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.පී. මහින්ද ජයලාල් පතිරණ මහතා |
| 9. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්.ජී. එම්.නිරෝෂණ නාපාවල මහතා |
| 10. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඩබ්.ජයරත්න මහතා |
| 11. | ගරු ප්‍රා.ස.ම. | ප්‍රජා.වාමාංශික | එච්.එම්. සිසිර සේනාරත්න මහතා |
| 12. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ටී.එම්. උමේෂා මල්කාන්ති මිය |
| 13. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ජී. රංගනාත් ගහබඩගේ මහතා |
| 14. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා |
| 15. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා |
| 16. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා |
| 17. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඩී. ආශා සමන්කුමාරි මිය |
| 18. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්කේ.විජේසිරි මහතා. |
| 19. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී. එස්.පී. කැලුම් ශ්‍රී ධර්මදාස මහතා |
| 20. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | කේ.කේ. දුමින්ද කසුන් අමරසිංහ මහතා |
| 21. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඒ. දමින්ද නලින් අදිකාරම් මහතා |
| 22. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.පී. රොෂාන් මධුසංක දේශප්‍රිය මහතා |
| 23. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | ජී.ඒ.ඊ. රනිල් එදිරිසිංහ මහතා |
| 24. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ඩී. චූලා ශාන්ති මිය |
| 25. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයාවතී මිය |
| 26. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එල්. සුධීරා සේමිනි ලියනගේ |
| 27. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඒ. සෂිකලා මදුභාෂිනී මිය |
| 28. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඩී.ඒ. මොහාන් චන්දික අමරසේන මහතා |
| 29. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය |
| 30. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | ඒ. නයනා ජීවනී අතුකෝරළ මිය |
| 31. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ | ඉරෝෂා උදයංගනී විජේසිංහ |
| 32. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා |
| 33. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.එම්. ජයසේකර මහතා |
| 34. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එච්.වී. මහින්ද මහතා |
| 35. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඒ. ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා |
| 36. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ටී. ඒ. රංගන විජේසුන්දර මහතා |
| 37. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | අයි. මංගල කිත්සිරි ඩයස් මහතා |
| 38. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.මහින්ද ගුණසිංහ මහතා |
| 39. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ආර්.එල්. එන් මල්කාන්ති ලියනගේ |
| 40. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | ඩී.එච්.හරිසිංහ මහතා |
| 41. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | අනිල් ජගත් කුමාර ලියනගේ මහතා |
| 42. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඒ. දේවින්ද කුමාර් මහතා |
| 43. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්. ප්‍රේමරත්න මල්කැකුල මහතා |
| 44. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | සතා සිවම් චන්ද්‍රකුමාර් මහතා |
| 45. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එච්. තනූජා දීපානි චන්ද්‍රකා මිය |
| 46. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | පී.වී. සුදර්ශන සම්පත් බොතේජු මහතා |

**01.පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීම.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා -</u>

2025.10.14 වන දින මහ සභා වාර්තාව හා 2025.10.31 දිනැති විශේෂ මහා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කරන ලෙස යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්.ධර්මසිරි මහතා:-</u>

2025.10.14 වන දින මහ සභා වාර්තාව හා 2025.10.31 දිනැති විශේෂ මහා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

2025.10.14 මහා සභා වාර්තාවේ අංක 06-05 යෝජනාවේ තීරණය සම්බන්ධවයි. එහිදි තීරණයට ඇතුලත් විය යුතු කරුණක් ලෙස **"ලීලාරත්න කුරුප්පු ආරච්චි මහතාට අයත්, නගර සංවර්ධනය සඳහා ඉවත්කරනු ලැබූ වෙළඳ ස්ථාන සම්බන්ධයෙන් සුදුසු ස්ථාන ලබාදී**

සාධාරණය ඉටු කිරීම" යන්න වෙනුවට **"ලීලාරත්න කුරුප්පු ආරච්චි මහතාට අයත්, නගර සංවර්ධනය සඳහා ඉවත්කරනු ලැබූ වෙළඳ ස්ථාන වෙනුවට කුරුවිට බස් නැවතුම්පල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමෙන් අඩි 20 ක බිම් තීරුවක් ලබාදී සාධාරණයක් ඉටු කිරිම සඳහා සභාවේ කඩ සම්බන්ධ කමිටුවේදී සළකාබැලීමට හා නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය " ලෙස සංශෝධනය විය යුතුයි. මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/Lg – 5/ 2/1/13 හා 2025.11.10 දිනැති ලිපියෙන් බිම්කඩ ලබා දිමට අදාලව පැහැදිළි සහා තීරණයක් ලබා දෙන ලෙස ඉල්ලා තිබෙනවා. ඒ අනුව එම ලිපියේ පිටපතක්ද සහා ගත කරමි. ඒ අනුව ඉහත සංශෝධනය සිදු කරන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා-</u>

**සංශෝධන වල පිටුව අංක 2 හා 3 හි හි මාගේ නම නිවැරදිව පත්මසිරි දෙල්ගොල්ල ලෙස සඳහන් විය යුතුයි. 26 පිටුවේ අදහස් දැක්වීමේදී සායනය පැවැත්වෙන්නේ ඇල්ලගාව රජයේ බෙහෙත් ශාලාවේ .ප්‍රතිකාර සඳහා අනෙක් රෝගීන් රැඳී සිටින ස්ථානයේමයි පරීක්ෂන කෙරෙන්නේ ලෙස සඳහන් විය යුතුයි. එසේම 28 පිටුවේ කණුග්ගල්ල කැකුළු ළමා සමාජය ශ්‍රී ලංකාවේ හොඳම ළමා සමාජය ලෙස සම්මාන ලැබුවා ලෙස සඳහන් විය යුතුයි. 44 පිටුව ජලය බැස යන්නේ නෑ නෙමෙයි. ජලය විධිමත්ව බැස නොයාමෙන් දේපලවලට අලාභහානි වෙනවා. අවදානමට ලක්වෙනවා ලෙස විය යුතුයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>

**27 පිටුවේ කමිටුවල සභාපති සභාවේ සභාපතිවරයාම විය යුතු නෑ. මුදල්කමිටුවේ විතරයි ලෙස සඳහන්විය යුතුය. එසේම අදහසක් ප්‍රකාශ කරනවා. මම මේ සභාවේ 1991 ඉඳන් ඉන්නවා. සභාවේ අයවැය රැස්වීම් තිබුනා.කිසිදිනෙක පොලිස් ආරක්ෂාව ලබාගෙන නෑ. අද අයවැය තිබුනාට ගැටළු වෙන්නේ නෑ. සුහදව ඒ කටයුතු කරමු. පොලිස් ආරක්ෂාව ලබාගන්න තරම් තත්වයක් අද වෙන්නේ නෑ. මේ පිලිබඳව හෙලාදකිනවා.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**පොලිස් ආරක්ෂාව සියළු පළාත්පාලන ආයතනවලට ලබාදෙන ලෙස පොලිස් පතිතුමාට දන්වලා. සභාව දවසට. මේක ඉල්ලීමක් නෙමේ. හැමතැනම ආරක්ෂාව දීලා. ඒ අය ඒක වගකීමක් ලෙස ඉටු කරනවා. අපි ඉල්ලුවේ නෑ. අපිට අවශ්‍ය නොවුනත් ඒ අය ඇවිල්ලා. ඒ අයගේ වගකීමක් ලෙස.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා-</u>**

**21 පිටුවේ මාර්ගයේ තාර කට්ට සූරලා තියෙන්නේ දවල් 11.45 ට පමන ලෙස විය යුතුයි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා-</u>**

**6 පිටුවේ 15 ජේදයේ විධායකය, ව්‍යවස්ථාදායකය ලෙස සඳහන් විය යුතුයි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා-</u>**

**මා ප්‍රකාශ කලා සභාව නැතිකාලේ දරන ලද වියදම් පිලිබඳව විධිමත් පරික්ෂනයක් කරන්න කියලා. විධිමත්ව නීති උපදෙස් අරන් කරන්න කියලා සඳහන් වෙලා තියෙන්නේ.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා-</u>**

**මාතෘ සායනය පවත්වාගෙන යන්නේ අකුරණ ජනසුවය පදනමේ ගොඩනැගිල්ලේ ලෙස සඳහන් විය යුතුයි.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**2025.10.14 දිනැති මහා සභාවේ නිවේදන යටතේ වලදුර බන්ධනාගාරයේ තනිමහල් ගොඩනැගිල්ලේ වැඩඅවසන් බිල්පත ගෙවීම සම්බන්ධයෙන් 2025.09.16 දිනැති මහා සභාවේ අංක 06-112 යටතේ සිදුකල යෝජනාව අවස්ථාවේ තොරතුරු ලබාදෙන ලෙස කල ඉල්ලීම අනුව තොරතුරු ලබාදෙන බව ලෙස නිවැරදි විය යුතුවේ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු 2025.10.14 වන දින මහ සභා වාර්තාව හා 2025.10.31 දිනැති විශේෂ මහා වාර්තාව **ඉහත සංශෝධන වලට යටත්ව ඒකමතිකව මහා සභා සම්මත විය.**

**02.**සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කල යුතු නිවේදන -

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

1. පළාත්පාලන කොමසාරිස්ගේ 2025.10.30 දිනැති ජී.අයි.එස්.තාක්ෂනය භාවිතා කර මාර්ග සිතියම් සකස් කිරීමේ වැඩසටහන පිලිබඳව යි.( අදාළ ලිපිය සභාපතිතුමා විසින්

සභාවට කියවන ලදී.) ඒ අනුව මාර්ගයේ ආරම්භක ස්ථානයේ පවතින පළල මාර්ගයේ පළල ලෙස සැලකිම සිදු කල හොත් පළල වැඩි ස්ථානවල පළල අනෙකුත් ස්ථානවල පළල ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්වන හෙයින් විශාල ගැටළු රැසකට මුහුණ දීමට සිදුවන බව නිරීක්ෂනය වන බැවින් ගැසට් පත්‍රය මගින් දැනුම් දී ඇති පරිදි කටයුතු කරන බව දැනුම් දී ඇත.

2. 2025 වර්ෂයේ වැයමාරුව සම්බන්ධයෙන් වූ 2025.10.27 දිනැති ලිපිය හා විස්තර ඉදිරිපත්කල අතර වැයශිර්ෂ වෙන් කිරීම පිලිබදව විග්‍රහ කරන ලදී.

**03.** සභා රැස්වීම් වලට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා- නොමැත.

**04. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරිම -**

**1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත්කරනලද සමන්පෙසෙ, 3 වන පටුමග, පැරඩයිස් හි ඒ.කේ. ජීවානන්ද අබේසූරිය මහතාගේ පදිංචි නිවස ඉදිරිපිට නීති විරෝධී ලෙස කොන්ක්‍රිට් ඇතිරීම පිලිබඳ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලද අතර මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තාගෙන කටයුතු කිරිමට නියමිත විය.**

**2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් පරකඩුව සතිපොල අසල නිලධාරියෙකු විසින් යම් කටයුතක් සිදුකල බවත් ඒය එම ඉඩම සම්බන්ධයෙන්ද යන්න සොයා බලනලෙසත් දැනුම්දුන් අතර ඒ අනුව විමසීමක් සිදුකිරීමට නියමිත විය.**

**05.යථා පරිදි කල්දි ඇති ප්‍රශ්න- නොමැත.**

**06. යථා පරිදි කල්දි ඇති යෝජනා -**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06- 01. කුරුවිට නගරයේ කුරුගඟ තොටුපළ අසල නැරඹුම් මැදිරිය සහ වැසිකිළිය නගරයට අලංකාරයක් ගෙනදෙන පරිදි විධිමත් කොට, ආපනශාලාවක් ලෙස සංවර්ධනය කිරිමට සුදුසු ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

නගරයේ පාලම හා ගඟ ළඟ තියෙන ඉදිකිරීම. ඒ තොටුපළට නාන්න එන අයට ප්‍රයෝජනය සඳහා කළ ඉදිකිරීමක්. නමුත් ඒ අවශ්‍ය කාරණයට නිසි ලෙස භාවිතා කරලා නෑ. වැසිකිළියකුත් සභාවෙන් හදලා තියෙනවා. කොයි කාලයේ හදලද දන්නේ නෑ. ආසන්නයේ පදිංචි පිරිස දැන් අත්පත් කරගෙන. නමුත් මේ දෙකම සභාව සතු දේපළ. විවිධ පාර්ශව මේ දෙක ඉල්ලනවා. වැසිකිළිය ගත්ත කෙනාත් විමසුවා. පුද්ගලිකව ඉල්ලුවට බෑ. මේවා ඵලදායී ලෙස යොදාගමු. ගඟ අසල ලස්සනට පවත්වාගෙන යන්න පුළුවන් ස්ථානයක්. තව දුරටත් සංවර්ධනය කරන්න අවශ්‍යයි. ක්‍රමවේදයක් අනුව සංවර්ධනය කරලා ආපණශාලාවක් ලෙස පවත්වාගෙන යාමට ඉඩකඩ තියෙනවා. තක්සේරු කරලා මිළ ගනන් කැඳවමු. වැසිකිළිය සංවර්ධනය කරලා භාවිතයට ගන්න පුළුවන්. යන පාරත් යම් නඩත්තුවක් කිරිම අවශ්‍යයි. නැරඹුම් මැදිරිය අළුත්වැඩියා කළ යුතුයි. තෝරාගන්නා ආයෝජකයාට මුදල් වියදම් කරන්න වෙයි. තක්සේරු කරලා ඉදිරි කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා:-</u>

මුලින්ම මේ කටයුත්තට උනන්දු වෙන අයගේ අභිලාශ බැලිය යුතුයි. මූල්‍ය හා හැකියාවත් විමසිය යුතුයි. අභිලාශය විමසීමෙන් හොඳම අදහස, යෝජනාව ගත හැකියි. මිළ ගනන, වාසි හා යොදන තාක්ෂනය ද ඇතුලත්ව හොඳම යෝජනාව අනුව කටයුතු කරමු. බොහෝ විට රජයේ ගොඩනැගිලි පෙට්ටි ක්‍රමයට හදන්නේ. කුරුවිට නගරයේත් එහෙම තියෙනවා. කාර්මික නිලධාරීනුත් ඒ ක්‍රමයට හදන්නේ. අපිටම කියලා ප්‍රෙද්ශයේ අනන්‍යතා ලක්ෂනයක් ඒවායේ නෑ. කිසිදු සංකල්පයක් නෑ. මේ ඉදිකිරිම හොඳ නිර්මාණයක් විය යුතුයි. ඒ නිසා අභිලාශ කැඳවන්න. එය වැදගත්.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

එසේ අභිලාශ කැඳවුවහොත් කාගේ එකද තෝරන්නේ? තීරණය කිරීමෙදි ගැටළු එයි. වඩා සාධාරන ලෙසයි මේ කටයුත්ත කරන්නේ. බඩු ගබඩාවකට අපි මේ ස්ථානය දෙන්නේ නෑනේ. නගරයට අලංකරණයක් එන, නිදහසේ ඉන්න පුළුවන්, සංචාරකයින් ඇදී එන හා ඔවුන්ට අවශ්‍ය ආහාරපාන තියෙන පහසුකම් තියෙන ලෙස ස්ථානයක් තමා බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා මේ ස්ථානය දෙද්දි අපිට වැඩිම මිළක් තියෙන අයෙකුට තමා දෙන්න වෙන්නේ. නිර්ණායක තිබිය යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මේ කටයුත්තට කමිටුවක් පත් කරමු. 2026 ජනවාරි ක්‍රියාත්මක කල හැකි පරිදි කටයුතු කරමු. ආපණශාලාවට ගැලපෙන ආකෘතිය අද කථාකරලා 2026 ජනවාරි මුලම ඒක පටන් ගන්න කෙනාට කොන්ත්‍රාත්තුව ප්‍රධානය කරන්න කටයුතු කරමු. කල්දාන්න එපා. අපිට ආදායම් ලැබෙන ක්‍රමයක් නිසා කඩිනම් කරන්න. වැසිකිළියට මාසෙකට ලක්ෂ දෙකක් විතර ගන්න පුළුවන් වෙයි. මේවා ක්‍රියාවට නංවන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා:-</u>

ආපණශාලා පවත්වන සභා තියෙනවා .ඒවාත් බලලා කටයුතු කරන්න. කව්රු හරි කරලා ආදායම් උත්පාදනය නැති උනොත් ගැටළු එයි. ඒ නිසා මේක අධ්‍යයනය කරන්න. කඩුවෙල, බලංගොඩ, කළුතර, අවන්හල් තියෙනවා. ලොකු ආදායම් තියෙනවා. ඒවා ලස්සනට පවත්වාගෙන යනවා. අභිලාශ කැඳවලා ඒවා ස්ථාපනය උනොත් තව අය අමනාප වෙයි. අපි ගොඩනැගිලි හදලා ටෙන්ඩර් ක්‍රමය හෝ බදු දීම සිදු කරලා කටයුතු කරමු. මේ කටයුත්ත සක්‍රිය කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා:-</u>

පසුගිය සමයේ කුරුවිට නගරයේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලේ අවන්හලක් දාන්න උත්සාහා කලා. ලස්සන විවේකයේ නගරයක් හදන්න සැළසුම්කළා. සුන්දර නගර හදනකොට ප්‍රෙද්ශයට අවශ්‍ය දේවල් කතා කරලා හරි කරන්න. නගරය මැද තියෙන මිරිස් මෝලෙ ප්‍රශ්නය විසඳන්න. කුරුවිට මේ සම්බන්ධයෙන් මීට වඩා දේවල් කල හැකියි. ඒදා හිටිය ආණ්ඩුකාරතුමා සහභාගීකරගෙන ගොඩනැගිල්ල හැදුවට පලක් උනේ නෑ. වියදම විතරයි. ප්‍රයෝජනයක් ගන්න ඒවායේ වැඩ නිමවෙන්න ඕනි. පන්ති දාන්න හරි පුළුවන්. ඒවායේ කටයුතු නිම කරන්න. නගරයේ වලවල් වහන්න. වාහනයකට යන්න බෑ. ඒ ඒ අමාත්‍යාංශ දැනුවත් කරලා හරි මේ කටයුතු කරන්න. ඔබතුමාලට බලය තියෙනවා. අපිට පුළුවන් අඩුපාඩු පෙන්නන්න විතරයි. විපක්ෂයේ උනාට ඒ කටයුතු වලට සහාය දෙනවා. කුරුවිට ගොඩනංවමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා:-</u>
මේ යෝජනාව පිලිබඳව ඉතාමත් සතුටු වෙනවා. මේ නැරඹුම් මැදිරිය වසර හතරක පහක විතර සිට මේ විදිහටමයි තිබුනේ. නිලධාරීන්,ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනේ කණ්ඩායම එක්ක ගිහින් මෙතන බැළුවා. නවීකරනය කල යුතුයි. යන පාරේ ලොකු කාණුවක් තියෙනවා. පර්සි ස්ටුඩියෝ ආසන්නයේ වාහන පාකිං වලට ගන්න පුළුවන්. නානතොට ආසන්නයට ලොකු වතුර කානුවක් ගලා බහිනවා. වහිනකොට ඒකේ නගරයේ තියෙන කුණු කසළ වතුර තමා එන්නේ. මේ ස්ථානය හදනකොට ඒ කාණුව වෙන පැත්තකට හරවන්න. බස් නැවතුම අසල වෙළඳ සංකීර්ණයට ජල ගැටළුව විසඳන්න ඕනි. ඒ වෙළඳ සංකීර්ණය නවීකරණය කරලා නෑ 2008 ඉඳන් මේ වන තුරු. වැහි ආවරණ පියස්ස කඩා වැටිලා. විශාල අනතුරක් වෙන්න තිබුණා. තනුජා දීපානි මන්ත්‍රීතුමිය මැදිහත් වෙලා කටයුතු කරන වෙළඳ සංකීර්ණය. ඒකට ජලයත් ලබාදිය යුතුයි. කුරුවිට බස්නැවතුම ආශ්‍රිත ප්‍රදේශය නවීකරනය කල යුතුයි. මේ කටයුතු කඩිනම් කල යුතුයි. සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීමේ කටයුත්තෙදි කුරුවිට නගරයේ අඩුපාඩු මූලින්ම හදාගෙන සංවර්ධනය කරමු.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
සියළු කරුණු සැලකිල්ලට ගෙන වඩා හොඳින් මේ කටයුත්ත කරමු. ආයෝජකයින්ගේ අභිලාශත් සාධාරනව මේ කටයුත්ත කරමු. නගරයේ ගැටළු තියෙනවා. සම්මන්ත්‍රණශාලාව. ඒ සම්බන්ධව ආයෝජකයින් සමඟ සාකච්ඡා කල යුතුයි. සිනමා ශාලාව පිලිබඳ කටයුත්තට ඒ අය කැමතියි. මේ සතිය තුළ කතා කරමු. බස් නැවතුම පිටුපස වලවල් වහන්න ලක්ෂ 20 ක ප්‍රතිපාදන ලැබෙනවා. පළාත් සභාවෙන්. නානතොට ළඟ තියෙන කාණුව පිලිබඳ ගැටළුව අපි කාර්මික නිලධාරි යවලා බලමු. ඒ සම්බන්ධයෙන් සුදුසු කටයුත්තක් සිදු කරමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට නගරයේ කුරුගඟ තොටුපළ අසල නැරඹුම් මැදිරිය සහ වැසිකිළිය නගරයට අලංකාරයක් ගෙනදෙන පරිදි විධිමත් කොට, ආපනශාලාවක් ලෙස සංවර්ධනය කිරීමට සුදුසු ක්‍රමවේදයක් සැකසීමට හා ඉදිරි කටයුතු සිදු කිරීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06-02. 2025 වර්ෂය අවසානයේ කුරුවිට නගරය තුල ප්‍රදේශයේ සුදුසු බාහිර පාර්ශව සම්බන්ධ කරගෙන විනෝද සහ වෙළඳ සැණකෙළියක් පැවැත්වීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
මේ කටයුත්ත බලප්‍රදේශයට ආලෝකයක්ගෙන දියහැකි අවස්ථාවක් බවට පත් කරමු. වෙළඳ ප්‍රජාවටත් සුදුසු ඉඩකඩ දෙමින් යම් ආකාරයක වෙළඳ ප්‍රදර්ශනයක් සිදු කරමු. ඒ සඳහා සුදුසු බාහිර පාර්ශව එකතු කරගෙන අවශ්‍ය සියළු අංගත් එකතු කරමු. උදාහරණ විධිහට ස්ට්‍රීට් ෆුඩ්ස්, කානිවල් තුළ තියෙන මෙරිගෝ රවුන්ඩ් ආදී විනෝද අංග සහ විනෝදය ලබාදෙන පිරිස්, ජනතාව අගය කරන චරිත, වෙළඳ ව්‍යාපාර සඳහා අවස්ථා වැනි විවිධ ආර්ථිකමය හා විනෝදය සපයන අවස්ථාවක් බවට පත් කරමු. නගරයේ වෙළඳ ප්‍රජාව, ආරක්ෂක අංශ, ඒදණ්ඩවල යුධ හමුදා කඳවුරේ සහායත් ගත හැකියි. සිරිපා සමයට නගරයට වැඩිපුර ජනතාව එනවා. මේ සියළු ජනතාව එක්ව කුරුවිටට යම් උත්සවශ්‍රීයක් ගෙන එමු. මේ සම්බන්ධව අදහස් දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -</u>
වෙළඳපොල සැණකෙළියක් කරමු. දැයට කිරුළ, ගම්උදාව, මහපොළ වගේ කටයුතු සිදු කෙරුණා. ඒ තරම් නැතත් වෙළඳපල සැණකෙළියක් කරමු. භාණ්ඩ ගන්න ජනතාව එයි. සැණකෙළියට පැරඩයිස් යුධහමුදා කඳවුර, පොලීසිය වගේ සහභාගිකරවලා සංදර්ශන අවස්ථා පවත්වන්නත් පුළුවන්. නාවික හෝ ගුවන් සංදර්ශන පවත්වලා, වෙළඳ කුටි, ප්‍රදර්ශන ආදිය ඇතුලත් කරන්න පුළුවන්. සඳහන් වෙලා තියෙන්නේ **වෙළඳ සැණකෙලියක්**
කියලා. ඒක වෙළඳපල **සැණකෙලියක් කරමු. මීට පෙර පවත්වපු ඒවා ආදර්ශයට ගන්න. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, අධ්‍යාපන අංශය, වෙනත් රාජ්‍ය ආයතන එකතු කරගමු. මේ තියෙන කාලය ප්‍රමාණවත්ද? අප්‍රියෙල් මාසය සුදුසුයි කියලා හිතනවා. සාර්ථකව කරගන්න කාලය අවශ්‍යයි.**

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -</u>

තරුණ පිරිස හා දරුවන් අධ්‍යාපනයෙන් හෙම්බත් වෙලා. දරුවන්ගේ මනස ඒ පීඩනයෙන් මුදවන්න පුළුවන් සතුටු වියහැකි අවස්ථාවක් නිර්මාණය කරමු. දරුවන්ට අධ්‍යාපනය විතරක් නෙමෙයි අවශ්‍ය. එහෙම උනොත් ජීවිතය අඩාල වෙනවා. ළමයින් ගැන හිතලා ඒ අයවත් ආකර්ශනය කරගන්න පුළුවන් , ඒ අයට සතුට ගෙන දෙන ලෙස මේ කටයුත්ත කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -

යෝජනාව අනුමත කරනවා. කුරුවිට ගැමුණු හේවා රෙජිමේන්තුව මගින් 2016,2017,2018 වර්ෂවල වෙළඳ සැණකෙළි පැවැත්වුවා. 2017 එක පාඩු ලැබුවා. වැස්ස නිසා. මේ දේ කරනකොට ඒ ගැනත් අවධානය දෙන්න. කාලගුණය ගැනත් බලලා යුධහමුදා සහායත් අරගෙන වෙළඳ, සංගීත ක්‍රියා එක්ක කලොත් සභාවට ආදායමක් ලැබිය හැකියි. තරුණ අයට දරුවන්ට විශේෂ දෙයක් වෙයි. සැළසුම් කරලා කරමු. දෙසැම්බර් මාසය තුළ මේ කටයුත්ත සාර්ථකව කරන්න කාලය ප්‍රමාණවත් නැති නිසා ලබන අප්‍රේල් මාසය තුල සිදු කිරිම සුදුසුයි කියලයි මම හිතන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

සැණකෙළියක් පැවැත්වීම යෝජනාව ස්ථිර කරනවා. අපි දැක්කා අවුරෝරා සැණකෙළිය ඇහැලියගොඩ කරලා ජනතාවගේ ගෙවල්වල තිබුණ මුදලුත් ඉවර උනා. ප්‍රේක්ෂකයින් කලකිරිලා. මත්ද්‍රව්‍ය නිසා. ඒ නිසා මේ කටයුත්තෙදි මුල්තැනක් මේ ප්‍රෙද්ශයෙන් ඉදිරිපත්වෙන අයට දෙමු. මේ සැණකෙළිම කරන අය මිගමුව, මාතර, ආදියේ ඉන්නවා. මේ පැත්තේ අයට මුල්තැන දෙමු. තරුණ අය විනෝදවිය යුතු නමුත් අද වන විට තත්වය වෙනස්. අශෝභනයි. අවුරෝරා සැනකෙලියෙදි මත්ද්‍රව්‍ය භාවිතා කරලා ඉතාමත් අශෝභන විදිහට තමයි හැසිරුණේ. ඒ නිසා විනය හා මත්ද්‍රව්‍ය දෙක ගැන අවධානයක් දෙමු. ඒ වගෙම සභාවට අයවිය යුතු විනෝද බද්ද නිසි පරිදි ලබාගන්න පුළුවන් විධිහට කටයුතු කරන්න. වර්ෂාව ගැනත් අවධානය දෙන්න. නැත්නම් පාඩු වෙයි. කසළ ටික විතරක් ඉතිරි වෙයි. කමිටුවක් පත් කරලා , මේ ගැන පරිණත අයගෙනුත් අහලා කටයුතු කරමු. ආරක්ෂාව ගැන බලන්න. වර්ෂවසානයේ පිරිත් සජ්ජායනයත් හොඳයි. ඒකත් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -

බොතේජු මන්ත්‍රීතුමා කිව්ව අවුරෝරා සැණකෙළිය පිලිබඳ කතාව ඇත්ත. නමුත් මේකෙදි ඊට වඩා වෙනස් පසුබිමක් තියෙන්නේ. අපි වසර අවසානෙදි කරමු. පිට ප්‍රෙද්ශවල අය නෙමේ. මේ ප්‍රෙද්ශයෙත් ඉන්නවා මේ සැණකෙළි පිලිබඳව කටයුතු කළ හැකි අය. ඒ කර්මාන්තය කරන අය ඉන්නවා. ග්‍රාමීයව සිදු කරන කර්මාන්ත නිමැයුම්, අත්කම්, ආහාර වගේ ඒවා කරන අයට ඉඩදෙමු. අපි කුරුවිට ආර්ථිකය නංවන්න ඉඩකඩක් දෙමු. මේ වන විට මත්ද්‍රව්‍ය වලට හොඳ පිළිතුරක් ආණ්ඩුව ලබා දෙනවා. දැන් ඒ දේවල් කරන අයව රකින්නේ නෑ. නීතිය ක්‍රියාත්මක වෙනවා. වෙළඳ සැණකෙළිය සභාවට ආදායම් එන පරිදි සාර්ථකව කරමු. මේ සියළු අභියෝගවලට මුහුණදීලා මේ කටයුත්ත සාර්ථකව කරමු.

මේ අවස්ථාවේදී සභාවේ අධික ගෝෂාකාරි තත්වයක් උද්ගත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

සුදුසු බාහිර පාර්ශව සහභාගීකරගෙන මේ කටයුතු කරමු කිව්වා. මේ කටයුත්තට සුදුසු ස්ථානයක් තෝරාගෙනද? වරක් මේ කටයුත්තකට සභාවේ ක්‍රිඩා පිටිය දීලා ඒක වෙල්යායක් වගේ උනා. මඩ වෙලා. යහපාලන සමයේ ගරු විජේතුංග මැතිතුමා මේ

පිට්ටනියට කෝටිගානක ප්‍රතිපාදන දුන්නා. සැණකෙළි තියලා මේ පිට්ටනිය නම් නැති කරන්න එපා. දරුවන්ට, පාසැලේ ක්‍රිඩා උත්සවයට ,තරුණයින්ට මේ ක්‍රීඩා පිටිය ඕනි. මේ පිට්ටනිය කුරුවිටට අලංකාරයක්. ඒක මේ කටයුතු වලට යොදවන්න එපා.

සැණකෙලියට බාහිර පාර්ශව එනවා. ඒක නවත්තන්න බෑ. තරුණ පිරිස් මත්ද්‍රව්‍ය බීලා එන්නේ. මේ අවස්ථාවේත් පොලිසිය, රජය විශාල උත්සාහයක් දරනවා මේ මත්ද්‍රව්‍ය නවත්වන්න. යම් කණ්ඩායමක එක් අයෙක් මත්ද්‍රව්‍ය පිලිබඳව චෝදනා ලැබුවොත් සේරටම පහර වදින්නේ. මේ සභාවේ එහෙම නැති එක ගැන සතුටුයි. ලාභ අලාභයක් නෙවෙයි. මිවිතෙන් මිදිලා විනෝදය ලැබිය යුතුයි. මුදල්ම නෙමේ අරමුණ. මේ අවස්ථාවෙත් ගල්කිස්සේ මත්ද්‍රව්‍ය වැටලීමක් පිලිබඳව වාර්තා වෙනවා.

මේ අවස්ථාවේදී සභාවේ ගෝෂාකාරි තත්වයක් උද්ගත විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්.ධර්මසිරි මහතා -</u>
අපේ සංස්කෘතික අගයන් මේවන විට අහිමි වීගෙන යනවා. ඉස්සර තිබුණ කවිමඩු, නාට්‍ය ආදී අංග අපිට පුළුවන් නැවත ඇතිකරන්න. කොට්ඨාශ 26 ක් තියෙනවා. ඒ එකක් ගානේ අපි ට මේ දේවල් පවත්වන්න පුළුවන්. මුදල්ම නෙමෙයි. කලා හැකියාවන් වලට අතදීමක්. දහම් පාසල්, පෙර පාසැල් ආදියත් මේ සඳහා දායක කරගන්න පුළුවන්. මුදල් අරඹයා ම නැතිව ඉතා හොඳ වැඩසටහන් ලෙස මේවාත් කරමු.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
මේ යෝජනාවට අදාලව විවිධ අදහස් රැසක් ඉදිරිපත් උනා. මුදල් ඉපැයීමට වඩා ජනතාවගේ වින්දයට මුල්තැනක් දෙමු. ගැටළු එයි. අපි ඒවා සමථකරගෙන මිට පෙර සිදුකළ ඒවායිනුත් ආදර්ශ අරන් අතුදැකීම් අරගෙන වඩා හොඳින් කරමු. කාලය ගැන යම් ගැටළුවක් තියෙනවා. සංවිධානය විමට කාලයත් වැදගත්. මුලින්ම සාකච්ජා කරලා ඉදිරියට යමු. සිදුවිය හැකි වැරදි අවම කරගෙන විශාල සැණකෙළියක් නෙමෙයි මුලාරම්භයක් තියෙන විධිහට සාමාන්‍යයෙන් හරි කරමු. පස්සේ මේ කටයුතු වර්ධනය කරන්න පුළුවන්. අපි ක්‍රීඩා පිට්ටනිය මේ කටයුතු වලට යොදාගන්නේ නෑ. ඊට වැඩිය සුදුසු තැනක් සොයාගමු. දරුවන් සඳහා සුදුසු විධිහට ඒ අයටත් විනෝද විය හැකි අවස්ථාවක් කරමු. වෙළඳ සැණකෙලිය යන වචනය පමනක් ගන්න එපා. ඒක තුළ මේ අවස්ථාවට ගැලපෙන සියළු ආර්ථික කටයුතු අදාළයි. වෙළඳපොල කටයුතුත් ඒකට අදාලයි. අපි සුදුසු ලෙස වෙළඳ ප්‍රජාව එක්කත් කතා කරලා මේ කටයුත්ත සාර්ථකව කරමු. ඉදිරි කටයුතු කරමු.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව 2025 වර්ෂය අවසානයේ කුරුවිට නගරය තුල ප්‍රදේශයේ සුදුසු බාහිර පාර්ශව සම්බන්ධ කරගෙන විනෝද සහ වෙළඳ සැණකෙලියක් පැවැත්විමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**06-03 . හාන්දූකන්ද කටු කැලේ පියල් මහතාගේ නිවස අසල සිට මාර්ගය ඉදිරියට සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය  සභාමන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු උප සභාපති අනිල් ලියනගේ_මහතා ගේ යෝජනාව අනුව හාන්දුකන්ද කටු කැලේ පියල් මහතාගේ නිවස අසල සිට මාර්ගය ඉදිරියට සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**06-04. එල්ලාවල අළුත්වත්ත මාර්ගය හා පට්ටියලන්ද අතුරුමාර්ගය ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය  සභාමන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු උප සභාපති අනිල් ලියනගේ_මහතා ගේ යෝජනාව අනුව එල්ලාවල අළුත්වත්ත මාර්ගය හා පට්ටියලන්ද අතුරුමාර්ගය ප්‍රතිසංස්කරණය  කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය  සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**06-05. හාන්දුකන්ද  පානීය ජල ව්‍යාපෘතිය හා කිරිඇල්ල එපිටවෙල පානීය ජල ව්‍යාපෘතිය නිසි පරිදි සකස්කිරීම සඳහා 2026 වර්ෂයේ සංවර්ධන යෝජනාවක් ලෙස පළාත් සභාව වෙත යොමු කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය  සභාමන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.
**<u>ගරු ප්‍රාදේශීය  සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

ජල ව්‍යාපෘති දෙකක් සම්බන්ධව. මේවා ජනතාවගේ අත්‍යාවශ්‍ය ඉල්ලීම් අනුවයි ඉදිරිපත් කලේ. පළාත් සභාවේ 2026 සංවර්ධන යෝජනා වලට ඇතුලත් කිරිම සඳහා යොමු කරන්න.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
මෙම යෝජනා පළාත් සභාවේ 2026 සංවර්ධන යෝජනා වලට ඇතුලත් කිරිමට ඉදිරිපත් කරන්න.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු උප සභාපති අනිල් ලියනගේ_මහතා ගේ යෝජනාව අනුව හාන්දුකන්ද පානීය ජල ව්‍යාපෘතිය හා කිරිඇල්ල එපිටවෙල පානීය ජල ව්‍යාපෘතිය නිසි පරිදි සකස්කිරීම සඳහා 2026 වර්ෂයේ සංවර්ධන යෝජනාවක් ලෙස පළාත් සභාව වෙත යොමු කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

මෙම අවස්ථාවේදී ගරු සභාපතිතුමා විසින් සභාව දැනුවත් කරමින් සභාවට යෝජනා ඉදිරිපත්කර අදහස් දැක්වීමේදි හැකිතාක් එම යෝජනාවට අදාල කරුණුපමනක් කෙටියෙන් දක්වන ලෙසත් සභා වාර්තාව දීර්ඝ විම හා රාත්‍රි කාලය වනතෙක් සභාව පවත්වාගෙන යාමට සිදුවිමද අවම කර ගැනීම සුදුසු වන බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස ඉල්ලීමක් සිදු කරන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දූමින්ද කසුන් අමරසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දූමින්ද කසුන් අමරසිංහ මහතා-</u>

**06-06. තෙප්පනාව මැදගම වඩුගේහේන මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රු කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දූමින්ද කසුන් අමරසිංහ_මහතා ගේ යෝජනාව අනුව තෙප්පනාව මැදගම වඩුගේහේන මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දූමින්ද කසුන් අමරසිංහ මහතා-</u>

**06-07. පහළගම බෞද්ධ විද්‍යාලය අසලින් මඩගහමුල්ල පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රු කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දූමින්ද කසුන් අමරසිංහ_මහතා ගේ යෝජනාව අනුව පහළගම බෞද්ධ විද්‍යාලය අසලින් මඩගහමුල්ල පාර සංවර්ධනය කිරීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-**

**06-08.** **මැදගම හන්දියේ සිට රෝහල දක්වා දෙපස කාණු පද්ධතිය පිලිසකර කර සැකසීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ_මහතා ගේ යෝජනාව අනුව මැදගම හන්දියේ සිට රෝහල දක්වා දෙපස කාණු පද්ධතිය පිලිසකර කර සැකසීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් කරනු ලබන යෝජනා -**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-**

**06 - 09.** **වලදූර පොදු නාන තොටුපළ තවදුරටත් සංවර්ධනය කර ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස පවත්වාගෙන යාමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -**
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාව අනුව වලදූර පොදු නාන තොටුපළ තවදූරටත් සංවර්ධනය කර ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස පවත්වාගෙන යාමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-**

**06 - 10.** **කීරගල අගලවත්ත පොදු සුසානභූමියේ ඉදිකරමින් ඇති සුසානාගාරයේ වැඩ අවසන් කිරිමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -**
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාව අනුව කීරගල අගලවත්ත පොදු සුසානභූමියේ ඉදිකරමින් ඇති සුසානාගාරයේ වැඩ අවසන් කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා-

**06- 11.** **දිගෝ ගෙදර ප්‍රජා ශාලාවේ ඉහළ මාලය යකඩ ග්‍රිල් යොදා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා ගේ යෝජනාව අනුව දිගෝ ගෙදර ප්‍රජා ශාලාවේ ඉහළ මාලය යකඩ ග්‍රිල් යොදා සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා-

**06- 12.** **පොද්දෙනිය පන්සල පාර කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා ගේ යෝජනාව අනුව පොද්දෙනිය පන්සල පාර කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -

**06- 13.** **බටහිර මුදුන්කොටුව ග්‍රාමනිලධාරී වසමේ හිරිගොල්ල නාගහ යට සිට බෝධිය දක්වා මාර්ගයේ සංවර්ධනය නොවූ කොටස් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න_මහතා ගේ යෝජනාව අනුව බටහිර මුදුන්කොටුව ග්‍රාමනිලධාරී වසමේ හිරිගොල්ල නාගහ යට සිට බෝධිය දක්වා මාර්ගයේ සංවර්ධනය නොවූ කොටස් සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -

**06 -14.** මාටුවාගල සිට මුදුන්කොටුව දක්වා වන මාර්ගයේ පළුදු වී, අබලන්ව ඇති කොටස් සංවර්ධනය කිරිමට ඇති යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -
**මේ මාර්ගයේ කොටස් වශයෙන් කොන්ක්‍රිට් දැමීමෙන් හා තාර දැමීමෙන් සංවර්ධනය කල මාර්ගයක්. මේ වන විට තාර දැමූ කොටස් ජේ.ආර්. ප්‍රේමදාස මහතාගේ නිවස අසල සිට රුවිදු ස්ටෝර්ස් දක්වා මීටර් 150 ක පමන දුරක්ද එල්ලාවල ගඟ හරහා ඇති පාලමේ තාර දැමූ කොටස් ගැලවි වලවල් හැරි ඇති අතර මීටර් 25 ක පමන දුරක්ද තාර ගැලවී ඇඩි ලෙස අබලන්ව ඇත. ප්‍රතිලාභින් ගනන 2000 ක් පමන වේ.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න_මහතා ගේ යෝජනාව අනුව මාටුවාගල සිට මුදුන්කොටුව දක්වා වන මාර්ගයේ පළුදු වී, අබලන්ව ඇති කොටස් සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -

**06- 15.** අකුරණ ග්‍රාමනිලධාරි වසමේ දැල්වත්ත ප්‍රධාන මාර්ගයේ ජයන්ත මහතාගේ නිවස අසල සිට රොෂාන් මහතාගේ නිවස දක්වා මිටර් 100 ක පමන කොටස කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -
**ප්‍රතිලාභින් ගනන 650 ක් පමන වේ**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න_මහතා ගේ යෝජනාව අනුව අකුරණ ග්‍රාමනිලධාරි වසමේ දැල්වත්ත ප්‍රධාන මාර්ගයේ ජයන්ත මහතාගේ නිවස අසල සිට රොෂාන් මහතාගේ නිවස දක්වා මිටර් 100 ක පමන කොටස කොන්ක්‍රිට් කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගඟබඩගේ මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා-

**06- 16.** **හිරිගොල්ලයාවිටවත්ත මාර්ගයේ ධර්මේ මයාගේ නිවස අසල සිට මහතුන් මයාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා ගේ යෝජනාව අනුව හිරිගොල්ලයාවිටවත්ත මාර්ගයේ ධර්මේ මයාගේ නිවස අසල සිට මහතුන් මයාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා-

**06- 17.** **දැල්වත්ත, බණ්ඩාරවත්ත අඩක් සංවර්ධනය කර ඇති මාර්ගයේ නුවන් කුමාර මයාගේ නිවස අසල සිට අඩි 70 ක් ඉදිරියට කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ_මහතා ගේ යෝජනාව අනුව දැල්වත්ත, බණ්ඩාරවත්ත අඩක් සංවර්ධනය කර ඇති මාර්ගයේ නුවන් කුමාර මයාගේ නිවස අසල සිට අඩි 70 ක් ඉදිරියට කොන්ක්‍රිට් කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා-

**06- 18.** **මුදුන්කොටුව මාරදාවක මාර්ගයේ චන්දිමාල් මහතාගේ නිවස අසල සිට ඉන්ද්‍රපාල මයාගේ නිවස අසල දක්වා කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා ගේ යෝජනාව අනුව මුදුන්කොටුව මාරදාවක මාර්ගයේ චන්දිමාල් මහතාගේ නිවස අසල සිට ඉන්ද්‍රපාල මයාගේ නිවස අසල දක්වා කොටස සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා-

**06- 19. කොස්ගල ඉහලවත්ත රවී මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා ගේ යෝජනාව අනුව කොස්ගල ඉහලවත්ත රවී මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා-

**06– 20. දොරළුබඩකන්ද උඩ මාර්ගයේ ගයාන්මහතාගේ නිවස දෙසට ඇති අතුරුමාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා ගේ යෝජනාව අනුව දොරළුබඩකන්ද උඩ මාර්ගයේ ගයාන්මහතාගේ නිවස දෙසට ඇති අතුරුමාර්ගය සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා-

**06- 21. කරපිංච පුන්සිරිගම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා

එම යෝජනාව ස්ථිර කරමි

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා ගේ යෝජනාව අනුව කරපිංච පුන්සිරිගම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -

**06- 22.** කුරුවිට කොට්ඨාශයේ මහදෙනිය ඌරුපැච්ච දක්වා යන මාර්ගයේ පෙට්ටි බෝක්කුව **2024.01.14** දින වැඩ අවසන්කරතිබුනද මේවන විට එය කඩාවැටී ඇති හෙයින් ඒ සඳහා සභාව විසින් ලබාදෙන ඉදිරි පියවර සම්බන්ධව තොරතුරු මහා සභාවට ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනී අතුකෝරළ මිය -</u>

මේ වන විට මේ කර්මාන්තය කරලා අවුරුදු දෙකක් වත් ගිහින් නෑ. ලක්ෂ අටක් විතර වැයකරලා තියෙනවා. නවීන් දිසානායක ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් තමා හදලා තියෙන්නේ. මේ කටයුත්තට තෙප්පනාවේ කොන්ත්‍රාත්කරුවෙකු සම්බන්ධයි කියලා තමයි දන්නේ. වසරපහක්වත යන්නේ නැතිව කඩා වැටිලා. මේ මුදල් ජනතාවගේ බදු මුදල්. මේක සම්බන්ධව ගන්න පියවර මොකක්ද? ඒ කර්මාන්තය කළ සමිතියෙන් අයකරනවද? ඉල්ලං අරගෙන පුරවලා නැතිව බෝක්කුව තියලා බැඳලා. නැවත ඉදිකිරීම් මේ වතාවෙත් කරනවළු. ආයෙත් ඉල්ලං ගත්තොත් තව අවුරුදු දෙකෙන් කැඩෙයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>
ආයෙත් ඉල්ලං ගත්තොත් කියලා අදහස් කලේ මොකක්ද?

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනී අතුකෝරළ මිය -</u>

ඒ කර්මාන්තය කළ අය ගිය වතාවේ ඉල්ලං අරන්. මැණික් විකුනලා. මේ කටයුත්තකල කෙනා මේ වතාවේ වත් නිසි අවධානයෙන් කරන්න. සභාවේ මුදල් නොවෙන්න ඇති. ඒත් මේ ජනතා මුදල්. තෙප්පනාවේ ඒ කොන්ත්‍රාත්තුව කල අය අපි අතර ඉන්නවා. මේ වගේ දේ ඉදිරියට වෙන්න දෙන්න එපා. එහෙම උනොත් සභාවටත් කැළලක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>
පෙරෙයිදා පුද්ගලයෙක් කෝල් කලා පාරේ ඉල්ලං පටවනවා කියලා. පැරඩයිස් වැවගාව පහල. බෝක්කුවක් දාපු තැන. බැකෝ එකකකුත් දාලා. ඒ වෙලාවේ මට යන්න බැරිඋන නිසා මංගල මන්ත්‍රිතුමාට කිව්වා. එතුමා ගිහින්. ඒ දේවල් ඇත්ත නම් ඒවා සභාවේ කියනකොට හතුරෝ විධිහට දකින එක වැරදියි. රෑ දොළහටත් යන්න වෙලා ගැටළු බේරන්න. තැඹිලියන පාරෙත් ඉල්ලං ගෙනියනවළු. ප්‍රතිපාදන දුන්නට විතරක් මදි. ඒ වෙන දේවල් කරන දේවල්ගැනත් සොයා බලන්න.
කොන්ත්‍රාත් අය එක්ක ගම්වල කොට්ඨාශ සභාවේ අයත් ඉන්නවා. දේශපාලන නායකයෝ අපි ගරු කරන අය ඉන්නවා. පෙරෙයිදා තැඹිලියන ඉල්ලං ඇද්දා. මේ සභාවේ ඒක කිව්වාම ඒක වැරදියි. තෙප්පනාවේ හොඳට වැඩ කරන අයත් ඉන්නවා. කොන්ත්‍රාත් අය. නැවත කියන්නේ ප්‍රතිපාදන දෙනවා වගේම ව්‍යාපෘතිය හරියට කරනවද සොයාබලන්න. මම පලමු සභාවේම කිව්වා ගලුකාගම , ගබ්බෙල, ගුලනගොඩ, මාර්ග පිලිබඳවත ඒවා කැඩිලා. නිසි පියවර ගත්තාද? ස්ථාන පරික්ෂා කලාද? ගුලනගොඩහදලා

වසර තුනයි. ලක්ෂ 20 ක්. මැෂින් ගෙනිහින් ඒ පාර කැඩිලා. හෝටලයක් හදනවා. මම කිව්වා මේගැන බලන්න කියලා. මෙතන කිව්වට ඒවා වාර්තාවේ තියෙනවා විතරයි. අපි ජනතාව වෙනුවෙන් කතා කරන්නේ. ඒ දේවල් සිද්ධ වෙන්නේ නෑ. ජනතා නියෝජිතයෙක් හැටියට ඒ ගැන සතුටින් නෙමේ ඉන්නේ. වාර්තා වෙන විධිහට ලක්ෂ 50 ක් විතර අලාභළ. ඇස්තමේන්තු තියෙනවා. චෝදනා කරලා තියෙන්නේ . තනිපුද්ගලයෙක් විනාශ කරලා ලක්ෂ 25 ක්. අපි සභාවට බනිනවා. මාස 5 ක් මම මේක කිව්වා. ඔබතුමාලා එන්නේ නැතිව බලන්නේ නැතිව මොනවා කරන්නද? ප්‍රතිපාදන දුන්න ඒ යෝජනාව ගැනත් සොයන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

මේ දේවල් හැමදාම කියනවා. ඒවා ගැන අවධානය දෙන්න. කිරිඇල්ලේ, පොහොරබාව, ඒල්ලාවල මේ කොයි ප්‍රෙද්ශයේත් මැණික් තියෙනවා. ඒවායෙත් බෝක්කු හදනවා. ඒත් මෙහෙම වෙන්නේ නෑ. ඉල්ලං ගත්තොත් කුරුවිටමයි. ක්‍රමවේද හදන්න. මුදල් අනුමත කරලා විතරක් මදි. පසුවිපරම් ඕනි. කුරුවිට හැමතැනම ඉල්ලං. ඒ හින්දා යම් ක්‍රමයක් හදමු. නිර්නාමික ලිපි, චෝදනා, ලිපි ආවොත් අපි මැදිහත් වෙලා සේරටම දැනුම් දීලා ග්‍රාමනිලධාරී කැඳවලා, මැණික් ඉල්ලං මැණික් සංස්ථාවට දෙන්න කටයුතු කරමු. ඒ වගේම බිම් භාගය සභාවට දෙන්න ඕනි. මේ කියන කතාව ප්‍රායෝගික නැති වෙයි. අඩුපාඩු ඇති. චෝදනා විතරක් මදි. මම දන්නවිධිහට කිව්වේ. කොස්ගල පාර හැදුවොත් ඉල්ං ප්‍රශ්න. ඒවා ගැටළු නොවෙන්න ක්‍රම ඕනි. අපි ක්‍රියාත්මක වෙමු. මැණික් ගරන්න පුළුවන්.
ක්‍රමවේද අනුව. ඒවා මේ කර්මාන්තවලට මුවා වෙලා කරන්න බෑ. නයනා මන්ත්‍රීතුමිය කිව්ව දේ බලන්න. විගනනය කරන්න. අපි නැති කාලේ උන දේවල්. මහජන අප්‍රසාදයක් වෙන්නේ. ඒ කල දේවල ප්‍රමිතිය අපි බලන්න ඕනි. බෝක්කු ඇලවේලි ප්‍රමිතියට තිබිය යුතුයි. කාටවත් මන්ත්‍රිලට තහංචි නෑ. සභාවට සත්‍ය ප්‍රකාශ කරන්න ගැටළුවක් නෑ. මම හිතනව මෙතන කියන දේවල් සත්‍යයි කියලා. පුද්ගලික ප්‍රශ්න නෑ. අවධානය දීලා මේවා ගැන තීන්දු ගන්න. ඉල්ලං වෙන්දේසි කරන්න ක්‍රමයක් හදන්න. නීතිරාමුවක් හදන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

පැතිබැම් හදන්න ගිහින් මන්ත්‍රිලා කීපදෙනෙක් එකතු වෙලා මැණික් ගැරුවා. ගිය සභා වාරයේ. මේ සභාවට අදාලව නෙමේ. ඒ හදපු බැම් කඩා වැටිලා. තවත් උදාහරනයක්. කොස්ගල . එතනත් වල බැහැලා ලොකුගල් දාලා වහලා. මම යෝජනා කරනවා මේ යෝජනාව කල මන්ත්‍රි හා ව්‍යාපෘති වල ගිවිසුම් ගත්ත සමිතිය මේවාට වග කියන්න ඕනි. කුරුවිට හැමතැනම මැණික් කිව්වාට කොට්ඨාශෙ මන්ත්‍රිගෙත් වගකීමක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.මහින්ද මහතා</u>
මගේ කොට්ඨාශෙ පැතිබැම් හැදුවා පළාත් සභා ප්‍රතිපාදන වලින්. මම ඒ සියල්ල අධීක්ෂනය කලා. මලන්මහ කුඹුර ස්ථානයේ පැතිබැම්ම හදනකොට ඒ කොන්ත්‍රාත්කරු ගෙනාව වැලි මඩ එක්ක. මම ඒකට විරුද්ධ උනා. මුදල් වලට ගැතිවෙලා, බාල බඩු දාලා කරන වැඩ. මම කිව්වා කරනවානම් හරියට කරන්න. නැත්නම් මේ ව්‍යාපෘතිය කරන්න එපා කිව්වා. මම පොලිස්දෙපාර්තමේන්තුවේ හිටියට මම හොඳ මේසන් බාස් කෙනෙක්. මම හරියට වැඩ අධික්ෂනය කලා. හැමතැනම මැනික් කිව්වට මම ඉල්ලං ගන්න දුන්නේ නෑ. නමුත් ඒ කොන්ත්‍රාත් කරපු අය තමන්ගේ ඉඩම ලඟ වැඩිපුර කොන්ක්‍රිට් කරලා

අවශ්‍යම ස්ථාන වලට අඩුවෙන් දමලා. පහත් වැඩ. මට නම් මගේ පවුලට ගරුත්වයක් රැකෙන විධිහට වැඩ කරන්න ඕනි. අපේම අය ජනතාවගේ ජන්දෙන් ඇවිල්ල ජනතාවට සුබ සෙත වෙනුවට ජනතාවගේ මුදල් වලට ඒ විධිහට බාල වැඩ, හොරකම් කරනවා නම් අවසන් හුස්ම හෙලනකොට අනිවාර්යෙන් ඒවා මතක් වෙයි. මම නම් ඉන්නේ සතුටින්. මම ඒ වැරදි කටයුතු වලට හවුල් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා

නයනා මන්ත්‍රීතුමිය කියන මහදෙනිය පෙට්ටි බෝක්කුව හදලා අවුරුදු එක හමාරයි. කඩා වැටිලා. ඉල්ලං ගත්තා කියලත් කියනවා. අඟල් හයක් දාලා නෑ. කොන්ක්‍රිට් එක. ජනතාව චෝදනා කරනවා. මඩවැලි දාලාළු. ඒ හින්දා කඩා වැටුනාළු. දැනට ආයෙත් මේක හදනවා. ගෙවල් දාහකට විතර යන මාර්ගයක්. රජයේ සේවකයෝ පාසැල් ළමයි විශාල පිරිසක් යනවාමේ මාර්ගයේ. අපි අධික්ෂනය කරනවා. මේවන විට හියුම් පයිප්පත් දාලා. මේ මුලින් කල කොන්ත්‍රාත්කරු ගැන නිශ්චිතවම කියන්න බෑ. හොයාගන්න බෑ. ඒක නිලධාරින් කල යුත්තක්. මාර්ගයක් බැළුවා. ඒක කොන්ක්‍රිට් මිශ්‍රනය අතින් කඩන්න පුළුවන්. පරණ එකක්.

මේ කටයුතුවලදි වැලි, මිශ්‍රන, සියළු කටයුතු කාර්මික නිලධාරි බැලිය යුතුයි. මන්ත්‍රී කියන්නේ විනිශ්චය කරන මණ්ඩපයක් වගෙයි. මේ සභාව. අවසාන තීන්දුව ප්‍රකාශ වෙද්දි සිත් තැවුල් චෝදනා මඩ නැති වඩා හොඳ ජනතා සේවයක් කරලා යන්න පුළුවන් වෙන්න ඕනි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මේ බෝක්කුව පැරඩයිස් වැවෙන් කුඹුරට වතුර ගත්ත සුද්දාගේ කාලේ බෝක්කුවක්. ගල්වලින් හදලා. ගිය ගමන ඒකට උඩින් කොන්ක්‍රිට් දාලා. මම හිතන්නේ දෙපැත්තේ බැම් දෙක හොඳයි. ගල් එහා මෙහා කරලා කොන්ක්‍රිට් කරලා. පෙරෙයිදා ගියා මම බලන්න. ජේසීබිඑකකුත් ඇවිල්ලා තිබුනා. හවස මොනවා උනාද දන්නේ නෑ. පළාත් සභාවේ මුදල්. මේකේ ඉල්ලම තියෙන මූනත තමා හාරලා තියෙන්නේ. ඉල්ලං කූඩයකුත් තිබුනා. කළුපාට වැල්ලක් තිබුනේ. පාරේ මූනත පැත්ත ලොකුවට හාරලා නෑ. හියුං පයිප්ප දානවළු. දැන්දාන ඒ හියුං පයිප්ප ප්‍රමාණවත් නෑ. කාර්මික කමිටුවට නිර්දේශ කල හැකියි. කාර්මික නිලධාරී මේ පිලිබඳව බලන්න.

අවසන් බිල ගෙවද්දි සොයා බලන්න. කාර්මික නිලධාරී මේවා බලන්න. නයනා මන්ත්‍රීතුමිය **2024.01.14** කියනවා මේක වැඩ අවසන් කරලා තියෙන්නේ. මාස ගානකින් කැඩිලා තියෙන්නේ. ඒ නිසා විගනනය කරමු. අඟල් දෙකට දාලා තියෙන්නේ. අදාල ආයතන වලට දැනුම් දීලා විගනනය කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

**06-22** යෝජනාවට පරිබාහිර කරුණු ටිකක්. බෝක්කුවේ ඉල්ලං අරන් හදනවා. ඉක්මනට අබලන් වෙනවා. ආයෙත් හදනවා. අපේ ආයතනවලට පැවරුණු යම් නීති රීති තියෙනවා. ඉල්ලං කියන්නේ වාසි සහගත ඛනිජ සම්පතක්. විජේසිරි මන්ත්‍රීතුමා පොහොරබාවේ කර්මාන්ත කලාට ඒවාට පැමිණිලි නෑ. ඉල්ලං කියලා සැක හිතෙන පස් විශේෂ මතු උනොත් ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මැණික් හා ස්වර්ණාභරණ සංස්ථාවට දැනුම් දෙනවා. ඒ අය පරීක්ෂා කරනවා. ඉල්ලම වෙන්දේසි කරලා මුදල් සංවර්ධනයට යොමු කරනවා. ඒ නිසා ඉල්ලං පිලිබඳව කටයුතු කරන්න ඒ

**ආයතනයටමම දැනුම් දිය යුතුයි. වෙන අයට බෑ. තල්දූවේ රේස්කෝස් ක්‍රීඩාංගනය ඒ විදිහට කලා. තව තියෙනවා නියාමක ක්‍රමයක්. ඒවාට කල් යනවා. සියළු ආයතන වලට සියයට ගානක් එනවා. ජනතා නියෝජිතයින්ට වගකීමක් තියෙනවා සාධාරනව කටයුතු කරන්න. නයනා මන්ත්‍රීතුමිය කිව්වේ වගකීමෙන් මේවාට වගකිව යුතු අය මෙතන ඉන්නවළු. මෙතන ඉන්නවා නම් පෙන්නන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල් කැකුළ මහතා</u>

**පාරවල් හදනකොට මැණික් තියෙනවා. පාර කැඩුනම පොලිසියට පැමිණිලි කරලා. කාර්මික නිලධාරී කියනවා අඩි 8,5.6, වගේ හාරන්න කියලා. හාරන මට්ටමේ ටික නම් ගත්තාට කමක් නෑ. මැණික් හාරලා කැඩුන ව්‍යාපෘති නම් පැමිණිලි කරලා අයකිරීම් කරමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා</u>

**දෙහෙරගොඩ මැණික් තියෙන ස්ථානයක සංවර්ධන ව්‍යාපෘති කරනකොට ඉල්ලමක් ආවා.**
**අවට ඉන්න අය ඉල්ලම ගමු කීවත් මම ඉන්න තැනම ඒබීසී දාලා තලලා ව්‍යාපෘතියේ කටයුතු සිදුකලා. අදාල මන්ත්‍රීවරයා වගකීම ගත යුතුයි. වසර 10 කට පමන පෙර ලොකු පාලම අසල මැණික් ගරලා ඒ පාලම පෙරළුනා. නව පාලම හදන්න යෝජනා තිබුනත් පරන වැඩේම වෙයි කියලා කියන නිසා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට කියලා වැඩේ හාරදීලා ටෙන්ඩර්කරලා ඉඩම මැණික් අරන් නැවත නව පාලම හැදුවා. මේ වෙනකොට ඒ අකටයුතු වෙන්නේ නෑ. ජාවාරම්කරුවන් ඒවා කරන්නේ ඒවාට සුදුසු පරිසරය තියෙනකොට. කාර්මික නිලධාරි සහාය අරන් මැදිහත්වෙලා අපි කටයුතු කරනවානම් හොඳයි. අකටයුතු වෙන්නේ නෑ.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>
**මේ කටයුතු විනිවිදව කල හැකියි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -</u>
**මූලික විගනනයක් කරලා අයකරගන්න.**
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**අපි මේ තොරතුරු කාර්මික නිලධාරී වෙත යොමු කරලා ඉදිරි කටයුතු කරමු. මේ සම්බන්ධව දීර්ග ලෙස කරුණු දැක්වුවා. පාරවල්හදනකොට පස් ඉවත් කිරීම් ආදිය කරන්න වෙනවා. පස්ගොදානකොට ගොඩක් වෙලාවට අදාල ආයතන සම්බන්ධකරගෙන කටයුතු කරනවා. පොලිසිය සම්බන්ධ වෙනවා. වතු අධිකාරී, මුරකරු ඒ අයත්එකතුඋනා. මන්ත්‍රීවරයාත් මැදිහත් උනා. වගකීම දරන්න. ඒ අතරතුර සමහර ඒවා ආයතන මැදිහත් කරගෙන සාකච්ජා කලා. මාර්ග ප්‍රශ්නවලදි. ස්වර්ණාභරණ අධිකාරිය එක්ක කතා කලා. මේ වන කොටත් ගැටළු තියෙනවා. තවදුරටත් ඉල්ලං ගැටළු සාමය කඩවීම් ඒවගේ ගැටළු පොලිසියට කියන්නත් පුළුවන්. අපි මේ සම්බන්ධව කාර්මික නිලධාරින් මගින් වාර්තා ගෙන ඉදිරි කටයුතු කරමු. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාල නිලධාරින්වත් දැනුවත් කරමු.**
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව 06- 22. කුරුවිට කොට්ඨාශයේ මහදෙනිය ඌරුපැච්ච දක්වා යන මාර්ගයේ පෙට්ටි බෝක්කුව 2024.01.14 දින වැඩ අවසන්කරතිබුනද මේවන විට එය කඩාවැටී ඇති හෙයින් ඒ සම්බන්ධව කාර්මික නිලධාරීන් මගින් වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -</u>

06- 23. එක්සත් ජාතින්ගේ ආරක්ෂක මණ්ඩලය කාන්තාව සාමය හා ආරක්ෂාව සම්බන්ධ වූ යෝජනාව 1325 සම්මත වී අවුරුදු 25 ක් වන නිසා ඒ පිලිබඳව කාන්තාවන් දැනුවත් කිරිමට වැඩසටහනක් සිදුකිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -</u>

එක්සත් ජාතින්ගේ ආරක්ෂක මණ්ඩලය කාන්තාව සාමය හා ආරක්ෂාව සම්බන්ධ වූ යෝජනාව 1325 පිලිබඳව මෙම සභාවේ කාන්තා කමිටුවේ කතා කරන්නතිබුණා. නමුත් මේ වනතුරු ඒ කමිටුව කැඳවලා නෑ. 1325 යෝජනාව 2000 ඔක්තොම්බර් 31 දින එක්සත්ජාතින්ගේ ආරක්ෂක මණ්ඩලයේ සම්මත උනා. යෝජනාව ඉදිරිපත්කලේ අපේ රටෙන්. කාන්තා භීෂනය,සාමය ආදී ය පිලිබඳව අපේ රටේ ඒ යෝජනාවට ඇතුලත්. ඒදා සිට වසර 25 ක් ගෙවුනත් අපේ කාන්තාවන්ට ආරක්ෂාවන් තියෙනවද? මේ සභාවේ මන්ත්‍රිනියෝ 11 ක් ඉන්නවා. අපිට කෝටා ලැබුනේ තාවකාලිකව. ලබන වසරේ අපි මේකේ නැතිවෙන්නත් පුළුවන්. අපි කාන්තාවන් වෙනුවෙන් දෙයක් නොකලොත් මේ තැන නැතිව යයි. අපි කතුන් වෙනුවෙන් දෙයක් කරමු. ගෘහස්ථ හිංසනය, පවුලේ සම්පතමයන්ගෙන් එන අපරාධ ව්‍යවභිචාර, මේවා තාත්තා අයියා මාමා අතින් වෙන්නත් පුළුවන්. නමුත් ඒවා බොහෝවිට හෙලිවෙන්නේ නෑ. නමුත් අපිට මන්ත්‍රිණියෝ විධිහට අපේ කාන්තාවන් ඒ සම්බන්ධව දැනුවත් කරලා ඔවුන්ට යම් සහනයක් මැදිහත්විමක් ලබාදෙන්න පුළුවන්. මේ පීඩා අවම කරන්න කටයුතු කල හැකියි.
ඒ හින්දා කාන්තාවන්ට මේ දැනුවත් කිරිම කරන්න අවස්ථාව සලසලා දෙන්න. සභාවේ අවසරය දෙන්න. එසේම ලියශක්ති ජංගමසේවා වැඩසටහනක් ගැන මාධ්‍යයට දාලා. කුරුවිට ප්‍රාෙද්ශිය සභාවයි රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයි සම්බන්ධවෙලා පවත්වනවාළු. මේ වැඩසටහන සභාවේ එකක්ද? පක්ෂයේ එකක්ද? සභාවේ මන්ත්‍රිලාව මේ ගැන දැනුවත් කලේ නැද්ද? අපේ සභාවේ වැඩ වලට අපි ඕනි නැද්ද? පසුගිය වතාවේ පළාත්පාලන සතියේ වැඩසටහන් පිලිබඳව ත් දැනුවත් කලේ නෑ. මේ සභාවේ කරන වැඩසටහන් වලට අපේ සහායත් ගන්න. සායන, රූපලාවන්‍ය, ජංගම සේවා ආදි වැඩසටහන් තියනවා. අපිට මේ දේවල් කිව්වා නම් මේ සභාවේ කාලය නාස්ති කරන්න ඕනි නෑ. මේ කියන කාන්තා වැඩසටහනත් එතනදිම කරන්න තිබුනා. මේ වැඩසටහනට සභාවත් එකතුයි නම් අපි 46 ත් යන්න ඕනි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා</u>

කතුන් පිලිබඳව කතාකරන්නේ. එතුමියගේ යෝජනාව මේ කාන්තා දිරිගැන්විම් පිලිබඳව. ඒ සඳහා ක්‍රමවේදත් කියනවා. පසුගිය වසර පහේත් කාන්තාවන් පිලිබඳ වැඩසටහන් පක්ෂ

භේදනැතිව සිදු කලා. ලියශක්ති ව්‍යාපෘතිය ගැන කණගාටුයි. පළාත්පාලන සතියේ වැඩ කලා. අළුකැටිය විහාරයේ ජංගම සේවා කලා. සායන කලා. ගිය වසර පහේත් මල්කැකුළ සභාපතිතුමා ඒ කටයුතු කලා. නමුත් දුරකථන ඇමතුමක් දීලා හරි මන්ත්‍රිතුමන්ලාව දැනුවත් කලා. හෙට තියෙන වෛද්‍ය සායන ජංගම වැඩසටහන පවත්වන්නේ ජාතික ජනබලවේගය මන්ත්‍රිවරු විතරද? එහෙනම් කුරුවිට ප්‍රාෙද්ශීය සභාවේ නමපුවරු වල භාවිතා කලේ ඇයි? අපෙන් කෙනෙක් මේ ගැන සායනය ගැන ඇහුවොත් අපි දන්නේ නෑ. අපිටත් ජනතාවට කියන්න තිබුනා. මේ වැඩසටහන ජාතික ජනබලවේගය ප්‍රවර්ධනය කිරිමක් නම් සභාවේ නම යෙදීම නිති විරෝධියි. සියල්ලන්ම දැනුවත් කල යුතුයි. සියළු මන්තු්වරු සහෝදරයෝ කිව්වට පිරිසක් විතරයි. ඉදිරියට මෙවැනි දේ සභාවේ නම භාවිතා කරලා කරන්න එපා. සියළු දෙනාගේ සහාය ගන්න. රටක ජනතාසේවයට අරමුදල් යොදවනකොට ඒක කාටත් පොදුයි. සියළු දෙනාගේ සහාය ගන්න. මේ සභාවේ සම්පත් තියෙනවා. ඒ කටයුතු වලට සහාය විය හැකියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් මහතා</u>

මේ යෝජනාව කාලෝචිතයි. ඒ වැඩසටහන තියන්නේ සභාවෙන්ද? වෙනත් බාහිර ආයතන වලින්ද? සභාවේ නම් ඒ පිලිබඳව සියළුදෙනා දැනගත යුතුයි. උපසභාපතිතුමාත් මේ පිලිබඳව දන්වා ඇති. කුරුවිට ජනතාවට සේවය කිරීම ගැටළුවක් නෑ. ජනතා සේවයට තමා සියළුදෙනා සැදී පැහැදී සිටින්නේ. මේවා අපි දැනුවත් විය යුතුයි. මන්ත්‍රිතුමිය දැක්වූ අදහස් වැදගත්. නැවත ඉදිරියේ දැනුවත් කිරීම්වලින්තොරව මෙවැනි කටයුතු කරන්න එපා. හොඳ දේ සියල්ලට අපිත් ඉන්නවා. සහාය දෙන්න. උපසභාපතිතුමාත් මෙවැනි ගැටළු ගැන සොයා බලන්න.

<u>ගරු ප්‍රාදේශීය සභාඋපසභාපති අනිල් ලියනගේ මහතා-</u>

කාන්තා අයිතින් ගැනයි යෝජනාව. කාන්තාවන් වෙනුවෙන් සභාව නියෝජනය කරලා මන්ත්‍රිතුමියන්ලා එකතුවෙලා කාන්තා ප්‍රචන්ඩත්වය, කාන්තා සංවර්ධනය, වැනි කටයුතු පිලිබඳ දැනුවත්කිරිමක් සිදුකිරිමට. සභාපතිතුමගේ අනුමැතිය ඇතිව අනෙක් ආයතනත් එකතුකරගෙන කරමු. අපේ පැත්තේ කාන්තාවනුත් එකතුකරන්නම්. ලොකුවට මුදල් වැයවෙන්නේ නෑ. ඒ නිසා සභාවේ පූර්ණ අනුමැතිය දෙමු. වෙනත් වැඩසටහනක් ගැන මගේ දැනුවත්විමක් නෑ. නමුත් සාමූහිකව කටයුතු කරමු. නයනා මන්ත්‍රිතුමිය කියන කාන්තා වැඩසටහන සක්‍රි්ය කරමු.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කාන්තා වැඩසටහන කරමු. සැළසුම ,ක්‍රියාපටිපාටිය ඉදිරිපත්කරන්න. ලියශක්ති වැඩසටහන පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යංශයෙන් කරන්නේ. ඒ ස්ථානයට අපෙන් යම් සේවාවන් ටිකක් ඉල්ලලා තියෙනවා. ඒ සඳහා යම් පිරිසක් යොමුකරමු. ආයුර්වේද මගින් සායනය කරනවා. දෙපාර්තමේන්තුව හරහා ඒවා කෙරෙන්නේ. අපේ විෂය පථයට අදාලව අපේ සේවා ජනතාවට එතන සපයන්නේ නෑ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දායකත්වය සපයනවා. සභාවේ මෙහෙයුමක් නෑ. මට ආරාධනා කරලා තියෙන නිසා මම යනවා. සභාවේ වෙන මැදිහත්වීම් නෑ. ඒ අවස්ථාවට මන්ත්‍රිතුමන්ලා එන්න. වැඩසටහන කරමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනී අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව

**එක්සත් ජාතින්ගේ ආරක්ෂක මණ්ඩලය කාන්තාව සාමය හා ආරක්ෂාව සම්බන්ධ වූ යෝජනාව 1325 සම්මත වී අවුරුදු 25 ක් වන නිසා ඒ පිලිබඳව කාන්තාවන් දැනුවත් කිරිමට වැඩසටහනක් සිදුකිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රිණී   නයනා ජීවනී අතුකෝරළ මිය  -</u>

**06- 24. කුරුවිට නගරය හා කිරිඇල්ල නගරය සඳහා හෙළ බොජුන් හල් ආරම්භ කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රිණී   නයනා ජීවනී අතුකෝරළ මිය</u>
මම ගියවර අයවැය යෝජනාවක් ලෙස මෙය ඉදිරිපත් කලා. මේ වන විට ඒ යෝජනාව ආපණශාලාවක් ලෙස පරිවර්තනය වෙලා. ආපනශාලා කුරුවිටට තියෙනවා. මම අදහස් කලේ හෙළ බොජුන් හල්. අපේ ගම්වල කාන්තාවන්  ඉන්නවා දේශීය ආහාරපාන හොඳින් සැකසිය හැකි අය.  සති ගනන් එකම තෙල් තාච්චියේ  බැදෙන රෝල්ස් වෙනුවට මේ නැවුම් දේශිය ආහාර පිරිසිදුවට ජනතාවට මිලදි ගත හැකි තැනක් වගේම ඒ කාන්තාවන් විස්සක් තිහකට රැකියා දිය හැකියි. කුරහන් කැඳ, කොළකැඳ වගේ පෝෂණිය දේශිය ආහාර ජනතාවට මිලදි ගන්න පුළුවන් වෙන විධිහට යම් ස්ථානයක පවත්වාගෙන යා යුතුයි. දැන් ඒ කටයුත්තට යෝජනා කල ස්ථානයේ හෙළ බොජුන්හල සිද්ධ වෙන්නේ නෑ. විකල්පයක් විධිහට මම යෝජනා කරනවා මේ යෝජනාව පළාත් සභා කෘෂිකර්ම අමාත්‍යාංශයට යොමු කරලා ප්‍රතිපාදන ලබා ගමු. බොජුන්හල් ස්ථාපිත කරන්න  සුදුසු බිමක් විතරක් නිදහස් කරලා දෙන්න. කුරුවිට කිරිඇල්ල දෙකටම.

<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රිණී    කේ. කේ. දයාවතී මිය</u>

පසුගිය වසර පහ තුළ හෙළ බොජුන් හල් ආරම්භ කරන්න මගේත් යෝජනාවක් තිබුණා. මේ සභාවෙන් ඒ කටයුත්තට ස්ථානත් වෙන් කලා. අද ආපණ ශාලාවට වෙන් කල ස්ථානයේ තමයි අපි හෙළ බොජුන් හලට යෝජනා කලේත්. කීප වතාවක් අපි ඒ ස්ථානය කැලෑව කපලා පවිත්‍ර කලා. එතන ආසන්නයේ පදිංචි අය පොලිසියේ පැමිණිලි කරලා අපි කෙසෙල් ගස් කැපුවා කියලා පොලිසිත් ගියා. අපිට මේ කටයුත්ත ආරම්භ කරන්න කාලය මදි උනා. සභාව විසිරෙව්ව නිසා. මම ඉල්ලා සිටිනවා හෙළ බොජුන් හලකටයි ඒ ස්ථානය වඩාත් සුදුසු. කාන්තාවන් වෙනුවෙන් ඒ ස්ථානය ලබා දෙන්න. ස්වයං රැකියා කරන කතුන් දුක් වෙනවා ඒ නිෂ්පාදන අලෙවිකරගන්න බැරිව. දේශීය කෑම හදන්න පුහුණුව ලබපු කතුන් .මේ කටයුත්තට ඔවුන් ඉතාම සුදුසුයි වගේම  මේ ස්ථානයත් ඒ වැඩේට සුදුසුයි. නයනා මන්ත්‍රිතුමිය කිව්වා වගේ කුරහන් කැඳ, කොළකැඳ වගේ පෝෂණිය දේශීය ආහාරත් අලෙවි කල හැකියි. ආපනශාලාවට යෝජනා කල ඒ ස්ථානය මේ කටයුත්තට දෙන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අපි හෙළ බොජුන් හල අයින් කරලා නෑ. ආපණශාලාව කියන නම පමණයි. වඩා සුදුසු එක භාවිතා කරමු. සභාවට වඩාත් ලාභදායී කාන්තාවන්ට රැකියා අවස්ථා ඇති කරන වගේම ජනතාවට පෝෂණීය ආහාර සපයන ස්ථානයක් විය යුතුයි. මීට අදාලව ව්‍යාපෘති යෝජනා තියේනම් දෙන්න. සියළු දෙනා කතාකරලා අදහස් අරන් සාර්ථකව කරමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව කුරුවිට නගරය හා කිරිඇල්ල නගරය සඳහා හෙළ බොජුන් හල් ආරම්භ කිරිමට අදාලව ඉදිරි කටයුතු සිදුකිරිමටත් ඒ සඳහා වන** ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරිමටත් මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී මිය විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී මිය -</u>**
**06-25. නෙළුගොල්ල අක්කර 05 මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී මියගේ ගේ යෝජනාව අනුව නෙළුගොල්ල අක්කර 05 මාර්ගය සංවර්ධනය කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී මිය -</u>**

**06-26. නෙළුගොල්ල 21 පාර සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චූලා ශාන්ති මිය -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී මියගේ ගේ යෝජනාව අනුව නෙළුගොල්ල 21 පාර සංවර්ධනය කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී මිය -</u>**

**06-27. හිඳකරල්දෙනිය මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චූලා ශාන්ති මිය -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී මියගේ ගේ යෝජනාව අනුව හිඳකරල්දෙනිය මාර්ගය සංවර්ධනය කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා විසින් කරනු ලබන යෝජනා</u> **-**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-</u>

**06- 28. කනුග්ගල්ල පොදු සුසානභූමිය මායිම් නිවැරදිකර සුද්ධ කර සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දමින්ද නලීන් අධිකාරම් මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-</u>

**අනවසර පදිංචිකරුවන් විසින් මේ මායිම් අල්ලාගෙන. මායිම් නිවැරදි කර සංවර්ධනය කල යුතුයි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි <u>අනුරුද්ධ රංගන විජේසුන්දර</u> **මහතා ගේ යෝජනාව අනුව කනුග්ගල්ල පොදු සුසානභූමිය මායිම් නිවැරදිකර සුද්ධ කර සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-</u>

**06- 29. පරණගම පොදු සුසානභූමියේ බැවුම් සහිත බිම මිහිදන් කටයුතු කිරිමට සුදුසු ලෙස සැකසීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දමින්ද නලීන් අධිකාරම් මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අනුරුද්ධ රංගන විජේසුන්දර__ **මහතා ගේ යෝජනාව අනුව .පරණගම පොදු සුසානභූමියේ බැවුම් සහිත බිම මිහිදන් කටයුතු කිරිමට සුදුසු ලෙස සැකසීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-</u>

**06- 30. පරණගම සිට මුදුන්කොටුව දක්වා මාර්ගයේ දෙහෙරගොඩ කොට්ඨාශය අයත් තැනින්තැන කැඩී ගැලවී ඇති වලවල් නැවත සකසා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-**

***මේ මාර්ගයේ ගමනාගමනය දුෂ්කරයි. වලවල් කොන්ක්‍රීට් හෝ දමා සුදුසු පරිදි සැකසිය යුතුයි. පළාත්සභා අරමුදල් වලින් හෝ සකසා දෙන්න.***

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර__ මහතා ගේ යෝජනාව අනුව පරණගම සිට මුදුන්කොටුව දක්වා මාර්ගයේ දෙහෙරගොඩ කොට්ඨාශය අයත් තැනින්තැන කැඩී ගැලවී ඇති වලවල් නැවත සකසා සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. මහින්ද ජයලාල් මහතා විසින් කරනු ලබන යෝජනා -**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. මහින්ද ජයලාල් මහතා -**
**06-31. පරකඩුව වසම සඳහා සුදුසු ස්ථානයකින් ප්‍රජා ශාලාවක් ඉදිකිරිමට යෝජනා කරමි.**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා**
**එම යෝජනාව ස්ථිර කරමි.**
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. මහින්ද ජයලාල් මහතා ගේ යෝජනාව අනුව පරකඩුව වසම සඳහා සුදුසු ස්ථානයකින් ප්‍රජා ශාලාවක් ඉදිකිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. මහින්ද ජයලාල් මහතා -**

**06-32. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් බෙන්දළුව ළමා හා මාතෘ සායනය පවත්වන ගොඩනැගිල්ලට අයත් ඉඩම් මායිම් සලකුනු කර නිරවුල් කර ඉදිරිපස ආරක්ෂිත වැටක් ඉදිකිරිමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා**
**එම යෝජනාව ස්ථිර කරමි.**
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. මහින්ද ජයලාල් මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් බෙන්දළුව ළමා හා මාතෘ සායනය පවත්වන**

ගොඩනැගිල්ලට අයත් ඉඩම් මායිම් සලකුනු කර නිරවුල් කර ඉදිරිපස ආරක්ෂිත වැටක් ඉදිකිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. මහින්ද ජයලාල් මහතා -

**06-33.** කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් බේන්දළුව පොදු සුසානභූමියේ ඉඩමේ මායිම් සලකුනු කර සීමා කණු සිටුවා ජනතාවට ප්‍රයෝජනයට ගත හැකි පරිදි පිලිසකර කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රංජන් ප්‍රදීප් මහතා -

බලප්‍රෙද්ශයේ හැම ගමකම සුසානභූමි මිනිස්සු අල්ලලා.වසර ගනනාවක් මේ ගැටළුව පිලිබඳව සභාවේ කතා කලා. මිහිදනිකරන්නතියෙන තැන්වලත් භාවිතයට අරන්. සුසානභූමිවල අක්කර ගාන අඩුවෙලා. පුවක්ගහවත්තේ සුසානභූමියත් 2026 වසරේ හෝ මේ පිලිබඳව කටයුතු කරන්න. සියළු සුසානභූමි පිලිබඳව පොදු සැලැස්මක් අනුව ඒ පැවරීම් සිදුකරලා මායිම් පිලිබඳව හඳුනාගෙන කම්බි ගහලා වෙන්කරන්න. මරණාධාරසමිත් ඉල්ලනවා මේවා නඩත්තුකරගෙන පවත්වාගෙන යන්න. ඒ පිලිබඳවත් සලකා බලන්න. වැටමායිම්රංඩු ඇතිවෙන එකක් නෑ. හැමතැනම මෙ ප්රශ්නය. විසඳුමක් දෙන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

සභාවට අයත් සුසානභූමි පිලිබඳව නිශ්චිතව මේවන විට හඳුනාගෙන යනවා. එකපාර අපිට කම්බිකණු ගහලා කටයුතු කරන්න ගියොත් විශාල මුදලක් යනවා. අපි සුසාභූමිහඳුනාගෙන අපි මායිම්වල පූර්ණ ලෙස නැතත් කණු හිටවමු. මුදල් ප්‍රතිපාදන ඇති ලෙස බලලා කම්බි ගහමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. මහින්ද ජයලාල් මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් බේන්දළුව පොදු සුසානභූමියේ ඉඩමේ මායිම් සලකුනු කර සීමා කණු සිටුවා ජනතාවට ප්‍රයෝජනයට ගත හැකි පරිදි පිලිසකර කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා -
**06-34.** ගෝනපිටිය පාරේ සිට එම්.එස්.අබේවික්‍රම මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා ගේ යෝජනාව අනුව ගෝනපිටිය පාරේ සිට එම්.එස්.අබේවික්‍රම මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා -

**06- 35.** **මහදෙනිය පොදු ළිඳ ප්‍රතිසංස්කරනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා අතුකෝරළ මිය-
**මහදෙනිය ළිඳ ඉඩම සභාවට අරන්ද?**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා -
**මාර්තු 7 දා යෝජනා කරලා පාර්ලිමේන්තු එකඟතාවය මත ප්‍රාෙද්ශීය සභාවට ලිපිය යොමු කරලා.**
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා ගේ යෝජනාව අනුව මහදෙනිය පොදු ළිඳ ප්‍රතිසංස්කරනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා -

**06- 36.** **සිනමාහල පාර ප්‍රජා ශාලාවේ දිරාපත්වූ වහලය ප්‍රතිසංස්කරනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා ගේ යෝජනාව අනුව සිනමාහල පාර ප්‍රජා ශාලාවේ දිරාපත්වූ වහලය ප්‍රතිසංස්කරනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.රොෂාන් දේශප්‍රිය මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.රොෂාන් දේශප්‍රිය මහතා
**06-37. 127/සී මෙනේරිපිටිය වසමට අයත් අඹගහයට මීගස්තැන්න මාර්ගයෙන් ආරම්භ වන පොල්කොටුව මාර්ගයේ ලක්ෂ්මන් මයාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.රොෂාන් දේශප්‍රිය_මහතා ගේ යෝජනාව අනුව 127/සී මෙනේරිපිටිය වසමට අයත් අඹගහයට මීගස්තැන්න මාර්ගයෙන් ආරම්භ වන පොල්කොටුව මාර්ගයේ ලක්ෂ්මන් මයාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.රොෂාන් දේශප්‍රිය මහතා

**06- 38. වටප්පිටිය අඹගහයට මාර්ගයෙන් ආරම්භ වන කැළුම් මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.රොෂාන් දේශප්‍රිය___මහතා ගේ යෝජනාව අනුව වටප්පිටිය අඹගහයට මාර්ගයෙන් ආරම්භ වන කැළුම් මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.රොෂාන් දේශප්‍රිය මහතා

**06- 39. 127/සී මෙනේරිපිටිය වසමට අයත් පියසේන මයාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉනෝකා මල්ලවආරච්චි මිය-
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.රොෂාන් දේශප්‍රිය_මහතා ගේ යෝජනාව අනුව 127/සී මෙණේරිපිටිය වසමට අයත් පියසේන මයාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා විසින් කරනු ලබන යෝජනා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා-</u>**

**06- 40. ඒදණ්ඩවෙල යුධ හමුදා වෙළඳසැළ පිටුපස කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරිමට ලක්ෂ 05 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා-</u>**

**මේක පැරණිම ඉදිකිරිමක්. මලංගම මලං ඇලෙන් කාහේන්ගමට වතුරගෙනාවා ගොවිතැනට. සිරිමාබණ්ඩාරනායක යුගයේ විශාල ව්‍යාපෘතියක්. මේවනවිට වල්බිහිවෙලා .මේකාණුව යුධහමුදා සුභසාධක අලෙවිසැළ පිටුපසින් යන හරියෙදි ගඳ ගහනවා. කාණුව ගොඩ දාලා පාරේ කොන්ක්‍රිට් එක උස්සලා පාරේ මට්ටමට බැන්දොත් පිලිසකර කරන්න පුළුවන්.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි_ මහතා ගේ යෝජනාව අනුව ඒදණ්ඩවෙල යුධ හමුදා වෙළඳසැළ පිටුපස කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරිමට ලක්ෂ 05 ක ප්‍රතිපාදන ලබාදිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා-</u>**

**06- 41. කොස්ගොඩ ගාමිණී මහතාගේ නිවස අසල සිට අතුරාන සහෝදරයාගේ නිවස දෙසට ඇති මාර්ගය ප්‍රතිසංස්කරනය කිරිමට ලක්ෂ 05 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා-</u>**

**මේ මාර්ගය බටුහේන ධීවර සංස්ථාව ලඟින් යන පාරේ. පරණ පාරක්. මේ වන විට වලවල්. වාහන යන්න අමාරුයි. දැන් ඒ මාර්ගය ප්‍රතිසංස්කරණය කරන්න තත්වයට පත්වෙලා.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි_ මහතා ගේ යෝජනාව අනුව කොස්ගොඩ ගාමිණී මහතාගේ නිවස අසල සිට අතුරාන සහෝදරයාගේ නිවස දෙසට ඇති මාර්ගය ප්‍රතිසංස්කරනය කිරිමට ලක්ෂ 05 ක ප්‍රතිපාදන ලබාදිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා-**

**06- 42.** **විලකොලදෙනිය හන්දියේ සිට කානුපද්ධතිය ප්‍රතිසංස්කරනය කිරිමට ලක්ෂ 05 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා-

***පාරවල් හොදාගෙන ගිහින් කානුපද්ධතිය ගොඩ වෙලා. වතුර ගලලා පාරත් යටවෙනවා.*** **ප්‍රතිසංස්කරනය කල යුතුයි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි_ මහතා ගේ යෝජනාව අනුව විලකොලදෙනිය හන්දියේ සිට කානුපද්ධතිය ප්‍රතිසංස්කරනය කිරිමට ලක්ෂ 05 ක ප්‍රතිපාදන ලබාදිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා විසින් කරනු ලබන යෝජනා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -

**06- 43.** **ගලහිටිය මිගස්තැන්න මාර්ගයේ කඩංගුවේ කුඹුර අසල මාර්ගයපැතිබැම්ම ඉදිකිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහතා එම්.ප්‍රේමරත්න මහතා_ගේ යෝජනාව අනුව ගලහිටිය මිගස්තැන්න මාර්ගයේ කඩංගුවේ කුඹුර අසල මාර්ගයපැතිබැම්ම ඉදිකිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -

**06- 44.** **වලදූර බන්ධනාගාරයේ ඉදිකර ඇති පොහොර ව්‍යාපෘතිය සම්බන්ධ ගොඩනැගිලි සඳහා එම ඉදිකිරිමට අවසරයක් ලබාතිබේද යන්නත් නොමැතිනම් මෙම වැයබර දැරීම මුදල් අවභාවිතයක් වන හෙයින් හා සභාවට පාඩුවක් වන බැවින් ඒ පිලිබඳ විමර්ශනයක්**

**කර එම කටයුත්තට සම්බන්ධ සියළු නිලධාරින්ගෙන් එම මුදල් අයකරගැනීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -**
*නීතිඥයෙක් බඳවාගෙන සභාවේ නඩු කතා කරලා අධිහාර උනා. ඒක සභාවේ එකඟත්වයෙන් කල කටයුත්තක්. නමුත් මේ ඉදිකිරීම් වලට අනුමැතිය දුන්නේ කව්ද? ඔප්පුවක් නෑ. ගිවිසුමක් තියෙන්නේ. බන්ධනාගාර අධිකාරී අත්සන් කරලා. ඒ කටයුත්ත ඔහුට කල හැකිද? අපිමට කියලා අක්කර 10 ක් තියෙද්දි ඇයි වෙන තැනක මේ ඉදිකිරිම් කලේ.සභාවේ මුදල් අයථා පරිහරණයක් කරලා. මීට පසු සියළු ඒ කසළ පිලිබඳ කටයුතු සභාවේ ඉඩමේ කරන්න. මේ වන විට මේ ඉඩම සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විරෝධතා කැඳවලා. මේ අක්‍රමිකතාවය පිලිබඳව විගනනය කරන්න. අපරාධ විමර්ශන අංශයට යොමු කරන්න. අල්ලස් දූෂන විමර්ශනයටත් යොමුකල හැකියි. මේ විධිහට රජයේ මුදල් වියදම් කිරිම වැරදියි. අයකරගන්න. අපි පොහොරබාව ඉඩමට කෝටි යකට වඩා වියදම් කලා. විදුලිය ගත්තා. ගේට්ටු දැම්මා. ඉදිකිරීම්කලා.*

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා**

*මේ කටයුත්ත වෙලාතියෙන්නේ සභාව නැති කාලේ. සභාලේකම් වැඩකල කාලේ. යකඩ බාර් ගහලා ගැරේජ් එකක් වගේ. ඒ කරලා තියෙන ලක්ෂ ගානක මුදලට වටින්නේ නෑ. ඒක පිලිබඳව පරික්ෂන වාර්තාත් ඇවිත්. මේ පිලිබඳව විගනනය කරන්න. අදාල නිලධාරින්ගෙන් මුදල් අයකරගන්න. 2023 වසරේ කල දේවල්. මෙවන විට අපි හිඟ ආර්ථිකයකට ලක් වෙලා. නීතිඥ උපදෙස් අරන් නඩු දාන්න. මේ පිලිබඳව ඉදිරි කටයුතු කරන්න.*

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා**
*මේ කටයුතු මන්ත්‍රිලා නැති කාලේ උනේ. සභාවේ මුදල් පුද්ගලික මුදල් වගේ පරිහරණය කරලාද? සභාව සතුව කසළ අංගනයක් තියෙද්දි බන්ධනාගාරය තුළ මන්ත්‍රිලාටවත් යන්න බැරිතැනක ට ඇයි වියදමු කලේ? ලක්ෂ 55 ක් කියන්නේ විශාල මුදලක්. පාසැල අසල තියෙන සභාවේ භූමියේ කසළ අංගනයේ ගැටළු තියෙනවා. චෝදනා තියෙනවා. ඒවාට විසඳුම් දෙන්න තිබුණා. මේ වියදම අනුමත කරන්නේ නෑ. තවත් අධිහාර ගෙවන්න බෑ. මම දැනටත් දෙදාස් ගානක් ගෙව්වා. එතනින් එහාට බෑ. අනෙක් අයගෙන් අයකරන්නේ නැත්නම් අර අපි බැන්ද මුදල ආපහු දෙන්න. පොහොරබාව කසළ අංගනය හදලා ඒක කැලේට යන්න ඇරියා. එක්කෝටිගානක් බන්ධනාගාරයට වියදම් කලා. මිනිස්සු බනිනවා. මේක මුදල් අවභාවිතයක්. ජනතා බදු මුදල්. රජයේ විගනනයක් කරන්න. අපි හිටපු නැති කාලේ සිදුකල මේ දේ පිලිබඳව විනිවිදව විමර්ශනය කරලා ඒ අයට ඒ මුදල් ගෙවන්න කියන්න. අපි සහාය වෙනවා.*

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**
*බන්ධනාගාරයේ මේ කටයුතු පිලිබඳව යෝජනා කීපයක් තියෙනවා. කාරක සභාවන් උනානම් හරි කතාකරන්න.*

මෙම අවස්ථාවේදී ගරු සභාපතිතුමාගේ දැනුම්දීම අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාවෙන් හා සම්පත් බොතේජු ගරු මන්ත්‍රීවරයාගේ ස්ථිරත්වයෙන් යුක්තව මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්විය. විෂය ලිපිකරු ද මෙම අවස්ථාවට සහභාගිවිය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් අදහස් දක්වමින් මේ වන විට වලදුර ඇලේ පුද්ගලයෙකුට ජලය භාවිත කල නොහැකි බවත් බන්ධනාගාරයෙන් නිකුත් කෙරෙන අපජලය හේතුවෙන් මෙය සිදුවී ඇති බවත් සඳහන් කරන ලදී. එසේම ආරම්භයේදී සභාවට කසළ දැමීමට ස්ථානයක් නොමැති කම විශාල ගැටළුවක්ව පැවති බවත් පසුව ඒකල සිටි අධිකාරිවරයා සමග , බන්ධනාගාරය සමග සාකච්ජා කර දිරණ කසළ, සතිපොල කසළ, ඉඳුල් ආදියත් නොදිරණ කසළත් බන්ධනාගාරයේ භූමියේ කොටසක පොහොර බවට පත්කිරිමට අවශ්‍ය කටයුතු සියළු සිදුකල බවත් ඒ සඳහා ගිවිසුමක් ඇති කරගත් බවත් සඳහන් කරල ලදී. රැඳවියන් මගින් කසළ වර්ගීකරණය ඇතුළු මෙම කටයුත්ත පහසුවෙන් සිදුකරගත හැකි බැවින් ඔවුන් හට අවශ්‍ය පහසුකම් ලබාදිමට ප්‍රාදේශියසභාව එකඟ විය. ඒ අනුව සභාව මගින් බලප්‍රෙද්ශයේ එකතු කල කසළ සභාවේ ටැක්ටර් මගින් බන්ධනාගාරයට ගෙනගොස් දුන් අතර තේරීමට ස්ථානයක් ඉදිකර පහසුකම් ලබාදුණි. කාලයක් ගතවන විට කාබනික පොහොර නිෂ්පාදන කර, ප්‍රමිතිය පරික්ෂා කර , ඇසුරුම්කර ,අලෙවිකර ,සමසමව ලාභය බෙදාගත් බවත් නමුත් පසුව නොදිරණ කසල තබා ගැනීම බන්ධනාගාරයට ගැටළුවන් බැවින් දිරණ කසළ පමනක් බන්ධනාගාරයට භාරගත් අතර එම නොදිරන කසළ දැමීමට සභාවට ස්ථානයක් නොමැති කමින් සිට පොහොරබාව ඉඩම මිලදිගැනිමට හා සංවර්ධනය කිරිමට ආරම්භ කල බවත් සඳහන් කරන ලදී.සභාවේ කසළ ඒ අයට දීම සභාවට පහසුවක්ව පැවති අතර එසේම එකල සභාවේ කසළ බොහොරබවට පත් කිරීමට කටයුතු කල රැඳවියන්ට, බලාගත් නිලධාරියාට දිනකට යම් දීමනාවක් ලෙස ලාභයෙන් යම් මුදලක් ලබාදීමද සිදුවූ නිසා මෙම කටයුතු කෙරේ ආකර්ශනයෙන් වැඩ කල බවත් මේවන විට එම දීමනා නොගෙවන බවත් පොහොර නිෂ්පාදනය ට සැකසූ මඩුව අබලන්ව ඇති බවත් එම ස්ථානය කසළ වලින් පිරී ඉතාමත් අපවිත්‍රව දුගඳව ඇති ස්ථානයක් බවට පත්වී ඇති බවත් සඳහන් කරන ලදී. කසළ වර්ෂාවට හසුවී එම දියර වලදුර ඇලට එක්වී ඒම ඇලද අපවිත්‍රවී ඇති බවත් දැනුම්දෙන ලදී. සියළු මන්ත්‍රීවරු මෙම ස්ථානයට ගොස් බලන ලෙසද දැනුම්දෙන ලදි. කිපදෙනෙක් ගොස් පරික්ෂා කලබවත් එම ස්ථානයේ කොන්ක්‍රිට් කණු යොදා වහල ගසා ඉදිකිරීමක් කර ඇති අතර එම සංවර්ධන කටයුතු පොහොරබාව ඉඩමේ සිදුකලේ නම් වැදගත් බවත් බන්ධනාගාරය මගින් මෙම කටයුතු පවත්වාගෙන යාම ප්‍රතික්ෂේප කල හොත් සභාවට ගැටළුවක් බවත් ප්‍රකාශ කලේය. සියළු මන්ත්‍රීවරු මෙම ස්ථානයට ගොස් නිරික්ෂනය කරන ලෙස ප්‍රකාශ කලේය.

මෙම අවස්ථාවේදී කාරක සභාව මහා සභාව බවට පත් වීම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාවෙන් හා සම්පත් බොතේජු ගරු මන්ත්‍රීවරයාගේ ස්ථිරත්වයෙන් සිදුවිය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

නිතිඥ ගාස්තු ගෙවිම සම්බන්ධ නඩුපැවරීමට ඉදිරි කටයුතු සිදුකරමින් පවතිනවා. වලදුර බන්ධනාගාරයේ ඉදිකර ඇති පොහොර ව්‍යාපෘතිය සම්බන්ධ යම් අක්‍රමිකතාවයක් ඇත්ද යන්න පිලිබඳව තවදුරටත් කරුණු සොයාබලා අවශ්‍ය ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා ගේ යෝජනාව අනුව වලදූර බන්ධනාගාරයේ ඉදිකර ඇති පොහොර ව්‍යාපෘතිය සම්බන්ධ ගොඩනැගිලි සඳහා එම ඉදිකිරිමට අවසරයක් ලබාතිබේද යන්නත් නොමැතිනම් මෙම වැයබර දැරීම මුදල් අවභාවිතයක් වන හෙයින් හා සභාවට පාඩුවක් වන බැවින් ඒ පිලිබඳ විමර්ශනයක් කර එම කටයුත්තට සම්බන්ධ සියළු නිලධාරින්ගෙන් එම මුදල් අයකරගැනීම සම්බන්ධව තව දුරටත් කරුණු විමසා බලා අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය විසින් කරනු ලබන යෝජනා**</u> **-**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය**</u>

**06- 45. නාරංගස්හේන තුන්මංහන්දියේ සිට ඉදිරියට මාර්ගය 150 මිටර් පමන කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මියගේ යෝජනාව අනුව නාරංගස්හේන තුන්මංහන්දියේ සිට ඉදිරියට මාර්ගය 150 මිටර් පමන කොන්ක්‍රිට් කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය</u>

**06- 46. ගමෙක් ගංගොඩ ප්‍රධාන මාර්ගයේ අවශ්‍ය ස්ථාන සඳහා කොන්ක්‍රිට් ඇතිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංගනාත් ගහබඩගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මියගේ යෝජනාව අනුව ගමෙක් ගංගොඩ ප්‍රධාන මාර්ගයේ අවශ්‍ය ස්ථාන සඳහා කොන්ක්‍රිට් ඇතිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය</u>

**06- 47. කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රෙද්ශයට අයත් කිරිඇල්ලේ හාන්දුකන්ද ගමේ පිහිටි කබරගල දිය ඇල්ල ආශ්‍රිතව සංචාරක කලාපයක් ඇති කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංගනාත් ගහබඩගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය</u>

නැදුන් විහාරය අසලයි කබරගල පිහිටාතියෙන්නේ. විශාල ගල්ලෙන් තියෙනවා. දෙස් විදෙස් සංචාරකයින් එනවා. මේ දියඇල්ල නැරඹිමට දැනුවත්වීමක් නිසිලෙස ප්‍රදර්ශනය කරලා නෑ. මාර්ගය වරදිනවා. කබරගලට එහා අම්බානගල තියෙනවා. සංචාරය කිරිමට සුදුසුයි. සියළු දේ සංචාරයට සුදුසු ලෙස තියෙනවා. ඒ සියල්ල එකතු කරලා කුරුවිටත් එක්කම කිරිඇල්ලත් එකතුකරලා **සංචාරක කලාපයක් ලෙස වැඩිදියුණු කරමු. ඇල්ල ආශ්‍රිතව හාන්දුකන්ද ගමේ ජනතාව රසකැවිලි නිෂ්පාදනයකරලා අලෙවිකිරීමත් සිදුකරනවා. මේ ප්‍රෙද්ශය රක්ෂිතයක්. මුල්කාලයේ වල්ලපට්ටා ගසුත් තිබුනා. ඒවා කපලා. දැන් නෑ. මාස හයකට පෙර වනසංරක්ෂන නිලධාරීනුත් එක්ක එකතුවෙලා පැල හිටෙව්වා. නමුත් අර ලොකු ගස් කපනකොට ඒවා විනාශවෙනවා.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
සංචාරක කලාපයක් ලෙස වැඩිදියුණු කිරීමට අවශ්‍ය සැලසුම් තොරතුරු පළාත් සභාවට යොමු කරමු. මේ බලප්‍රෙද්ශයේ සංචාරක ආකර්ශනයට අදාලව ප්‍රෙද්ශ ගනනාවක් තියෙනවා. මේ පිලිබඳව දිගින් දිගටම කතා කලා. අපි මේ පිලිබඳව පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශයට යොමු කරමු. බලප්‍රදේශයේ සංචාරක ආකර්ශනයට අදාලව සියළු කරුණු අරගෙන ව්‍යාපෘතියක් හදලා පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශයට යොමු කරමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මියගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රෙද්ශයට අයත් කිරිඇල්ලේ හාන්දුකන්ද ගමේ පිහිටි කබරගල දිය ඇල්ල ආශ්‍රිතව සංචාරක කලාපයක් ඇති කිරිමට** හා බලප්‍රදේශයේ සංචාරක ආකර්ශනයට අදාලව සියළු විස්තර සහිතව ව්‍යාපෘති වාර්තාවක් සකසා සබරගමු පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශයට යොමු කිරීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා විසින් කරනු ලබන යෝජනා -</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා-</u>
**06-48.** මඩලවත්ත මඩලකන්ද පාර ඉතිරි කොටස් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරිමට **යෝජනා කරමි.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා-</u>

**මාර්ගය තාර හා කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමේදි තැනින්තැන සංවර්ධනය නොකර ඉතිරිකළ කොටස් මුළු ප්‍රමාණය මීටර් 100 ක් පමන නිසා මාර්ගයේ ගමනාගමනය අපහසුතා තියෙනවා. මෙම තත්වය මගහැරගැනීමට කටයුතුකිරීමෙන් ඒසඳහා වැයකරන ප්‍රතිපාදන වලට වඩා වැඩි වටිනාකමක් ජනතාවට ලැබෙනවා.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා ගේ _යෝජනාව අනුව මඩලවත්ත මඩලකන්ද පාර ඉතිරි කොටස් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා-</u>

**06-49. හීම්මිරිය මඩලකන්ද පාර මීටර් 100 ක් කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා-</u>

**මුල් මීටර් 100 කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමෙන් මඩලකන්ද ප්‍රෙද්ශයට සම්බන්ධවීම මෙන්ම තේවත්ත ප්‍රෙද්ශයට පිවිසිමට ඇති කෙටි මාර්ගයේ සංවර්ධනයද සිදුවේ. ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 50 ක්.**
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා ගේ _යෝජනාව අනුව හීම්මිරිය මඩලකන්ද පාර මීටර් 100 ක් කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා-</u>

**06-50. ඇල්ලගාව කළුවාවලතැන්න නිමල් කුලරත්න මයාගේ නිවස අසලින් දොලට යන පාර හා ට්‍රාන්ස්පෝමරය අසලින් දොලට යන පාරේ ඉතිරි කොටස කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා ගේ _යෝජනාව අනුව ඇල්ලගාව කළුවාවලතැන්න නිමල් කුලරත්න මයාගේ නිවස අසලින් දොලට යන පාර හා**

ට්‍රාන්ස්පෝමරය අසලින් දොලට යන පාරේ ඉතිරි කොටස කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා -</u>

**06-51. සාන්ත ජෝකිම්වත්ත දෙමළමහා විද්‍යාලය ඉඩම මැදින් ඇති මාර්ගය වැසීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා -</u>

**මේ මාර්ගය වැසීම පිලිබඳව වතුඅධිකාරි අකමැතියි. මාර්ගය වැසියයුතු නම් විකල්ප මාර්ගයක් දෙන්නළු. පසුව ලක්ෂ 20 ක් වෙන්කරගෙන විකල්ප මාර්ගයක් හැදුවත් ආයෙත්**
**දෙමළමහා විද්‍යාලය ඉඩම මැදින් ඇති මාර්ගය වහන්න බැරිළු. ප්‍රාදේශීය සම්බන්ධීකරනයෙත් කිව්වා මාර්ගය වහන්න කියලා. විදුහල්පතිතුමා, ඇතුළු කමිටුව විසින් දැනුම්දුන්නත් පාර වැහුවේ නෑ. දැඩි තීන්දුවක් ගන්න වෙනවා ඒ මාර්ගය වහන්න. අපේ සභාපණිත අනුව අපිට මාර්ගයක් හදන්න පුළුවන් . මම ඉල්ලා සිටින්නේ මේ අනවශ්‍ය පාර වැසීම සම්බන්ධව නීතිය අනුව කටයුතු කරන්න කියලා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>
**අපේ කොට්ඨාශෙ මේ ගැටළුව. සාන්ත ජෝකිම්වත්ත දෙමළමහා විද්‍යාලය ඉඩම මැදින් ඇති මාර්ගය වතු අධිකාරි විසින් භාවිතා කරනවා. දමිළ ජනතාවගේ ඉල්ලීම අනුව මේ මාර්ගය වෙනුවට විකල්ප මාර්ගය භාවිතය කල යුතුයි. දවල්ට පාසැලේ දරුවෝ පාරට මැදිවෙලා. මීටර් 10 ක් වත් දුර නෑ. පොඩිදරුවන් ඉන්නේ. විවේක කාල දෙකක් තියෙනවා. වතුඅධිකාරිගෙයි වෙනත් වාහනයි මේ ක්‍රිඩාපිටිය මැදින් යන්නේ. ඒ අය පාර වහන්නනම් විකල්ප මාර්ග ඉල්ලුව නිසා ලක්ෂ 20 ක් විතර වැයකරලා හැදුවා විකල්ප මාර්ගයක්. දැන් දවල්ට පුවරුවක් ප්‍රදර්ශනය කරලා වාහන ඇතුළුකිරීම තහනම් කියලා. නමුත් සහමුලින්ම**
**මේ තත්වය ඉවත්කිරිමට උත්සාහාදරනවා. දරුවන්ගේ හා පාසැලේ ආරක්ෂාව වෙනුවෙන්. පාර මැද ක්‍රිඩාපිටිය. අනාරක්ෂිතයි. නැවත ඉල්ලීම් කරමු. විදුහල්පතිතුමාටත් ගෙදරින් යන්න උනා. අපි පුළුවන් විධිහට එතුමාව ආරක්ෂා කලා. මේ වෙනකොට මේ මාර්ගයේ ප්‍රශ්නය මතම පවුල් 330 ක් ට විරුද්ධව නඩුදාන්න යනවා වත්තෙන්. වත්තේ අල්ලගත්ත ඉඩම්වල ඉන්නේ කියලා. අපිට ඡන්දය දුන්න ප්‍රජාවක්. දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සභාවක් ලෙස කල හැකි උපරිමය කරන්න. අධ්‍යාපනඅධ්‍යක්ෂ, ට කතාකරලා වතුඅධිකාරීවරුන්ට ලිපිඇරලා මේ සම්බන්ධව මැදිහත්වෙලා කටයුතු කරන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්.ධර්මසිරි මහතා-</u>

**1918 අංක 30 පණතේ වතුබලතල අපිට පැවරීමක් කරලා තියෙනවා. එහි සංශෝධනවල ගම්වල වැඩ ඉදිකිරිමක් හෝ වෙනත් යන්නේ ගම් යන්නට වතු ආදේශ කරලා පාරවල්**

**නිවාස වැසිකිලි ආදිය හදද්දී වතුඅධිකාරී අනුමැතිය ගන්න කිව්වාට අපිට බලතල තියෙනවා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>

**ඒ අදහස් කරන්නේ කොළඹ වතු.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**පාසැල මැදින් පිට්ටනිය හරහා මාර්ගයක් තියෙන එක බාධාවක්. තාප්ප බැඳලාත් නෑ. දරුවන්ට හානිවෙන්න පුළුවන්. උපකරණ ගොඩනැගිලි වල ආරක්ෂාවට බාධාවක්. අපි මේ පිලිබඳව මැදිහත්වෙමු. සාකච්ජා කරමු. බැරි උනොත් නීතිමය තත්වයට යමු.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා ගේ යෝජනාව අනුව සාන්ත ජෝකිම්වත්ත දෙමළමහා විද්‍යාලය ඉඩම මැදින් ඇති මාර්ගය හේතුවෙන් දරුවන්ට හා පාසැලට හානියක් වීමට ඉඩ ඇතිහෙයින් එය වැසීම සඳහා අදාළ සියළු අංශ සමඟ සාකච්ජා කොට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා -</u>

**06-52. කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශයට අයත් වතුවල ජීවත් වෙන ජනතාවට ප්‍රජාශාලා පහසුකම් ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා -</u>

**වතුජනතාවට ප්‍රජා කටයුතු කරන්න ප්‍රජාශාලා පහසුකම් නෑ. තිබුනත් ඒවා තාවකාලිකව දෙන්නේ. එක තැනක් තිබුනා. පුල්ලෙ මඩුව. සමෘර්ධි රැස්වීම කරනකොට යන්න කියලා දොර වැහුවා. රාමක්‍රිෂ්නන් මිෂන් කියලා ආයතනයක් තියෙනවා. ලංකාවටම දෙකයි තියෙන්නේ. වත්තේ ඉන්න කෙනෙක් මහන උන නිසා කොටගල කාර්යාලයේ ඉඳන් බලනවා. වතුවල දුප්පත් ජනතාවට ඒ එන්ජීඕ එක මගින් කෝවිල් ඉඩමේ ජුනානි සිද්ධි , බටහිර වෙදකම්, නොමිලේ දෙනවා. ඉංග්‍රිසි පන්තිත් තියනවා. අපේ වත්තේ තාම ළමයෙක් වෛද්‍ය පීඨයට ගිහි්න් නෑ. යන්න විධිහක් නෑ. උසස්පෙල පන්ති නොමිලේ කරන්නත් තැනක් නෑ. මම මුලින් පොරොන්දු උනා පුස්තකාලයක් හදනවා කියලා. තාම කණුවක්වත් හදන්න බැරි උනා. ඒවා හදන්න තැනක් නෑ. කරපිංච බිල්ඩිම පුල්ලේ මඩුව නිසා දෙන්නේ නෑ. දහම්පාසැල විතරයි තියෙන්නේ. ඒ දෙකම සභාවට පවරා ගන්න ප්‍රජාශාලාවක් විධිහට. ඒ දවස්වල අපි ආණ්ඩුකාරතුමාටත් කිව්වා. අපිට ටීවී රූම් එකක්තිබුනා. එතන ඩිස්පෙන්සරිය හදන්න කියකොට පුල්ලෙමඩුව තියෙන තැනට ඒක මාරු කරන්න කිව්වා. නමුත් එයාලා ඩිස්පෙන්සරිය අපි නැති කරන්න හදනවා කියලා වත්තේ ජාති භේදයක් ඇති කරන්න හැදුවා. අන්තිමට දහම් පාසැල තියන්න තැනකුත් නැතිඋනා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>

ඉල්ලීම හොදයි. ශාන්ත ජෝකිම් වත්තේ කෝවිලට අදාල ගොඩනැගිල්ලේ ඩිස්පෙන්සරිය මගේ මූලිකත්වයෙන් හැදුවේ. දිනපතා 500 ක් විතර එනවා. නිදන්ගතරෝග වලට ප්‍රතිකාර කරනවා. නීත්‍යානුකූලව පවරලා නිහඩ උනා. වතුජනතාවට පුල්ලේ මඩුව දුන්නා. ඒ ඉඩමයි රෝහලටත් තිබුනේ. ඒකාලේ සිදුවීම් එක්ක ගොඩනැගිලි හදලා ගන්න තිබුනා. නමුත් බාගෙට තිබුන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරනය කරලා ඒක හැදුවා. ඉඩමක් තියෙනවා ප්‍රජා ශාලාවට. ඒ හින්දා පුල්ලේමඩුව ගන්න බැරිඋනා. රැකියා කරන අයගේ දරුවන් දවල්ට ඒකේ ඉන්නවා . හවසට අරන් යනවා. දැන් එතන බලාගන්න කෙනෙක් නෑ. දහම්පාසැල විතරයි තියෙන්නේ. කුඩා තේවතු සංවර්ධන අධිකාරිය මගිනුත් විසඳුම් ඉල්ලන්න පුළුවන්. මේ මන්ත්‍රිතුමාට තාම බැරි උනාළු වතු ජනතාව වෙනුවෙන් කණ්ඩුවක් හදන්නවත්. මට යම් ප්‍රතිපාදනයක් දෙනවානම් මේ ජනතාව වෙනුවෙන් ඒ කටයුතු කරන්න. ආණ්ඩුවට මේක හොඳ අවස්ථාවක්. මේ ජනතාව වෙනුවෙන් සේවයක් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

කොම්පැණි අයිති වතු හාම්පුත්තු තමා වතුජනතාවගෙන් පෝෂනය වෙන්නේ. කොම්පැණි අයිති වතු හාම්පුත්තු ඒ ජනතාවට උදව් කරන්නේ නෑ. වතුජනතාව වෙනුවෙන් කටයුතු කරන්න මේ දේවල් දැනුවත්කරලා මැදිහත්වෙන්න මේ අයව එකතැනකට කැඳවන්න. ප්‍රාෙද්ශිය ලේකම්, සභාපතිතුමා, වතුඅධිකාරිවරුන්, චන්ද්‍රකුමාර් මන්ත්‍රි, දේවින්ද මන්ත්‍රි,
2026 ට නිර්දේශ ගන්න. එක්එක්වතුවල කටයුතු පිලිබඳව කතාකරමු. එකඟත්ව ගමු. කරන්න බැරිනම් එවේලේම ඉදිරියට කල හැකි දේ කියමු. මේ සම්බන්ධව ඉදිරි කටයුතු කරමු.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.වී.මහින්ද මහතා-</u>
වතු අධිකාරිවරු මේ රටේ ඉන්න මලයාලම් ජනතාව වෙනුවෙන් මැදිහත්වීම අල්පයි. වැසිකිලිවලක් කපන්න පවා අවසර ගන්න ඕනි. මේ වතු ජනතාව වෙනුවෙන් ජාතික වැඩපිලිවෙලක් අවශායි. මේක ජාතික ප්‍රශ්නයක්. මේ ජනතාව වෙනුවෙන් යමක් කිරීම සඳහා විශේෂ සැලකිල්ලක් යොදවලා මීට වඩා මැදිහත්වෙමු. අපි එකඟයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සම්පත් බොතේජු මහතා-</u>

පත්බේරියෙත් වතු ජනතාව ඉන්නවා. වතුමාර්ග, ඉඩම්, විශාල ගැටළු තියෙනවා. මේ ගැටළුවලට 2006 ඉඳන්ම විසඳුම් ලබාගත්තේ සාකච්ජා මාර්ගයෙන්. පත්බේරිය පොල, තැපැල්කාර්යාලය, පිට්ටනිය, ඒ සියල්ලටම වතු අධිකාරිවරැන් කැඳවලා සාකච්ජා කරලා තමා ඉඩම් ලබාගත්තේ විසඳුම් ගත්තේ කතා කරලා. වතු අධිකාරීවරුන්ට බලයක් තියෙනවා. ඒ බලය හීන කරලා මේවැඩ කරන්න ගියොත් බැරි වෙයි. සාකච්වජ කරලා මේ දේවල් විසඳගමු.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අපි සභාවක් ලෙස මැදිහත්වෙමු. උපසභාපතිතුමා කිව්වා වගේ සියළු අධිකාරීවරුන් කැඳවලා සාකච්චා කරලා සහයෝගයෙන් කරමු. මුලින්ම සාකච්චා කරලා බැරි උනොත් නිතිමය පියවරක් ගමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශයට අයත් වතුවල ජීවත් වෙන ජනතාවට ප්‍රජාශාලා පහසුකම් ලබාදීම සම්බන්ධව අදාළවතු අධිකාරිවරුන් හා සියළු අංශ සමඟ සාකච්ජා කොට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා -</u>

**06-53. කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශයට අයත්, වතු ජනතාව ජීවත් වෙන ගම්වලට සුදුසු පරිදි නීත්‍යානුකූලව නම් තැබීමට (නාමකරණය කිරිමට) යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා -</u>

වත්තක් ගත්තාම ඒ එක වත්තක ඉන්නවා එකම නම තියෙන එකම මුලකුරු තියෙන අය. ශාන්ත ජෝකිම් වත්තේත් එහෙමයි. අඩි 12,12 කැල්ලක ඉන්න පවුල් සංඛ්‍යාව වැඩියි. එක ලියුමක් එක් අයෙකුට ආවොත් එකම නම තියෙන දෙතුන්දෙනෙක් ඉන්නවා. මේ ජනතාව ඉන්න පැත්තට ,ගමට, නමක් තියේනම් ඒ ගමේ නම හරි කියන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>

තැපැලෙන් ලියුමක් ආවාම ඒක කාටද කියන්න බෑ. එකම නම. ලැයිමේ අංකෙත් එක්ක. පාසැලේ ලියන්නෙත් ඒක. තරුණ ලමයි ඉන්නවා. ඇත්තටම නාමකරණයක් කරලා තිබුනා නම් ඒ නම කියන්න තිබුනා. තැපැලෙන් එන ලියුම ලැබෙන කෙනාට අභිමානයක් තියෙනවා. නියම ලිපිනයක් නෑ. වතු අධිකාරී අවසර දෙන එකකුත් නෑ. මේ කාරණයට සාධාරණයක් කරමු. සභාපතිතුමා සම්බන්ධීකරණයක් කරලා සාර්ථක උත්තරයක් ලබා දෙන්න.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අපි මේ යෝජනාවට අදාලව ඒ ගම් නාමකරණයක් කරන්න උත්සාහය ගමු. ඒ අදාල ආයතන දැනුවත් කරමු. මන්ත්‍රීතුමා මේ වීදි වලට අදාලව ඉදිරිපත් කරන නම් මොනවාද? ඒවාත් ලබාදෙන්න. කාලයක් යයි. නමුත් මලයාලම් ජනතාව වෙනුවෙන් ඒ ලිපිනයන් යෙදීම වගේම ඉඩම්වල අයිතිය ජනතාවගේ බවට පත් කිරීමට බලාපොරොත්තු වෙනවා. රජය මේවන විටත් ඒ කටයුතු වලට මැදිහත් වෙලා. ජනතාවට සිදු වන අයහපත් දේ වෙනුවෙන් පෙනී ඉන්නවා. උදව් කරනවා.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්. චන්ද්‍රකුමාර් මහතා ගේ යෝජනාව අනුව__කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශයට අයත්, වතු ජනතාව ජීවත් වෙන ගම්වලට සුදුසු පරිදි නීත්‍යානුකූලව නම් තැබීමට (නාමකරණය කිරිමට) අදාලව ඉදිරි කටයුතු කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.වී.මහින්ද මහතා විසින් කරනු ලබන යෝජනා-**</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.වී.මහින්ද මහතා -**</u>

**06 -54 දොඩම්පේ ග්‍රාමනිලධාරි වසමේ මිල්ලකඩේ වෙරළුගලපිටිය මාර්ගයේ අබලන්වී ඇති කෙළවර කොටස සංවර්ධනය කිරිමට ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි කේ.ඩී.චූලා ශාන්ති මිය -**</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.වී.මහින්ද මහතා -**</u>

**වැසි දිනවලදී මේ මඩ සමග ජලය රැදීම නිසා ශ්‍රී රාහුල විද්‍යාලයට යන දරුවන්ට හා මාර්ගයේ යන පිරිසට ඉතා අසීරු තත්වයක් තියෙන්නේ. මේ මාර්ගය කඩිනමින් සංවර්ධනය කිරිමට අවශ්‍යයි. පවුල් 50 ක් විතර පරිහරණය කරන මාර්ගයක්.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.වී.මහින්ද මහතා ගේ යෝජනාව අනුව දොඩම්පේ ග්‍රාමනිලධාරි වසමේ මිල්ලකඩේ වෙරළුගලපිටිය මාර්ගයේ අබලන්වී ඇති කෙළවර කොටස සංවර්ධනය කිරිමට ප්‍රතිපාදන ලබාදීමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.වී.මහින්ද මහතා -**</u>

**06- 55 දොඩම්පෙ ග්‍රාමනිලධාරි වසමේ නාගොඩ ගමට ඇති නාගොඩ පොදු සුසානභූමිය ට යන ප්‍රවේශ මාර්ගය සැකසීමට ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.ඩී.චූලා ශාන්ති මිය -**</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.වී.මහින්ද මහතා -**</u>

මේ මාර්ගය ඉතාම දුෂ්කර අබලන් මාර්ගයක්. මෘත ශරීර ගෙන යාමේදි ගම්වැසියෝ දැඩි අසීරු තත්වයට පත් වෙනවා.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා ගේ යෝජනාව අනුව දොඩම්පෙ ග්‍රාමනිලධාරි වසමේ නාගොඩ ගමට ඇති නාගොඩ පොදු සුසානභූමිය ට යන ප්‍රවේශ මාර්ගය සැකසීමට ප්‍රතිපාදන ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

**06-56.** **යහලකොටුන්න ප්‍රජා ජල මූලාශ්‍රය පෝෂක ප්‍රදේශය ආරක්ෂිත කලාපයක් ලෙස නම් කිරිමට අවශ්‍ය කටයුතු සැලසීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.

**මේ ජල පෝෂක ප්‍රෙද්ශයෙන් පානීය ජලය පරිභෝජනය කරන ජනතාව පවුල් 350 ක් විතර ඉන්නවා. ඉහල ප්‍රදේශයේ ආරක්ෂිත කලාපයක් ලෙස නම් කලොත් ජනතාවගේ ජල අවශ්‍යතාවය සපුරන පෝෂක ප්‍රෙද්ශය ආරක්ෂාවෙනවා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>
**ජල මූලාශ්‍ර ආශ්‍රිතව ජල ව්‍යාපෘතිය ආරම්භ කලේ පුද්ගලික මුදලෙන්. ඒක දිගු කරන්න අජිත් ජිනදාස මන්ත්‍රීතුමා බට ගන්න ප්‍රතිපාදන දුන්නා. ජල පෝෂක ප්‍රෙද්ශයේ ගෙවල් පහක් හයක් තියෙනවා. වැසිකිළි. ප්‍රාෙද්ශිය ලේකම්ට කියලා දීර්ඝ කාලයක්. ග්‍රාමනිලධාරීව ඇරලා රාජකාරි කලා. මේ ජලපෝෂක ප්‍රෙද්ශය ආරක්ෂා කල යුතුයි. මේක කරමු.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ යෝජනාව අනුව යහලකොටුන්න ප්‍රජා ජල මූලාශ්‍රය පෝෂක ප්‍රදේශය ආරක්ෂිත කලාපයක් ලෙස නම් කිරිමට අවශ්‍ය කටයුතු සැලසීමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

**06-57.** **පරගලතැන්න ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථානයට වැසිකිළියක් සකසා දීමට රු. 80000.00 ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා -</u>
**වැසිකිළි ගැන කතාකරන නිසා මේ අදහස දක්වන්නේ. සිරිපාද කාලේ. වර්ෂාගල අවසානයේ පන්සලේ හාමුදුරුවෝ අවාසය හදලා. වැසිකිලි පහසුකම් නෑ. දහස් ලනන් ජනතාව යනවා. වාහන හරවන්නේ එතන. වැසිකිලි හදන්න අවසරය ඉල්ලා. ඉඩම් ප්‍රතිසංස්කරන කොමිසමට අයත් ඉඩමක්ද කියලා ගැටළුව. වැසිකිලි හදන කොටස. ස්ලැබ්**

**එක උඩ හදන්න පුළුවන්. කාර්මික නිලධාරීන් බලලා. කාලයක් ගියොත් මේ වැඩේට සිරිපාද කාලේ ඒ පහසුකම දෙන්න බැරිවෙනවා. එරත්න ශ්‍රීපාද වන්දනා නඩ වලට වැදගත්. අපිත් යම් මැදිහත්විමක්කරමු. ඔප්පු තිරප්පු පිලිබඳව ඒ ආයතන කටයුතු කරයි. අපි මැදිහත්වීමක් කරමු. ලියාපදිංචිය ගැන යම් ගැටළු තියෙනවළු. මුණගැහිලා කතා කලා. යම් මැදිහත්වීමක්කරන්න.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**මේ සම්බන්ධයෙන් වෙනම කතාකල යුතුයි. අපි මැදිහත්විමක්කරමු.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ යෝජනාව අනුව පරගලතැන්න ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථානයට වැසිකිලියක් සකසා දීමට රු. 80000.00 ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කිරීමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -**</u>

**06- 58. වලදූර පාළුවත්ත ප්‍රභාත් මහතාගේ නිවස අසල ඇති බෝක්කුව පිලිසකර කිරීමට රු. 170000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-**</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -**</u>

මේ බෝක්කුව ගිලාබැහැලා තියෙන්නේ. බරවාහන දළු ලොරි ගමන්කරන්න බාධාවක්. ප්‍රවාහන කටයුතු පවත්වාගෙන යාම සඳහා මේ පිලිබඳව නඩුකාරදෙනිය ග්‍රාමසංවර්ධන සමිතිය මගින් හා ගම්වාසීන් ඉදිරිපත්කර ඇති ඉල්ලීම් ලිපි සභාගත කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -**</u>

මෙම මාර්ගය හා බෝක්කුව සම්බන්ධව පියවර අරන් තියෙන්නේ. මාර්ග සංවර්ධනය යටතේ ඇස්තමේන්තු කලා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -**</u>

මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කලා. එසේම මේ බෝක්කුව සම්බන්ධව මෙතෙක් කටයුතු කරලා නැති නිසායි ජනතාව ඉල්ලීම් ලබාදුන්නේ.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ කටයුත්තට කොටසට මුදල් වෙන්වෙලා නම් සභා මුදල් යොදවන්න අවශ්‍ය නෑ. හදලා නැති සුදුසු වෙන අවශ්‍ය තැනකට ප්‍රතිපාදන යොදවන්න පුළුවන්.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -**</u>

කම්මල ලඟ මාර්ග කොටස කැඩිලා. පාළුවත්ත කෙලවර ආපදා එකෙන් හදනවා. ඒවා සියල්ල ගමේ ඉල්ලීම්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

ඊට මෙහා සැන්ඩි අප්පොගේ ගේ නිවස ආසන්නයේ මාර්ගය කැඩිලා. ඒක ආපදා එකෙන් හදනවා.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>
පාළුවත්ත ගංවතුර නිසා සැන්ඩි අප්පොගේ ගේ ලඟ මාර්ගයයි පාළුවත්ත කෙලවරයි කම්මල ලගයි පළාත් ප්‍රතිපාදන වලින් හදනවා. පාළුවත්ත කෙළවර ගිලා බැහැලා නිසා ඒක මුලින්ම කරනවා.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා විසින් වලදූර පාළුවත්ත ප්‍රභාත් මහතාගේ නිවස අසල ඇති බෝක්කුව පිලිසකර කිරීමට රු. 170000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරන ලද අතර මෙම අවස්ථාවේදී එම බෝක්කුව පිලිසකර** කිරිමට ප්‍රතිපාදන වෙන්ව ඇති බව සඳහන්වූ බැවින් **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා විසින් යෝජනා කරන** සුදුසු වෙනත් ස්ථානයක ට ප්‍රතිපාදන වෙන්කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා විසින් කරනු ලබන යෝජනා</u>
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-</u>
**06- 59.** මැලේබැද්දහේන මාර්ගයේ ප්‍රේමරත්න මයාගේ නිවස දෙසට ඇති මාර්ගයේ **ප්‍රිමික්ස් යොදා අළුත්වැඩියාකිරිමට රු. 230000.00ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-</u>

**වර්ෂාව එක්ක මේ මාර්ගයේ ගමනාගමනය අපහසුයි.**
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා ගේ යෝජනාව අනුව මැලේබැද්දහේන මාර්ගයේ ප්‍රේමරත්න මයාගේ නිවස දෙසට ඇති මාර්ගයේ ප්‍රිමික්ස් යොදා අළුත්වැඩියාකිරිමට රු. 230000.00ක ප්‍රතිපාදන ලබාදීමට** ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ. කේ. දයාවති මිය විසින් කරනු ලබන යෝජනා-</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ. කේ. දයාවති මිය</u>

**06-60 .** **වතුයාය බවුන්ඩරය වගා බිම් කීපයක් ගංවතුර උවදුරට ලක්වන බැවින් එය වලක්වාලීම සඳහා ඇල මාර්ගයට තෙක් මීටර් 200 ක පමන කාණුවක් කැපීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ. කේ. දයාවති මියගේ යෝජනාව අනුව වතුයාය බවුන්ඩරය වගා බිම් කීපයක් ගංවතුර උවදුරට ලක්වන බැවින් එය වලක්වාලීම සඳහා ඇල මාර්ගයට තෙක් මීටර් 200 ක පමන කාණුවක් කැපීමට** ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 61.** **කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට අදාලව සකසන ලද අයවැය කෙටුම්පත සඳහා මහා සභාවේ අනුමැතියක් ලබාදීම සම්බන්ධව තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**මේ සම්බන්ධයෙන් දිර්ඝ ලෙස සාකච්ඡා කළා. සංශෝධන එක්ක. ඒ අනුව සකසක ලද අයවැය කෙටුම්පත අද දින ඉදිරිපත් කලා.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>**

**2026 අය වැය කෙටුම්පත පිලිබඳව අවස්ථා දෙකකදි සාකච්ඡා කලා. මේ ප්‍රෙද්ශයේ සමස්ත ජනතාවට සේවා සැලසීමට බලාපොරොත්තු වෙන අයවැය. සියළු මන්ත්‍රිතුමන්ලා හැකි ලෙස මේකට සහභාගි උනා. අවසන් අයවැය කෙටුම්පත අද ඉදිරිපත් කරලා. මේ අයවැය සම්බන්ධව කණගාටුවක් ඇතිවෙන්නේ. ගුණවර්ධන සභාපතිතුමා, සලිත සභාපතිතුමා, මල්කැකුළ සභාපතිතුමා ගේ කාල වල මන්ත්‍රී වරයෙක් ලෙස මම හිටියා. ඒ අයවැය කියෙව්වා. නමුත් මේ අයවැය අසමත් අයවැයක් . ඒ නිසා අසමත් අයවැයට අනුමැතිය දෙන්නේ නෑ. ව්‍යවහාරය අනුව ගත්තාම මෙය අසමත් වර්ගයට අයත් අයවැයක්. ඊට හේතු තියෙනවා. ඔබතුමන්ලා පසුගිය පළාත් පාලන මැතිවරනයෙන් බහුතර ජන්ද ලබාගෙන නායකත්වයට පත් උනා. නායකත්වය ගන්න හරි හෝ වැරදි හෝ අනෙකුත් පක්ෂ කීපයක් නියෝජනය කරන සභිකවරුන්ගෙත් සහාය ලැබුණා. ජනතා බලය ඉල්ලනකොට ඉදිරිපත් කල ප්‍රතිපත්ති ප්‍රකාශන වල තියෙන ප්‍රතිපත්ති මේ අයවැයේ නෑ. හිටපු නායකයින්ට පල්හොරු කියලා කිව්වට හොරකම්කරලා හරි ඉතිරි කල කෝටි 5 ක ස්ථිර තැම්පතු අරගෙන හුණු ගානවා වගේ වෙන වෙන සංවර්ධන කටයුතු කරලා. එදා කේ. එම්. ගුණවර්ධන සභාපතිතුමා විරුද්ධ උනා. මේ තැම්පතුවෙන් මුදල් ගන්නවට. දැන් මේ පන්කෝටි විසිලක්ෂෙන් ලැබෙන ඒ ස්ථාවර තැම්පතුවෙන් ලැබෙන පොලී ආදායම අහිමියි. ඒ මුදල නොගෙන මේ කටයුතු කරන්න බැරිද? ඇතැම්**

කමිටුවලට ඉතාමත් දක්ෂ උගත් වියත් පිරිස පත් කලා. ඒ අයගෙන් උපදෙස් ගන්න තිබුනා. යම් ක්‍රමවේදවලට යන්න තිබුනා. මේ වියදම් කරන ක්‍රමවේදය අනුවත් අධිහාර එයි. කුලරත්න මන්ත්‍රීවරයාට වගේ අභාවයෙන් පස්සෙත් අධිහාර එයි ගෙදරට. මම කැමති නෑ. ඒ තත්වයට. හොඳ පරිනත මන්ත්‍රීවරු මේ සභාවේ ඉන්නවා. ජයරත්න මන්ත්‍රීවරයා වගේ. ඒ අයගෙන් උපදෙස් ගන්න තිබුණා. ඒ සේවය ගන්න. අපේ නඩත්තු ඒකක තිබුණා. දක්ෂ පරිපාලන ක්‍රමවේද යටතේ නඩත්තු ඒකක හදන්න පුළුවන්. මුදල් ඉතිරි වෙනවා. සාර්ථකව කලොත් කොමිස් මුදල් පවා ඉතිරි කරලා ඒ මුදලෙනුත් වැඩ කල හැකියි. පරකඩුව සතිපොලට තියෙන්නේ කලින් වෙන් කල ලක්ෂ 10 මයි. මූලික කටයුතුවලටවත් මදි. අය පැත්තට සතිපොලේ ආදායමත් එකතු කරලා. පළාත් සභාවේන් කාපට්කල මාර්ග දෙපස නඩත්තු කරන්න සේවකයින් දාලා. පරකඩුව බැවිල මාර්ගයේ මේ කටයුතු වලට කිලෝ මීටර් තුනෙන් තුන ගෙවනවා. ඒ වගේ සභාවේ වැඩ ඒකක පිහිටෙව්වොත් ඒ වැඩ අපිට ගන්න පුළුවන්. ආදායමක්. පසුගිය අයවැයෙන් දුම්රිය මාර්ග සංවර්ධනයට අවධානය දුන්නා. අවිස්සාවේල්ල දක්වා ඇවිත් නවත්තලා. වෙන එක තැනකවත් සිල්බර කොටයක් වත් දාලා නෑ. මේ ප්‍රදේශයේ බඳුවත්ත ඉඳන් ඒදණ්ඩවෙල කැම්ප් එක දක්වා ජනතාව මේ රේල්පාරේ ජීවත් වෙනවා. ඒ ජීවිත වලටත් මේ ප්‍රතිපත්ති වැදගත් වෙනවා. කෙසෙල්ගහක් හරි හිටවලා ආදායමක් ගන්න පුළුවන්. ආපු කෝච්චියකුත් නෑ. සභාපතිතුමා කතාකරලා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ක අපේ සීමාව තුළ තියෙන දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදු පදනමට ඉල්ලන්න. අපි ඒවා නැවත බදු දෙමු. සභාවට විශාල ආදායම් මාර්ගයක් වෙයි. අදාල මූලික ක්‍රමවේද වලට අනුව ඒ කටයුත්ත කරන්න. පත්බේරිය ග්‍රාමීය බැංකුව ලඟත් තියෙනවා ඉඩමක්. එතන සභාවට අරන් කඩපේලියක් හැදුවොත් විශාල ආදාමක් ගන්න පුළුවන්. ඉදිකිරීම් ක්ෂේත්‍රය මට හිතෙන විධිහට කෝටි 48 ට වැඩියි. සියළු ඉදිකිරීම් ටෙන්ඩර් දාන්න. මේ සේරම ටෙන්ඩර්කලොත් 12 % අඩුවෙන් ඉල්ලලා කෝටි 40 ට වැඩ කෙරෙනකොට ලක්ෂ 50 ක 60 ක ආදායමක් එනවා. ඉඩම් ඔප්පු ලියාපදිංචි ගාස්තු ඒ ආදායම සභාවට නියමිත පරිදි ලැබෙන්නේ නැතිළු. ලක්ෂ 50, 60 වටින ඒවා ලක්ෂ 10,20 ට ලියනවළු. ඒවා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පරික්ෂා කරලා බලනවා. තක්සේරු කරනවා. නමුත් ඒ බදු මුදල් සභාවට එන්නේ නෑ. මැදිහත්වෙන්න. ප්‍රතිපත්තිවලට අනුකූල නැති නිසා ත් අධිහාර වියහැකි නිසාත් මේ අයවැයට විරෝධය දක්වනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

මේ කටයුත්ත සාර්ථක කරන්න සභාපතිතුමා අවස්ථා දෙකකදි හා උපසභාපතිතුමා අවස්ථා තුනකදි උත්සාහා ගත්තා. වැඩමුළු පහකට ගියා. හොඳට අධ්‍යයනය කලා. අයවැය දිනන පරදින විධිහ කතා කලා. සභාවේ අපි අවස්ථා දෙකකදි රැස්වීම් වලදි සංශෝධනය කරන විධිහ කිව්වා. සංශෝධන ලිඛිතව ඉදිරිපත් කලා. ඒවා කියවන්නේ නැතිව අයවැය ඉදිරිපත්කරලා. සභාපතිවරු හතරදෙනෙක් ඉතුරු කළ රුපියල් කෝටි පහකුත් විසිලක්ෂයක් අරගෙන පාරක් බෝක්කුවක් හදනවා. ඒ ගන්න මුදල් ආයේ අපිට එන්නේ කොහොමද? මල්කැකුල සභාපතිතුමා මුදල් ගත්තානම් එන විදිහ පෙන්නුවා. ඒ මුදල ගන්නවාට මම විරුද්ධයි. සභාවේ අකටයුතු වෙනවා. මාර්ග දෙකක් අද න්‍යායපත්‍රෙය් තියෙනවා. ඒක අනුමැතිය දෙන්න පෙර අධ්‍යයනය කල යුතුයි. අපිට ඉන්නේ 19 යි. ඒ නිසා මේ සභාව කඩාකප්පල් කරන්න බෑ. අපිට අයවැය පරද්දන්නත් බෑ. ඒකට උත්සාහා කලෙත් නෑ. එක එක රැස්වීම් වලට ගියාම නීතිඥ උපදෙස් දුන්නා. ඒ අය අපිට කියා දුන්නා. අයවැය දිනුවොත් ඒකට විරුද්ධව දෙයක් කතාකලත් වැඩක් නැති බව කිව්වා. කුරුවිට ජනතාව මීට වඩා දෙයක් බලාපොරොත්තු උනා. සභාපතිතුමා මම

පලමු රැස්වීම් දෙකට හිටියා. පසුව අයවැය පිලිබඳව රැස්වීමක් ශාලාවෙන් පිට තිබුන නිසා මම ගියේ නෑ. මේ අයවැය පරද්දන්න කතා කරලා ඇතැම් අය විවේකකාලය දුන්නාම ආයේ ඇවිත් වෙනස් වෙලා. නියම වාමාංශික කියලා සජබෙ එක්ක යන්න බැරිනම් විජේසිරි මන්ත්‍රීවරයාට සහාය දෙන්නෙ කොහොමද? මේවා තිත්ත ඇත්ත. 19 ක් සාක්කිවලට ඉන්නවා. ආයෙත් අපි මේවාට අහුවෙන්නේ නෑ.

මේ අවස්ථාවේ සභාවේ දැඩි ඝෝෂා ඇති විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා -</u>

මේ සම්බන්ධයෙන් අවස්ථා ගානක කතා කලා. බෙදීමකට යනවා නම් අවසන් කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

සභාවේ අයවැය ගැන අදහස් පල කිරිමදි ඒවා කියන්නේ නැතිව ජන්දෙකට යමුළු.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා -</u>

දින දෙකක් කතා කලා. තව දුරටත් කතාකරන්නේ වෙන වෙන ඒවා. අනවශ්‍යතැනකට යන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

එහෙනම් මම මේ අදහස් දැක්වීම නතර කරනවා. ඔබ එදා විපක්ෂේ ඉන්නකොට තුනක් එක්ක අයවැයට විරුද්ධත්වය ප්‍රකාශ කලා වගේ අද මම 19 ක් එක්ක විරුද්ධත්වය පල කරනවා. බෙදීමක් ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -</u>

අයවැය කෙටුම්පත පිලිබඳව කිව්වදේ ඇත්ත. එදා උනදේ නිසා තුරුම්පුව ඇදීම බාල උනා. 1997 ඉඳන් සභාවේ පුරාණය අපි දන්නවා. දේවින්ද මන්ත්‍රීවරයා කිව්වා වගේ මුදල් හොයලා විපක්ෂයටත් දුන්නා. පසුගිය කාලේ මනාප ක්‍රමය තියෙනකොට මල්කැකුළ සභාපතිතුමාගේ කාලේ විපක්ෂයට මුදල් දුන්නේ නෑ. ආදර්ශයක් දීලා අද විපක්ෂයටත් මුදල් දුන්නා. අපි 19 විරුද්ධ උනත් ඔබතුමාට මේ අයවැය දිනන්න පරිසරය තියෙනවා. විපක්ෂය වෙනුවෙන් ඔබෙ මැදිහත්වීමට ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

ආවේගශිලීව කටයුතු කරන්න එපා. පලවෙනිපාර අයවැය ඉදිරිපත්කලා. සංශෝධනය කරමු කිව්වා. මාත් ඒ සාකච්ජාවට ගියා. ඩග්ලස් මන්ත්‍රිතුමාත් ගියා. සංශෝධනවලට යටත්ව අනුමත කරමු කිව්වා. ඒදා නිවැරදි විධිහට තීන්දු තීරණ අදහස් අරන් මේක නිවැරදිව කරන්න තිබුනා. නමුත් බැරි උනා. අපෙන් ඇහුවානම් තැම්පතුව ගන්නේ නැතිව කොහොමද කරන්නේ කියලා අපිට කතා කරන්න තිබුනා. ඊළඟ අයවැය හදනකොට හරි නිවැරදි කරගන්න. උදාහරන විදිහට පොදු පරිපාලනය ශීර්ෂ 50 යටතේ වරෙන්තු ගාස්තු හා දඩ මුදල් වල උසාවි දඩ. 2024 වර්ෂයේ එය 1907240.00ක්. 2025 ලක්ෂ 15 යි. 2025.09.30 ට 562579.00 ක්. නමුත් අයවැය 2026 හදනකොට ලක්ෂ 70 ක් පෙන්නලා. ආදායම් ලෙස. උපරිමය ලක්ෂ 20 ක් ලැබෙයි. ලක්ෂ 50 ක ටත් වැඩි

ආදායමක් පෙන්නලා. 2027 වෙනකොට කොහොමත් මේ හිඟ පියවන්න අමාරුයි. අතිශයෝක්තියක්. 60 වෙනත් ආදායම් යටතේ ආයෝජන පොලී ලක්ෂ 30 ක් දාලා. පන්කෝටිය ගන්නවා නම් ආයෝජන පොලී එන්නේ නෑ. බලාපොරොත්තු වෙන ආදායම් ලැබෙන්නේ නෑ. 62-11 යටතේ අනතුරු ගස් ආදායම ලක්ෂ 5 ක් දාලා. නමුත් එය උපකල්පනය කරන්නවත් පසුගිය වසරවල අනතුරු ගස් ආදායමක් දාලා නෑ. සුළු වශයෙන් හෝ ඒ තුලින් ලැබුණ ආදායමක් දාලා නෑ. 103 -2 කාර්යාලයේ කැබ් රථ වලට ලක්ෂ 30 ක් වෙන් කරලා. ඒ මුදල වැඩියි. ලක්ෂ 15 ක් ඇති. ලක්ෂ 5 ක් අඩු කල හැකියි. විදේශ ගමන් වලට ඒ මුදල මදි. නඩු වලට වැය වැඩියි. අඩුකරගත යුතුයි. අංක 05 පොදු මහජන උපයෝගිතා සේවා පරකඩුව සතිපොල බදු දීම හා කුරුවිට ආපණශාලාව බදු දීමෙන් යම් ආදායම් දාලා. තාම හදලා නැති ඒවායින් ආදායම් බලාපොරොත්තුවෙන්න බෑ. ඒවායේ කීමනි එකතු කල හැකියි. ඒක කරලා නෑ. මේ විධිහට ගත්තාම කෝටි දෙකක් විතර ඉතිරි කල හැකියි. නැවත කියනවා සංශෝධනය විය යුතුයි. මන්ත්‍රි එකඟතාවය අනුව ඡන්දය දෙන්න බැරි උනත් අපිට සහාය වෙන්න පුළුවන්. ඔබතුමන්ලාට මේ අයවැය ජයගත හැකියි. අපිට 19 යි. ඉන්නේ. මේ සභාවට අවිච්චින්න පැවැත්මක් තියෙනවා. අපි සභාවේ උන්නතිය බලනවා. අපි කණ්ඩායම සාමාන්‍ය යෙන් මාසෙට වතාවක් එකතු වෙනවා. අයවැයට විරුද්ධව ඡන්දය දෙන්න කිව්වා. නැත්නම් අපිට පක්ෂය තුලින් ගැටළු ඇති වෙනවා. මේ සභාව ඉදිරියට කරගෙන යාහැකියි. ඒ සඳහා ශක්තිය දහිරිය පතමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>

අපි නායකත්වය වෙනස් කරන්න උවමනාවක් නෑ. අපේ පොහොට්ටුවේ හයට සභාවක් කරන්න බෑ. විපක්ෂයට 26 ක් හිටියා. දේවින්ද මන්ත්‍රිතුමා ට නායකත්වය නොලැබුනාට පස්සේ අපි උත්සාහා කලේ නෑ. ඔබතුමාට සහාය දෙනවා ජනතාවට සේවය කරන්න. නමුත් මේ අයවැයට අපි ඡන්දය දුන්නත් නැතත් මේක දිනන්න පුළුවන්. ජීවිතේට මේ සභාවේ අයවැයකට විරුද්ධ වෙන්නේ ප්‍රථම වතාවට. පක්ෂ නිර්ණායක නිසා අපි හයදෙනා මේ අයවැයට විරුද්ධයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී.හරිසිංහ මහතා -</u>

පළාත්පාලන ඡන්දයට තරඟ වැදිලා අපි මේ සභාවට තේරි පත්වුණා. මේ පත්වීම සඳහා මට විශාල තරුණ පිරිසකගේ සහාය ලැබුණා. මම හිතන්නේ අපේ එකිනෙකාගේ මතය කුමක් උවත් දැන් අපි ජනතාවට, ගමට සේවය කළ යුතුයි. මම නවකයෙක්. මේ සභාව ඉදිරියට පැවතිය යුතුයි. මම තාම ඉතාම කෙටි කාලයයි මේ සභාවට ඇවිත්. තාම අධ්‍යයනය කරමින් ඉන්නේ. අපි දේශපාලන පක්ෂ වෙස් උනාට අපි හැමෝම එකතුවෙලා ගමට සේවය කල යුතුයි. ජනතාවට සේවය කල යුතුයි. ඒ නිසා දේශපාලනය නිසා මම බෙදෙන්නෑ. මම මේ අයවැයෙන් ජනතාවට සේවය කරන්න සහාය දෙනවා. ඒ සඳහා ශක්තිය දහිරිය පතනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒස්. චන්ද්‍රකුමාර් මහතා -</u>

මම අයවැයට විරුද්ධ උනාම පක්ෂයේ බලපෑම කියලා හිතයි. හේතුව මම විරුද්ධ දේශපාලනයක් කලේ නෑ. පක්ෂය මට කිව්වෙත් නෑ. ජනතාවට සහාය වෙන්න හැකි තීරණ ගන්න කිව්වා. වතු ජනතාවට හරිහමන් වැටුපක් නෑ. අධ්‍යාපනය, සෞඛ්‍ය, ඉන්න

**ඉඩමක් නෑ. සභාවෙන් මාර්ග, ප්‍රජාශාලා, පුස්තකාල වගේ දේ දෙන්න හැකියි. නමුත් ඒ දේවල් මේ අයවැයේ නෑ. 2026 අයවැයේ නෑ. ඒක ප්‍රශ්නයක්. ඒ වගේම මම අධිභාර වලට බයයි. මගේ ආර්ථික තත්වය අනුව මට පුද්ගලිකව වියදම් අධික අයෙක්. ඒ වගේම සමහර විට මෙතන ඉන්න හැමෝටම වඩා මගේ ආර්ථික මට්ටම පහල ඇති.අධිභාර වෙන්නත් හැකියාවක් මට නෑ. මෙතන ඉන්න 45 ටම මම කැමතියි. නයනා මන්ත්‍රීතුමිය අපේ ජනතාවට වැසිකිළි හදලා දෙනවා කිව්වා. හැමෝම හොඳයි. කිසිම තරහක් නෑ. මෙතන ඉන්න එකම දමිළ නියෝජිතයා මම. මගේ ඉල්ලීම් අනුව අපේ ජනතාවට මුදල් වෙන් කලොත් ගැටළු වෙන්න ඇති. ඒත් ගලුකාගම ජාතික ජනබලවේගය කොට්ඨාශ මන්ත්‍රීතුමා,**

**මගින් හරි අපේ ජනතාවට පහසුකම් සලසන්න. වත්තේ අයට උදව් කරන්න. මම ඉල්ලනවා. ගරු සභාපතිතුමා වත්තේ ජනතාවට වතුර පහසුකම් ගන්න උදව් කරනවා. ලක්ෂ දෙකහමාරටත් ස්තුතියි.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අපි සුහදව කටයුතු කරන්න සූදානම්. අයවැය යෝජනා අරගෙනයි කටයුතු කලේ. සමහර ඒවාට මුදල් වෙන් කරන්න බලාපොරොත්තු උන විදිහට බෑ. අයවැය කෙටුම්පත සැකසුවේ සියළුදෙනාගේ සහායෙන්. නමුත් යම් ආකාරයක විරෝධතා තියේනම් ඊට ඉඩ දෙනවා. අපි මතය විමසමු.

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් තමන්ද ඇතුලත්ව මෙදින මහා සභාවට රැස්ව සිටි සභිකවරුන් 46 වෙතින්, කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට අදාලව සකසන ලද අයවැය කෙටුම්පත සඳහා පක්ෂද විපක්ෂද යන්න නමින් නමට විමසා ඡන්දය සටහන් කරන ලෙස ලේකම්තුමාට දැනුම් දුණි.**
**ඒ අනුව ලේකම් වරයා විසින් නමින් නමට පක්ෂද ? විපක්ෂද ? ලෙස ඡන්දය විමසූ අතර කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට අදාලව සකසන ලද අයවැය කෙටුම්පත සඳහා පක්ෂව,**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ,** උප සභාපති අනිල් ජගත් කුමාර ලියනගේ මහතා , ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මල්කැකුල මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඒ. නයනා ජීවනී අතුකෝරළ මිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා , ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. මහින්ද ගුණසිංහ මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් පතිරණ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එල්. සුධීරා සේමිනි ලියනගේ මිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ජී. මහේෂ් නිරෝෂණ නාපාවල මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී ටී.එම්. උමේෂා මල්කාන්ති මිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී. ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ. දමින්ද නලින් අදිකාරම් මහතා , ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජේ.ටී. අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලා ශාන්ති මිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී. හරිසිංහ මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී . ජී.ඒ. සෂිකලා මදුභාෂිනී මිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී ආර්.එල්. නිරෝෂා මල්කාන්ති ලියනගේ මිය, ගරු ප්‍රාදේශිය

සභා මන්ත්‍රී කේ.වී.ආර්.ධර්මසිරි මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී. ජස්ටින් රණවීර මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.වී. මහින්ද මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්. සිසිර සේනාරත්න මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.කේ. දුමින්ද කසුන් අමරසිංහ මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය, යන මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රී තුමියන්ලා පක්ෂව ජන්ද 27 ක්ද

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට අදාලව සකසන ලද අයවැය කෙටුම්පත සඳහා විපක්ෂව,**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි. මංගල කිත්සිරි ඩයස් මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.වී. සුදර්ශන සම්පත් බොතේජු මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඒ. දේවින්ද කුමාර් මහතා,
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.ඒ. සිසිර ප්‍රියන් කැලුම් ශ්‍රී ධර්මදාස මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා , ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී කේ.කේ. දයාවතී මිය ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා, , ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. .ඊ.ඒ. රනිල් එදිරිසිංහ මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. රොෂාන් මධුසංක දේශප්‍රිය මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී . ජී. රංගනාත් ගහබඩගේ මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයන්ගනී විජේසිංහ මිය, ගරු ප්‍රාදේශිය සභාමන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී එම්.ඩී. ආශා සමන්කුමාරි මිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී එච්. තනුජා දීපානි චන්ද්‍රිකා මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඩග්ලස් ප්‍රේමදාස මයා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා යන මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රී තුමියන්ලා විපක්ෂව ජන්ද 19 ක්ද වශයෙන් තම මතය පළ කළහ.

**ඒ අනුව මෙදින මහා සභාවේ ගරු සභාපතිතුමා ඇතුළුව 46 ක් මහා සභාරැස්විමට සහභාගි වි සිටි අතර 2026 අයවැයට පක්ෂව ජන්ද 27 ක් හා විපක්ෂව ජන්ද 19 ක් ප්‍රකාශ වූ බැවින් වැඩි ජන්ද 08 කින් බහුතර මතයක් අයවැයට පක්ෂව හිමි වි තිබූ බවට සභාවේ ලේකම්වරයා විසින් ප්‍රකාශයට පත්කරන ලදී.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

වැඩි ජන්ද 08 කින් 2026 අයවැය සම්මත වෙනවා. අපි හැම විටම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියළු දෙනාට අවස්ථාව දෙනවා. ජනතාගේ කටයුතු වෙනුවෙන් සියළු දෙනා සහාය දෙන්න.

ඒ අනුව මහා සභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ බහුතර මතයෙන් සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව **කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට අදාලව සකසන ලද අයවැය කෙටුම්පත සඳහා අනුමැතිය ලබාදිම සම්බන්ධයෙන් මහා සභාවේ මත විමසුමක් සිදු කළ අතර එහිදී 2026 වර්ෂයට අදාලව**

**සකසන ලද අයවැය කෙටුම්පත සඳහා නමින් නමට සිදු කල මත විමසුමේ දී අයවැයට අනුමැතිය දීමට පක්ෂව ඡන්ද 27 ක්ද විපක්ෂව ඡන්ද 19 ක්ද හිමිවූ අතර පක්ෂව වැඩි ඡන්ද 08 ක බහුතර මතයෙන් කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට අදාලව සකසන ලද අයවැය කෙටුම්පත සඳහා අනුමැතිය ලබාදීමට මහා සභාවේ තීරණය විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 62. 2025 වර්ෂයට අදාලව කුරුවිට ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සමීක්ෂණ මණ්ඩලය පත්කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ සහ උප කාර්යාල තුනෙහි භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සමීක්ෂණ මණ්ඩලය ලෙස කටයුතු කිරීමට නිලධාරින්ගෙන් පහත පරිදි නිලධාරින් යොදවා ගැනීමට කටයුතු කරනවා. ඒ අනුව

**අධීක්ෂන කටයුතු (කාර්යාලය.කො.පා.ප)ජා සංවර්ධන නිලධාරිප්‍ර / විමර්ශන නිලධාරි -**

**ප්‍රධානකාර්යාලය -**

**පොහොරබාව කසල අංගනය/ආදාහනාගාරය/බන්ධනාගාරය/බෝපත්ඇල්ල/පුස්තකාලය/**

1. පී.එම්.ජේ.සල්මියා මිය- කළමනාකරණ සේවා නිලධාරි (සභාපති)
2. කේ.බී.පද්මිනී රාජපක්ෂ මිය- සංවර්ධන නිලධාරි
3. පී.එන්.සුභාෂිණි- සංවර්ධන නිලධාරි
4. එච්.එන්.සී.හිරිපිටිය මිය - සංවර්ධන නිලධාරි
5. වයි.සී.මිහිරාණි මිය- සංවර්ධන නිලධාරි
6. පී.එම්.එල්.සී.වැළිකුඹුර- සංවර්ධන නිලධාරි
7. අය.ආර්.ඩී.ආර්.ප්‍රියදර්ශනී මිය - සංවර්ධන නිලධාරි
8. බී.ඩබ්..ඒ.කේ.ජයලත් මිය - සංවර්ධන නිලධාරි

**එල්ලාවල උප කාර්යාලය ගිමන්හල/ස්ථානසායන මධ්‍ය/පුස්තකාලය/කාර්යාලය -**

1. එම්.එස්.කුමාර මයා - සංවර්ධන නිලධාරි
2. එම්.ඒ.එස්.ඩී.මඩවල මිය- සංවර්ධන නිලධාරි
3. ජී.ටී.සුරංගනී මිය - සංවර්ධන නිලධාරි
4. කේ.ඩබ්.සී.සූරියකුමාර - කළමනාකරණ සේවා නිලධාරි
5. ඩබ්.පී.චන්දිමාලි මිය - සංවර්ධන නිලධාරි
6. කේ.එන්.සී ජයතුංග මිය - සංවර්ධන නිලධාරි

**කිරිඇල්ල උප කාර්යාලය පෙර පාසල/ආයුර්වේදය/පුස්තකාලය/කාර්යාලය -**

1. ඩබ්සංවර්ධන නිලධාරි - මල්කාන්ති මෙනවිය.ඩී.ඩී.ඒ.
2. පීකළුආරච්චි.කේ.යූ.ඒ.ජී. මියසංවර්ධන නිලධාරි -
3. ඒවාසනා.එන්. මියසංවර්ධන නිලධාරි -
4. වයිසුභාෂිණී.එල්. මෙයසංවර්ධන නිලධාරි -
5. යූසංවර්ධන නිලධාරි -විජේතිලක මිය.ටී.එන්.පී.

**දොඩම්පේ උප කාර්යාලය පුස්තකාලය/කාර්යාලය -**

01. ඒ - ගුණදාස මිය.පී.වයි.ආර්.සංවර්ධන නිලධාරි
02. නිශාන්ති සෙනරත් මිය - වැඩසටහන් සහකාර
03. කේකළමනාකරණ සේවා නිලධාරි -කරුණාසේන මිය.සී.ජී.
04. මහේෂ් වීරවර්ධන කළමනාකරණ සේවා නිලධාරි -

මෙම සමික්ෂණ කටයුතු සඳහා ගරු සභික වරුන්ගෙන් පහත පරිදි පත්කරමු.

**ප්‍රධාන කාර්යාලයේ 2025 භාණ්ඩ සමීක්ෂන මණ්ඩලයේ සාමාජිකයින් ලෙස කටයුතු කිරිමට මෙම සභාවේ සභිකවරුන් වශයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මූණසිංහ මහතාව පත්කිරිමටද**

**නාමල්දෙනිය උප කාර්යාලයේ 2025 භාණ්ඩ සමීක්ෂන මණ්ඩලයේ සාමාජිකයින් ලෙස කටයුතු කිරිමට මෙම සභාවේ සභිකවරුන් වශයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණි මිය මිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී තනුජා දීපානි චන්දිකා මිය පත්කිරිමටද**

**කිරිඇල්ල උප කාර්යාලයේ 2025 භාණ්ඩ සමීක්ෂන මණ්ඩලයේ සාමාජිකයින් ලෙස කටයුතු කිරිමට මෙම සභාවේ සභිකවරුන් වශයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා පත් කිරිමටද**

**දොඩම්පෙ උප කාර්යාලයේ 2025 භාණ්ඩ සමීක්ෂන මණ්ඩලයේ සාමාජිකයින් ලෙස කටයුතු කිරිමට මෙම සභාවේ සභිකවරුන් වශයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. වී. මහින්ද මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් කීර්ති මහතා පත් කිරිමද සුදුසුයි. ඒ අනුව මෙම නිලධාරින් හා සභිකතුමන්ලා තුමියන්ලා භාන්ඩ සමික්ෂන මන්ඩලය ලෙස කටයුතු කරමු.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව **2025** වර්ෂයට අදාලව **කුරුවිට ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ සමික්ෂණ කටයුතු සඳහා සමීක්ෂණ මණ්ඩලය පත්කිරිමට හා ඒ සඳහා ඉහත නම් සඳහන් පරිදි නිලධාරින් හා ගරු සභිකවරුන් යොදවා** ගැනීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 63. කුරුවිට ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීතුමන් හා තුමියන්, සියළු නිලධාරින් සඳහා නීති, අණපනත් හා ආකල්ප වර්ධනය සම්බන්ධ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම සම්බන්ධව මහා සභාවේ අනුමැතියක් ලබා ගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි. මෙවර විදේශ පුහුණුවීම් වලට යන්න බෑ. ලංකාවේ පුහුණුවීමක් කරමු ගුණාත්මකව. පුහුණුවට දින 03 ක් යනවා. පුහුණු මධ්‍යස්ථාන සේරම වගේ වෙන් කරලා. ගිය වතාවේ අපි ගියේ පස්සර. කලා වැව. ඒකත් බුක් වෙලා. නුවරඑලියේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුහුණු ශාලාව දෙන්නම් කිව්වා. නමුත් ඒ අයගේ හොටෙල් ගන්න වෙනවා නවතින්න. නුවරඑලියේ සමෘර්ධි එකටත් කතා කලා. සඳතැන්න සණස මගින් කරන එකක් තියෙනවා. ඒක ලෙෂර් විලේජ් කියලා පාත් පවුන්ඩේෂන් එකෙන් කරන්නේ.
ලක්ෂ 08ක් විතර වියදම වෙනවා. මේ පළාතේ පුහුණුවක් තියලා සාර්ථක වෙන්නේ නෑ. සියළු දෙනා පුහුණුවේ රැඳී සිටින්නේ නෑ. සුදුසු වෙන්නේ පළාතෙන් පිටත තියන එකයි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

සුදුසු සම්පත් දායකයෙක් යොමු කරගමු. මේ සම්බන්ධව ඉදිරි කටයුතු කරමු. වියදම් ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන්න.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව **කුරුවිට ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීතුමන් හා සියළු නිලධාරින් සඳහා නීති, අණපනත් හා ආකල්ප වර්ධනය සම්බන්ධ පුහුණු වැඩමුළුවක් සුදුසු ස්ථානයකදී දී පැවැත්වීමටත් ඒ සඳහා වියදම් ඇස්තමේන්තුව සකසා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ තීරණය අනුව වැයබර දැරීමටත් ඉදිරි කටයුතු සිදු කිරිමටත්** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 64. නැණසල තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානයේ පුහුණුව ලබා ඇති එල්. කේ.ජී.කමණී ක්‍රිෂ්නා මදුරසිංහ මෙය හට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මාස 06 ක ප්‍රායෝගික පරිසනක රැකියා පුහුණුවක් ලබාදීම සම්බන්ධයෙන් සභා තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

04 / 2017 (ii ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව මෙම පුහුණු මාස 06 කාල සීමාව තුළපැමිණි දිනකට රු. 1000.00 ක ගෙවීමක් සිදුකිරීමට හැකි අතර මෙම සභාවේ 2025 වර්ෂයේ 101-09-11 හි අන්තර් දීමනා වැයශීර්ෂයේ ඒ සඳහා ප්‍රමාණවත් මුදල් පවතින බවට වාර්තා ඉදිරිපත් කර තිබෙනවා.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **නැණසල තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානයේ පුහුණුව ලබා ඇති එල්. කේ.ජී.කමණී ක්‍රිෂ්නා මදුරසිංහ මෙය හට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මාස 06 ක ප්‍රායෝගික පරිසනක රැකියා පුහුණුවක් ලබාදීමට හා චක්‍රලේඛ** අනුව ගෙවීම් කිරිමටද මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 65. අංක 36920 ඉඩම් හා තහනම් නඩුව සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ පිහිටුවා ඇති කඩ ගැටළු විසඳීම සම්බන්ධ කමිටුවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට මහා සභාවේ අනුමැතියක් ලබාදීම සම්බන්ධව තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**කමිටුවට දාලා ඒ වාර්තාව සභාවට දාමු. කමිටුවට දිනයක් අරන් කමිටුව පවත්වමු.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව_**අංක 36920 ඉඩම් හා තහනම් නඩුව සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ පිහිටුවා ඇති කඩ ගැටළු විසඳීම සම්බන්ධ කමිටුවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට මහා සභාවේ**
ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 66. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කිරිඇල්ල පෙරපාසැලේ දරුවන්ගේ 2025 වාර්ෂික විවිධප්‍රසංගය සඳහා ඉදිරිපත්වන දරුවන් 58 ක් සඳහා ත්‍යාග ලබාදීමට මහා සභාවේ අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**දරුවන් 58 ක් සඳහා එක් අයෙකුට රු. 500.00 ක ත්‍යාගයක් වන පරිදි ලබා දෙමු. ඒ සඳහා සුබ සාධක ගෙවීම් වැය ශීර්ෂයේ ප්‍රමාණවත් මුදල් පවතින බව දන්වා ඇත.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කිරිඇල්ල පෙරපාසැලේ දරුවන්ගේ 2025 වාර්ෂික විවිධප්‍රසංගය සඳහා ඉදිරිපත්වන දරුවන් 58 ක් සඳහා එක් අයෙකුට රු. 500.00 ක ත්‍යාගයක් වන පරිදි ත්‍යාග** ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 67. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල 4 ට 2026 වසර සඳහා අවශ්‍ය පුවත්පත් මිලදී ගැනීමට මහා සභාවේ අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
පුස්තකාල සඳහා පුවත් පත් අවශ්‍ය වන ආකාරය සඳහන් කර තිබෙනවා. ඒ අනුව කුරුවිට මහජන පුස්තකාලය සඳහා දෛනික ව දිවයින, දිනමිණ, ඩේලි නිව්ස් යන පුවත් පත්ද සති අන්ත ඉරිදා දින ඉරිදා සිළුමිණ, ඉරිදා මව්බිම, Sunday Observer ,ලංකාදීප,ඩේලි නිව්ස් යන පුවත්පත්ද ළමා පුවත් පත් ලෙස විදුසර හා විජය පුවත්පතද කාන්තා පුවත් පත් ලෙස සිරිකත පුවත්පතද සඟරා ලෙස පරිසනක යන සඟරාවද

කිරිඇල්ල මහජන පුස්තකාලය සඳහා දෛනික ව දිනමිණ, ලංකාදීප යන පුවත් පත්ද සති අන්ත ඉරිදා දින ඉරිදා සිළුමිණ, ඉරිදා මව්බිම, යන පුවත්පත්ද ළමා පුවත් පත් ලෙස විජය පුවත්පතද කාන්තා පුවත් පත් ලෙස සිරිකත පුවත්පතද සඟරා ලෙස පරිසනක,තක්සලාව, මැහුම් යන සඟරාද

නාමල්දෙනිය මහජන පුස්තකාලය සඳහා දෛනික ව දිනමිණ, දිවයින,ඩේලිනිව්ස් යන පුවත් පත්ද සති අන්ත ඉරිදා දින ඉරිදා සිළුමිණ, ඉරිදා දිවයින, Sunday Observer ,ඩේලි නිව්ස් යන පුවත්පත්ද ළමා පුවත් පත් ලෙස විජය පුවත්පතද කාන්තා පුවත් පත් ලෙස සිරිකත පුවත්පතද සඟරා ලෙස පරිසනක යන සඟරාවද

දොඩම්පෙ මහජන පුස්තකාලය සඳහා දෛනික ව දිනමිණ, ලංකාදීප යන පුවත් පත්ද සති අන්ත ඉරිදා දින ඉරිදා සිළුමිණ, ඉරිදා දිවයින, යන පුවත්පත්ද ළමා පුවත් පත් ලෙස විජය පුවත්පතද කාන්තා පුවත් පත් ලෙස සිරිකත පුවත්පතද සභා අනුමැතියට ඉදිරිපත්කර තියෙනවා. ඒ අනුව එම පුවත්පත් මිලදී ගමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල 4 ට 2026 වසර සඳහා අවශ්‍ය පුවත්පත් මිලදී ගැනීම සම්බන්ධයෙන්** කුරුවිට මහජන පුස්තකාලය සඳහා දෛනික ව දිවයින, දිනමිණ, ඩේලි නිව්ස් යන පුවත් පත්‍ද සති අන්ත ඉරිදා දින ඉරිදා සිළුමිණ, ඉරිදා මව්බිම, Sunday Observer ,ලංකාදීප, ඩේලි නිව්ස් යන පුවත්පත්‍ද ළමා පුවත් පත් ලෙස විදුසර හා විජය පුවත්පතද කාන්තා පුවත් පත් ලෙස සිරිකත පුවත්පතද සඟරා ලෙස පරිසනක යන සඟරාව ද කිරිඇල්ල මහජන පුස්තකාලය සඳහා දෛනික ව දිනමිණ, ලංකාදීප යන පුවත් පත්‍ද සති අන්ත ඉරිදා දින ඉරිදා සිළුමිණ, ඉරිදා මව්බිම, යන පුවත්පත්‍ද ළමා පුවත් පත් ලෙස විජය පුවත්පතද කාන්තා පුවත් පත් ලෙස සිරිකත පුවත්පතද සඟරා ලෙස පරිසනක, තක්සලාව, මැහුම් යන සඟරාද නාමල්දෙනිය මහජන පුස්තකාලය සඳහා දෛනික ව දිනමිණ, දිවයින, ඩේලිනිව්ස් යන පුවත් පත්‍ද සති අන්ත ඉරිදා දින ඉරිදා සිළුමිණ, ඉරිදා දිවයින, Sunday Observer , ඩේලි නිව්ස් යන පුවත්පත්‍ද ළමා පුවත් පත් ලෙස විජය පුවත්පතද කාන්තා පුවත් පත් ලෙස සිරිකත පුවත්පතද සඟරා ලෙස පරිසනක යන සඟරාවද දොඩම්පෙ මහජන පුස්තකාලය සඳහා දෛනික ව දිනමිණ, ලංකාදීප යන පුවත් පත්‍ද සති අන්ත ඉරිදා දින ඉරිදා සිළුමිණ, ඉරිදා දිවයින, යන පුවත්පත්‍ද ළමා පුවත් පත් ලෙස විජය පුවත්පතද කාන්තා පුවත් පත් ලෙස සිරිකත පුවත්පතද මිලදිගැනීමට ද මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 68. පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධනය පිලිබඳ ඩිප්ලෝමාව ලබා ඇති යූ.ආර්. ඉමාෂා සිතුමිණි ශිෂ්‍යාව ට කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කිරිඇල්ල පෙරපාසැලේ මාස 06 ක ප්‍රායෝගික ගුරු පුහුණුවක් ලබාදිම සම්බන්ධව තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

දීමනා ගෙවීම් රහිතව පුහුණුව ලබාගැනීමට අවස්ථාව සලසමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධනය පිලිබඳ ඩිප්ලෝමාව ලබා ඇති යූ.ආර්. ඉමාෂා සිතුමිණි ශිෂ්‍යාව ට කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කිරිඇල්ල පෙරපාසැලේ දීමනා රහිතව මාස 06 ක ප්‍රායෝගික ගුරු පුහුණුවක් ලබාදිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06 – 69.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ නව විශේෂ දේපළ තක්සේරුවට අදාල තක්සේරු **ගාස්තු ගෙවීම් කිරිම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ නව විශේෂ දේපළ තක්සේරුවට අදාල තක්සේරු ගාස්තු ලෙස රු. 450,245.00 ක මුදල ගෙවීම් කරන ලෙස 2025.11.15 දිනැතිව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දන්වා තිබෙනවා. ඒ අනුව ගෙවීම් කරමු.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **කුරුවිට ප්‍රාදේශීය සභාවේ නව විශේෂ දේපළ තක්සේරුවට අදාල තක්සේරු ගාස්තු ගෙවීම් කිරිම ට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 70. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් නොදිරන කසළ අංගනයේ කටයුතු සඳහා තෙකලා විදුලිය ලබාදිම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
ඒ ස්ථානයේ තෙකලා විදුලිය ලබාගැනීම ඉදිරියෙදී ප්‍රයෝජනවත්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-</u>
ත්‍රි ෆේස් විදුලිය අරන් වසර දෙක තුනක් නිකම් තුබුනොත් විදුලිය බිල වැඩිවෙලා අපි නිකං බිලක් ගෙවනවා වෙයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නලින් දමින්ද අධිකාරම් මහතා-</u>
නිකරුනේ තිබුනොත් අපරාදේ. බේල් යන්ත්‍රය මේ ස්ථානයේ ක්‍රියාත්මක කරමු. ජනවාරි ඉඳලා මෙතනම බේල් කරන්න පුළුවන්.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
යන්ත්‍රය මේ ස්ථානයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරලා තියෙන්නේ. මේවන විට එම ස්ථානයේ අලෙවි කල හැකි නොදිරණ කසළ අලෙවි කරනවා.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් නොදිරන කසළ අංගනයේ කටයුතු සඳහා තෙකලා විදුලිය ලබාගැනිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-71.** **වළදූර කසළ කළමණාකරන තනිමහල් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරනය හා පුළුල් කිරිමට අදාලව පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියට අනුව වැඩ අවසන් බිල්පත ගෙවිම සම්බන්ධයෙන් මහා සභා තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය  සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**වළදූර කසළ කළමණාකරන තනිමහල් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරනය හා පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ අවසන්බිල්පත යොමුකර තියෙනවා. මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශද සහිත ලිපිය අනුව ගෙවීම් සම්බන්ධව තීරණයක් ගත යුතුයි. මේ සම්බන්ධව කාරක සභා අවස්ථාවක් අරන් සාකච්ජා කිරිම අවශ්‍යවන්නේනම් එසේ කරමු.**

**මෙම අවස්ථාවේදි වළදූර කසළ කළමණාකරන තනිමහල් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරනය හා පුළුල් කිරිමට අදාලව පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියට අනුව වැඩ අවසන් බිල්පත ගෙවිම සම්බන්ධයෙන් සාකච්ජා කරගැනීමට මහා සභාව කාරක සභාවක් බවට පත්වන ලෙස ගරු ප්‍රාදේශීය  සභා උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

ඒ අනුව කාරක සභා අවස්ථාවේදී ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් මෙම ව්‍යාපෘතියේ වැඩිදියුණු කිරීමට අදාල ගොඩනැගිල්ල පුළුල් කිරිම සම්බන්ධව තොරතුරු ඉදිරිපත්කරන ලදි. ඒ අනුව 2023.10.03 දින මෙම සභා ප්‍රෙද්ශයේ කසළ කළමනාකරනය පිලිබඳව කුරුවිට ප්‍රාදේශීය  සභාවේ රැස්වීම් ශාලාවේදී  පළාත් පාලන සහකාරකොමසාරිස්වරයාගේ මූලිකත්වයෙන් යුතුව  පැවති රැස්වීමේදී ගත් තීරණයක් අනුව මෙම කටයුතු ආරම්භ කර ඇති බවත් මෙම රැස්වීමට සභාවේ ලේකම්, ප්‍රාදේශීය ලේකම් කුරුවිට, මධ්‍යම පරිසර අධිකාරිය, කාර්මික නිලධාරී , සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කුරුවිට, වෙළඳ සංගම්  නියෝජිත වරු, බන්ධනාගාරය, ආදී ආයතන වල නියෝජිතයින් සහභාගී වී ඇත. එහිදි ගත් තීන්දු තීරණ අතර වලදූර බන්ධනාගාරයේ කසළ ව්‍යාපෘතිය වැඩිදියුණු කිරිම හා ඒ සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනාවක් පළාත් පාලන ඉංජිනේරුවරයාගේ උපදෙස් පරිදි සකස්කර කඩිනමින් ඉදිරිපත් කිරීමටද ගත් තීරණය අනුව මෙම කටයුත්ත ආරම්භ කර ඇත.
ඒ අනුව අදාළ ව්‍යාපෘති යෝජනාව සකසා ඇති අතර 2023.10.12 දිනැති අංක 01 යටතේ වන ලේකම් තීරණයක් ගෙන ඇති අතර  දැනට කුරුවිට **ප්‍රාදේශීය සභාව මගින් කසළ කළමණාකරණය සඳහා භාවිතා කරනු ලබන පොහොරබාව කසළ අංගනයෙ ඉඩකඩ උපරිම ධාරිතාවයෙන් යුක්තව භාවිතා කර ඇති බැවින් හා තව දුරටත් එම ස්ථානයට කසළ බැහැරකිරිම පාර්ශවයන් ගනනාවකට ගැටළු රාශියක් ඇති කරන බැවින් එම ගැටළුවට විසඳුමක් ලෙස මෙම වළඳුර පොහොර ව්‍යාපෘතියේ ගොඩනැගිල්ල**

ප්‍රතිසංස්කරණය කිරීම සිදුකිරිම පිලිබඳ නිර්දේශ දී ඇත. 2023.11.09 දිනැති ලිපියෙන් මෙම ව්‍යාපෘතිය සහා අරමුදල් යොදවා සිදුකිරිමට එනම් රු. 14,912,993.95 ක මුදල වැයබර දැරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබාදුන් බවට පළාත් පාලන කොමසාරිස් විසින් දැනුම් දී ඇත. පසුව තාක්ෂන ඇගයීම් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවට ප්‍රධාන ඉංජිනේරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන ඉංජිනේරු, ප්‍රධාන අමාත්‍යංශයේ ගණකාධිකාරී, ප්‍රමාණ සමීක්ෂන නිලධාරී, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ තාක්ෂන නිලධාරී ඇතුලත්ව ඇති අතර එමගින් ටෙන්ඩර්පත් ඇගයීම සිදුකර ඇත. 2023.12.29 දිණමිණ පුවත් පත හි ප්‍රසම්පාදන දැන්වීම පළකර අදාල ක්‍රමවේදය අනුව එල්.පී. කන්ස්ට්‍රක්ෂන් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බවත් සඳහන් කරන ලදී. මෙම අවස්ථාවේදි ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. කේ. විජේසිරි මහතා අදහස් දක්වමින් පොහොරබාව ඉඩමේ හතරෙන් එකක ප්‍රමාණයක්වත් කසළ සඳහා යෙදවා නොමැති බවත් මෙය මෙම කටයුත්ත පිලිබඳව නොමහයැවීමක් හේතුවෙන් සිදුවී ඇති බවත් ආණ්ඩුකාරතුමාටද අසත්‍ය කරුණු දක්වා ඇති බවත් දන්වන ලදි.** එසේම ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා අදහස් දක්වමින් නිලධාරින්ද නොමග යවා ඇති බවත් විමර්ශනයක් අවශ්‍ය බවත් වලදූර බන්ධනාගාරය සමග ඇති කරගත් ගිවිසුමේ බන්ධනාගාර අධිකාරිට ගිවිසුම්ගත විමට ඇති හැකියාව පිලිබඳව ගැටළු සහගත බවත් පැරණි ගොඩනැගිල්ල නඩා වෙන ගොඩනැගිලලක් සකසා ඇති අතර ලක්ෂ 19 ක් පමන ගෙවීම් කර ඇති ඒ පිලිබඳවද සෙයාබලන ලෙසත් දන්වන ලදි.** ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා අදහස් දක්වමින් මෙම ඉඩම පිලිබඳව සභාවට ඔප්පුවක් නොමැති අතර ගිවිසුමක් පමනක් ඇති අතර එහිද කාලයක් සඳහන් කර නොමැති බවත් බන්ධනාගාර අධිකාරීට මෙවැනි කටයුත්තකට අවසර දීමට බලයක් ඇත්ද යන්න ගැටළු බවත් සඳහන් කරන ලදි.** ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් අදහස් දක්වමින් ඉදිරියේදී එම ඉඩම හා ව්‍යාපෘතියට ප්‍රවේශ වන මාර්ගය සභාවට පවරාගැනීමට ඇති හැකියාව සොයා බැලීමටත් කටයුතු කරන බවත් මෙම කොන්ත්‍රාත්තුව සිදුකල කොන්ත්‍රාත්කරු හට මෙම සේවාව සපයා ඇති බැවින් ගෙවීම සිදුකල යුතු වන බවත් සඳහන් කරන ලදි. දීර්ඝ ලෙස මෙම කමිටු සාකච්චාව පැවති අතර කාරක සභාව මහා සභාව බවට පත්විමට ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. කේ. විජේසිරි මහතා විසින් ස්ථිර කරන ලදී.**

ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -**

මෙම කටයුත්තේදි නොමග යැවීම් සිදුවෙලා. අක්කර ගානක කසළ දමලා කියන කතාව බොරු. එම ස්ථානයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න බැරි බවයි අඟවලා තියෙන්නේ. සියළු නිලධාරීන් ගෙන්නලා නොමඟ යවලා. බන්ධනාගාරයේ මාර්ග වල යන්නවත් එපා කිව්වොත් සේරම ගැටළු. ඒ මාර්ග එක්කම පවරා ගන්න වෙනවා. මාස දෙක තුනක් ඇතුලත කල යුතුයි.

ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -**

2006 වසරෙදි ගිවිසුමක් අත්සන් කරලා හලර් යන්ත්‍රයක් සවිකලා. මේකත් ඒ ගිවිසුමට අනුගතවයි කරලා ඇත්තේ. 2006 වසරෙදි නම් ඒ කටයුත්ත නිසිපරිදි කලා. මේ වියදමට යෝජනා වලට මන්ත්‍රිලා නම් අදාල නෑ. ඒ නිසා යම් අඩිහාරයක් උනොත් සඳහන් කරලා තියෙන නිලධාරීන්ට ගෙවන්න කියන්න. කොන්ත්‍රාත්කරුට මේකට වගකියන්න බෑ. පොදු 35 අත්සන්කරලා බිල් ඉදිරිපත්කරලා ඇති. මේ මුදල දින 90 ක් ඇතුලත නොගෙව්වොත් නීතිමය පියවර ගන්න පුළුවන්. බැංකු පොලී ආදිය පිලිබඳව ප්‍රශ්න එනවා. දින 90 ත් ඉවර

ඇති. නීතිමය පියවර ගත්තොත් ඒකත් ගෙවන්න වෙන්නේ හැමෝටම. ඒකෙන් මාව නිදහස් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා -</u>

යම් වැරැද්දක් සිදුවී ඇත්නම් නීත්‍යානුකූලව කමිටුවක් පත් කරලා සොයාබලමු. එතෙක් මේ මේ මුදල නීත්‍යානුකූලව ගෙවමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

ගැටළු තියෙනවා. මේ කමිටුව රැස්කරන්නේ ලේකම්. මෙතන ඉන්නවා පොහොරබාව මන්ත්‍රීවරු දෙපලක්. ඒ අයත් එකඟයි මේ ඉඩමේ හතරෙන් එකක්වත් කසළ පිරිලා නෑ කියලා. මේ වලදූරේ ව්‍යාපෘතියේ හදපු පරණ ගොඩනැගිල්ලේ වයර් ටික නෑ. 19 ලක්ෂෙ ගොඩනැගිල්ලට අර කඩපු එකේ බඩු අරන්. අපිට අත උස්සන්න බෑ. ආණ්ඩුකාරතුමාත් කොමසාරිස් තුමාත් මේ ගෙවිම් සම්බන්ධව බලා ගනියි. වයර් ටිකත් නෑ කිව්වා. අපි විරුද්ධයි. සාධාරණ සැකයක් තියෙනවා. මේ ගැන විමර්ශනය කලේ නැද්ද? අධිහාර ගෙවන්න බෑ. අපිව නිදහස් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

සභාවේ 46 ම නිදහස් කරන්න. කොමසාරිස් පාලනය යටතේ කල කටයුත්තක් නිසා ඒ අනුමැතිවලින් ගෙවීම් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -</u>

අනුමැතිය දුන්න අය ගෙන්ම විමර්ශන කටයුතු කලොත් විමර්ශනය කරන්න එපා කියයි. ඒ නිසා බාහිර විගණනයක් කරන්න. අපරාධ වංචා විමර්ශන හෝ වෙනත් ඕඩිට් ආයතනයකට දෙමු.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

විගනනයක් කිරිම පිලිබඳව ඉල්ලීමක් කරමු. වැඩ අවසන් බිල්පත ගෙවමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව **අනුව වළදූර කසළ කළමණාකරන තනිමහල් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරනය හා පුළුල් කිරිමට අදාල පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියට අනුව වැඩ අවසන් බිල්පත ගෙවිම් කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 72. මලව, උක්වත්ත මාර්ගය සංවර්ධනය කිරිම (ඉතිරි කොටස) වැඩ අවසන් බිල්පත රු. 475,000.00 ක් ගෙවීම සම්බන්ධව මහා සභා තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා-**</u>

**ටෙස්ටිං ගල් (තත්ව පරික්ෂණ ගල් ) අයින් කරා කිව්වා. මේ ස්ථානය වෙනත් කාර්මික නිලධාරියෙක්ද කලේ ?. ටෙස්ටිං ගල් අයින් කලා කිව්වා. ඒක හරිද? තනිකර මඩපස් දාලා හැදුවේ.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**ටෙස්ටිං රිපෝට් තියෙනවා. ගැටළු නෑ. ඒකට අදාල ඉංජිනේරු වාර්තා තියෙනවා. ව්‍යාපෘති දෙකේම වාර්තා තියෙනවා. ඒ නියැදි වල ගැටළු නැති බව වාර්තා මගින් තහවුරු කරලා.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **මලව, උක්වත්ත මාර්ගය සංවර්ධනය කිරිම (ඉතිරි කොටස) වැඩ අවසන් බිල්පත ලෙස රු. 475,000. 00 ක් ගෙවීම් කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 73. කුරුවිට පැරඩයිස් රණවිරුගම මාර්ගය සංවර්ධනය කිරිම ( ඉතිරි කොටස) වැඩ අවසන් බිල්පත රු. 725,000.00 ක් ගෙවීම සම්බන්ධව මහා සභා තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි. මේ ව්‍යාපෘති පරීක්ෂාවට **අදාල ඉංජිනේරු වාර්තා තියෙනවා. ව්‍යාපෘති දෙකේම වාර්තා අනුව නියැදි වල ගැටළු නැති බව වාර්තා මගින් තහවුරු කරලා. අපිට ඒ ඉංජිනේරු නිර්දේශ එක්ක ආගිව් කරන්න බෑ. ඒ කටයුතු වල බලය තියෙන්නේ ඒ ආයතනයටයි. ඊට එහා බලයක් ඒ ගැන අපිට නෑ. ලබාදී ඇති වාර්තා පිලිගන්න වෙනවා.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **කුරුවිට පැරඩයිස් රණවිරුගම මාර්ගය සංවර්ධනය කිරිම ( ඉතිරි කොටස) වැඩ අවසන් බිල්පත සඳහා රු. 725,000.00 ක් ගෙවීම් කිරිමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 74. කිරිඇල්ල ඉඩංගොඩ නාරංගස්හේන තුංමන්සන්ධියේ සිට ඉදිරියට මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරිම සඳහා වන රු. 1000000.00 ඇස්තමේන්තුව සඳහා මහා සභා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **කිරිඇල්ල ඉඩංගොඩ නාරංගස්හේන තුංමන්සන්ධියේ සිට ඉදිරියට මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරිම**

**සඳහා වන රු. 1000000.00 ඇස්තමේන්තුව සඳහා මහා සභා අනුමැතිය ලබාදීම** ට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 75. එරත්න ශ්‍රීපාද මාර්ගය සුද්ධ කර ප්‍රතිසංස්කරණය කිරිම - 2025 සඳහා වන රු. 610000.00 ක ඇස්තමේන්තුව ( Cleaning and Repairing Adams Peak Erathna Road (mini Hydro Project Road ) Kakunahena Warnagala Ambalama to Galwangediya Ambalama Road) සඳහා මහා සභා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **එරත්න ශ්‍රීපාද මාර්ගය සුද්ධ කර ප්‍රතිසංස්කරණය කිරිම - 2025 සඳහා වන රු. 610000.00 ක ඇස්තමේන්තුව ( Cleaning and Repairing Adams Peak Erathna Road (mini Hydro Project Road ) Kakunahena Warnagala Ambalama to Galwangediya Ambalama Road) සඳහා මහා සභා අනුමැතිය ලබාදීම** ට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06 -76. විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන කොස්ගොඩ බටුහේනවත්ත පළුදු කරන ලද මාර්ගය අළුත්වැඩියා කිරිම සඳහා වන රු. 666000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන කොස්ගොඩ බටුහේනවත්ත පළුදු කරන ලද මාර්ගය අළුත්වැඩියා කිරිම සඳහා වන රු. 666000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06 - 77. විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන පුස්සැල්ල අභය පෙදෙස මාර්ගය හා උඩගලහේන පළුදු කරන ලද මාර්ග අළුත්වැඩියා කිරිම සඳහා වන රු.320000.00**

**ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන පුස්සැල්ල අභය පෙදෙස මාර්ගය හා උඩගලහේන පළුදු කරන ලද මාර්ග අළුත්වැඩියා කිරිම සඳහා වන රු.320000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම** ට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-78. විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන තිරිවාන පේරගස්වත්ත පළුදු කරන ලද මාර්ගය අළුත්වැඩියා කිරිම සඳහා වන රු.1227000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන තිරිවාන පේරගස්වත්ත පළුදු කරන ලද මාර්ගය අළුත්වැඩියා කිරිම සඳහා වන රු.1227000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම** ට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-79. විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන මෙනේරිපිටිය ඇතුල්මාර්ගය පළුදු කරන ලද මාර්ගය අළුත්වැඩියා කිරිම සඳහා වන රු.280000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන මෙනේරිපිටිය ඇතුල්මාර්ගය පළුදු කරන ලද මාර්ගය අළුත්වැඩියා කිරිම සඳහා වන රු.280000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම** ට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06 – 80. විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන තිරිවාන ගල්ගොඩවත්ත පළුදු කරන ලද මාර්ගය අළුත්වැඩියා කිරිම සඳහා වන රු.1045000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **විසල් ජල ව්‍යාපෘතිය යටතේ වන තිරිවාන ගල්ගොඩවත්ත පළුදු කරන ලද මාර්ගය අළුත්වැඩියා කිරිම සඳහා වන රු.1045000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>

**06- 81. බැවිල සමගිපුර මාර්ගයේ විපුල අධිකාරී ගේ නිවස අසල පාර නායගොස් ඇති ස්ථානයට පැති බැම්ම දැමීම සඳහා වන ලක්ෂ 04 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **බැවිල සමගිපුර මාර්ගයේ විපුල අධිකාරී ගේ නිවස අසල පාර නායගොස් ඇති ස්ථානයට පැති බැම්ම දැමීම සඳහා වන ලක්ෂ 04 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට** මහාසභාවේ ඒකමතිකව තීරණය විය.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>

**06- 82. 128 /සී මෙනේරිපිටිය වසම පොල්කොටුව මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරිමසඳහා වන රු.250000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා)**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**ගරු ප්‍රාසම රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා -</u>

**127 /සී මෙනේරිපිටිය වසම ලෙස නිවැරදි විය යුතුයි.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා විසින් ඉදිරිපත් කර ඇති 127 /සී මෙනේරිපිටිය වසම පොල්කොටුව මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරිම සඳහා වන රු.250000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 83. ප්‍රාදේශිය සභාව සතු පුස්සැල්ල මාතෘ සායනයේ ගැබිනි මව්වරුන්ගේ පහසුව සඳහා ස්ථානයක් සැකසීම හා පුටු ලබාදීම සඳහා වන රු. 350000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම මංගල ඩයස් මහතා)**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුධීරා සේමිණි මිය -</u>

**මේ ස්ථානයට අවශ්‍ය පහසුකම් තියෙනවා. තව දුරටත් ග්‍රාමසංවර්ධන සමිතියෙන් ලක්ෂයක් විතර දාලා හාමුදරුවොත් එක්ක එකතු වෙලා මුදල් දාලා අවශයතා හදනවා. මේ ස්ථානයට තවත් දෙනවාට විරුද්ධ නෑ. නමුත් ඊට වඩා අවශ්‍ය ස්ථාන ඇති.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

**ඒ ස්ථානයට එන මාතෘවරු එලියේ ඉන්නේ. හට් එකක් ගහලා දෙන්නේ . ඉතුරු උනොත් පුටු දෙනවා. මේක සභාවේ දේපළක්.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රාදේශිය සභාව සතු පුස්සැල්ල මාතෘ සායනයේ ගැබිනි මව්වරුන්ගේ පහසුව සඳහා ස්ථානයක් සැකසීම හා පුටු**

**ලබාදීම සඳහා වන රු. 350000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 84. අම්බුළුව පන්දෙනිය මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය ලබාදිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රා. සම රනිල් එදිරිසිංහ මහතා)**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති අම්බුළුව පන්දෙනිය මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය ලබාදිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා ප්‍රාදේශිය සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 85.ගෝනපිටිය මහින්දාරාම පන්සල දෙසට පාර බෝක්කුවේ පැතිබැම්ම ඉදිකිරීම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම ඉරෝෂා විජේසිංහ මිය )**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා විජේසිංහ මිය විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී ඉරෝෂා විජේසිංහ මිය විසින් ඉදිරිපත් කර ඇති අම්බුළුව පන්දෙනිය මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය ලබාදිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා ප්‍රාදේශිය සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06- 86. ඔිවිටිගම දේවාලපාර කොන්ක්‍රිට් කිරීම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම එම්.කේ. විජේසිරි මහතා )**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එම්.කේ. විජේසිරි මහතා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එම්.කේ. විජේසිරි මහතා -</u>**

**මේ මුදල ප්‍රමාණවත්නෑ මේ කටයුත්තට. විරුද්ධ වෙන්න එපා. මුදල රු. 650000.00 ක් ලෙස සංශෝධනය කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා -</u>

වැයශිර්ෂය මගින් විපක්ෂයටත් සියයට තිහක් ලබාදීම ක්‍රියාවට නංවලා. එයට ස්තුතියි. පසුගිය කාලසීමට බැළුවාම විපක්ෂයට කියලා මුදලක් ලැබුනේ මේ වතාවේ. මේ මන්ත්‍රිමණ්ඩලයට ගරුත්වය රැකගෙන ගමට වැඩක් කරන්න ප්‍රතිපාදන දිමට ස්තුතියි. මට ප්‍රතිපාදන එපා කිව්වත් මංගල මන්ත්‍රිතුමා කිව්වා ගමට කරන වැඩ. යෝජනාකල පාරේ පයින් යන්න විතරයි පුළුවන්. මේ ක කල හැකියි. මේ මුදලෙන්. අපි විරුද්ධ නෑ වැයශිර්ෂ මාරුකරලා මේ මන්ත්‍රිවරුන්ට ප්‍රතිපාදන දිම ගැන.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා -</u>

විපක්ෂය වෙනුවෙන් මුදලක් වෙක් කලාට ස්තුතියි. මම ඉදිරිපත්කිරීමට නියමිත මාර්ගය මාර්ගය මේවතාවේ ඇස්තමේන්තු වලට ඉදිරිපත් වෙලා නෑ. ඉදිරියේ ඉදිරිපත්කරනවා. මංගල මන්ත්‍රිතමාව දැනුවත් කලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා</u>

ඒ මාර්ගය කරමු.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති ඕවිටිගම දේවාලපාර කොන්ක්‍රිට් කිරීම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා සංශෝදනයක් ඉදිරිපත් වූ අතර ඒ අනුව ඕවිටිගම දේවාලපාර කොන්ක්‍රිට් කිරීම සඳහා වන රු. 650000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06 - 87.** වෙරළුගස්කොටලිය මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා වන රු. **230000.00** ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම රංගනාත් ගහබඩගේ මහතා )

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා විසින් ඉදිරිපත් කර ඇති වෙරළුගස්කොටලිය මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 88.** අත්වැල්පිටිය ජලයෝජනාක්‍රමය වැඩිදියුණුකිරිම සඳහා වන රු. **230000.00** ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම ආශා සමන්කුමාරි මිය )

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය විසින් ඉදිරිපත් කර ඇති අත්වැල්පිටිය ජලයෝජනාක්‍රමය වැඩිදියුණුකිරිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 89.** **මඩල පාලම අසල කරඳන ඇල නානතොටුපල සඳහා පියගැටපෙලක් ඉදිකිරිම සඳහා වන රු 150000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම පත්මසිරි දෙල්ගොල්ල මහතා)**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

දෙල්ගොල්ල මන්ත්‍රි වරයා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පත්මසිරි දෙල්ගොල්ල මහතා විසින් ඉදිරිපත්කර ඇති ඇස්තමේන්තුව වන මඩල පාලම අසල කරඳන ඇල නානතොටුපල සඳහා පියගැටපෙලක් ඉදිකිරිම සඳහා වන රු 150000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 90.** **ඇල්ලගාව පොදු සුසානභූමිය පහල කොටස බැකෝයන්ත්‍රයක් යොදා මාර්ගය සකස් කර මෘත දේහයන් තැබීම සඳහා ස්ථානයක් සකස් කිරිම සඳහා වන රු.80000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම පත්මසිරි දෙල්ගොල්ල මහතා )**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

දෙල්ගොල්ල මන්ත්‍රී වරයා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා විසින් ඉදිරිපත්කර ඇති ඇල්ලගාව පොදු සුසානභූමිය පහල කොටස බැකෝයන්ත්‍රයක් යොදා මාර්ගය සකස් කර මෘත දේහයන් තැබීම සඳහා ස්ථානයක් සකස් කිරිම සඳහා වන රු.80000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදිමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 91. කිතුල්පෙ මල්පොලවෙලපාර වැඩ අවසන් නොකර ඇති පාලමේ ඉතිරි කොටසේ වැඩ නිමකිරිම සඳහා වන රු.250000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම ඩග්ලස් ප්‍රේමදාස මහතා )**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**ඩග්ලස් ප්‍රේමදාස** මන්ත්‍රී වරයා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා විසින් ඉදිරිපත්කර ඇති කිතුල්පෙ මල්පොලවෙලපාර වැඩ අවසන් නොකර ඇති පාලමේ ඉතිරි කොටසේ වැඩ නිමකිරිම සඳහා වන රු.250000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**06- 92. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කුරුවිට නගරයේ ටයිප් 1 ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා යකඩදොරවල් ඉදිකිරීමට සඳහා වන රු. 230000.00 ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම තනූජා දීපානි චන්ද්‍රිකා මිය)**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී තනූජා දීපානි චන්ද්‍රිකා මිය විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී තනූජා දීපානි චන්ද්‍රිකා මිය විසින් ඉදිරිපත් කර ඇති කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කුරුවිට නගරයේ ටයිප් 1 ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා යකඩදොරවල් ඉදිකිරීමට සඳහා වන රු. 230000.00 ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 93. චතුයාය බවුන්ඩරය ගාමිණී මහතාගේ නිවස අසලින් මාර්ගයේ කානුව කැපීම සඳහා වන රු. 100000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම කේ.කේ.දයාවතී මිය)**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ.දයාවතී මිය විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ.දයාවතී මිය විසින් ඉදිරිපත් කර ඇති චතුයාය බවුන්ඩරය අසල ගාමිණී මහතාගේ නිවස අසලින් මාර්ගයේ කානුව කැපීම සඳහා වන රු. 100000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06 – 94. කඳන්ගොඩ පන්සල පහල පාර පුෂ්පා මහත්මියගේ නිවස අසලින් යන පාර කොන්ක්‍රිට් කිරිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම කේ.කේ.දයාවතී මිය)**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ.දයාවතී මිය විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.**

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී කේ.කේ.දයාවතී මිය විසින් ඉදිරිපත් කර ඇති කඳන්ගොඩ පන්සල පහල පාර පුෂ්පා මහත්මියගේ නිවස අසලින් යන පාර කොන්ක්‍රිට් කිරිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 95. උතුරු ගලුකාගම ප්‍රධාන මාර්ගයේ බෝක්කුව දමා සංවර්ධනය කිරිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම දේවින්ද කුමාර මහතා )**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**දේවින්ද කුමාර** ගරු මන්ත්‍රි වරයා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා විසින් ඉදිරිපත්කර ඇති උතුරු ගලුකාගම ප්‍රධාන මාර්ගයේ බෝක්කුව දමා සංවර්ධනය කිරිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 96. උතුරු ගලුකාගම වත්තේ කඩේ මාර්ගයේ නොාම්මර 3 වතු නිවාස වලට යන කාණුව සංවර්ධනය කිරිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධ තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි. (ගරු ප්‍රාසම එස්. චන්ද්‍රකුමාර මහතා )**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**එස්. චන්ද්‍රකුමාර ගරු** මන්ත්‍රී වරයා විසින් ඇස්තමේන්තු යටතේ ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මහාසභාවේ මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර මහතා විසින් ඉදිරිපත්කර ඇති උතුරු ගලූකාගම වත්තේ කඩේ මාර්ගයේ නොම්මර 3 වතු නිවාස වලට යන කාණුව සංවර්ධනය කිරිම සඳහා වන රු. 230000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**07.** කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම -

**07 - 01. 2025.10.10 දිනැති මුදල් කමිටු වාර්තාව.**

මුදල් කමිටු වාර්තාව පිලිබඳව මහාසභාවේ සළකා බලන ලදී. මංගල ඩයස් ගරු මන්ත්‍රීතුමා විසින් සභාවේ මන්ත්‍රීවරුන් සඳහා සභාවට පැමිණි අවස්ථාවලදි යම් කාර්යක් කරගැනීමට අසුන් ගැනිමට හෝ ස්ථානයක් නොමැති නිසා ඒ සඳහා කුඩා මුදලක් දරා ස්ථානයක් සූදානම් කරදෙන ලෙස ඉල්ලීය. අක්‍රිය විදුලි පංකා සකසා පැරණි රැස්වීම් ශාලාව ඒ සඳහා සුදුසු බවත් එහි ගබඩා කටයුතු නවත්වා ගබඩාකටයුතු ගබඩාවවේ සිදුකර එම ස්ථානය ලබාදීම සුදුසු බවත් සාකච්ජා විය. මෙහිදි ගරු සභාපතිතුමා විසින් ඒසඳහා කටයුතු කිරිමට තීරණය කරන ලදී.

07- 02. 2025.10.17 **දිනැති මුදල් කමිටු වාර්තාව.**

මුදල් කමිටු වාර්තාව පිලිබඳව මහාසභාවේ සළකා බලන ලදී

07– 03. 2025.10.22 දිනැති කාර්මික කමිටු වාර්තාව.

2025.10.22 දිනැති කාර්මික කමිටු වාර්තාව පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදී. මෙහිදී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් වාහන සඳහා ඉන්ධන භාවිතය අධීක්ෂණයකින් තොරව දිගින් දිගටම සිදුවන බවත් ත්‍රිරෝද රථයේ මෝටරය අළුත්වැඩියාවට පමනක් රු. 28000.00ක් වැය කර ඇති බවත් ප්‍රකාශකරන ලදී. විනිවිද භාවයකින් තොරව මෙසේ වාහන ඉන්ධන හා අළුත්වැඩියා කටයුතු සිදුකිරීස අධීක්ෂනය කරන ලෙස දැනුම්දුණි. එසේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා අදහස් දක්වමින් මෝටරය හැදූ බවට බිල්පතක් ඉදිරිපත්කලද එවැනි මුදලක් වැයවීම අසත්‍ය බවත්**

රාජ්‍ය ආයතන වුවත් ඒම ආයතනවලින්ද කටයුතු කරගැනීමේදී මෙම බිල්පත් පිලිබඳව පරික්ෂාකල යුතු බවත් ඩෙක්මා ආයතනයෙන් වැනි කටයුතු කිරීමේදි ඒ පිලිබඳව යම් සොයාබැලීමක් සිදුකර බිල්පත් ගෙවිය යුතු බවත් දැනුම්දෙන ලදි. මෙම අක්‍රමිකතා 2026 වසරේදිවත් නිවැරදි වියයුතු බවත් වෙන ආයතන වලිනුත් මිල ගනන් කැඳවා සිදුකරන ලෙසත් ඉන්ධන විශ්වාස නොකල හැකි ප්‍රමාණවලින් මිලදීගෙන ඇති බවත් මෙම කටයුතු අධීක්ෂණයෙන් සිදුවන්නේ නම් මෙවැනි

කටයුතු සිදු නොවන බවත් මේ සියළු කටයුතු අධීක්ෂනය කල යුතු බවත් දැනුම් දෙන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් අදහස් දක්වමින් **දක්ෂ බාස්වරු සභාවේ ලියාපදිංචියට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම සේවය ලබාගැනිමට නොහැකි වන බවත් ඒම විෂයටම ප්‍රාගුනා ඇති අය සිටින බවත් දැනුම් දුණි. ට්‍රැක්ටර් පෙරෙට්ටුවක් තැබීම සුදුසු බවත් ඒ තුලින් සියළු අඩුපාඩු මහහරවාගැනීමට සහාය වියහැකි බවත් දැනුම් දුණි. රන්ජන්ප්‍රදීප් මන්ත්‍රීතුමා විසින් එම පෙරෙට්ටුව කාර්මික කමිටු දිනකදීම යොදාගැනිම සිදුකරනලෙස දැනුම්දුණි. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා අදහස් දක්වමින් පොහොරබාව ජේසීබි යන්ත්‍රය යෙදවිමට ලක්ෂ 20ක් පමන යෙ◌ාදවා ඇති බවත් එම වියදම සිදුවූ ආකාරය තොරතුරු දක්වන ලෙසත් ප්‍රකාශ කලේය. ට්‍රැක්ටර් පෙරෙට්ටුවක් සිදුකිරිමට දිනයොදාගෙන එම කටයුත්ත සිදුකිරිම කලයුතුබව ගරු සභාපතිතුමා විසින් සඳහන් කරන ලදී.**

07- 04. 2025.09.12 දිනැති ජල කමිටු වාර්තාව.

2025.09.12 දිනැති ජල කමිටු වාර්තාව සළකා බලන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මෙම ව්‍යාපෘතියේ ආයම් වියදම් වාර්තා තියේද? ගිණුම් නිසි ලෙස නඩත්තු වනවාද?

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

එම කටයුතු නිසි ලෙස සිදුවෙන්නේ නෑ. ඒ පිලිබදව සුදුසු අයෙක් සේවයට ගත යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

මෙම ව්‍යාපෘතිය වෙනම එකක්. කඩසාප්පු පනත යටතේ යන එකක්. මේක නිරික්ෂනයක් විතරයි සභාවෙන් වෙන්නේ. සියළු කටයුතු කමිටු අනුමැතියෙන් කරනවා. ආදායමක් ලෙස සියයට 10ක් හෝ 15 ක් සභා අරමුදලට ගැනීම සුදුසුයි. මේ ව්‍යාපෘතියට සුදුසු අයෙක් ගිනුම් සැකසිමට ගන්න.

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ඉදිරි කමිටුවේදි ඒ පිලිබඳව කටයුතු කරමු.

**08 . ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කල ආදායම් පිලිබඳ ප්‍රගති වාර්තා-**

**08-01. 2025 ඔක්තොම්බර් මස ගෙවීම් වාර්තාව.**

**2025 ඔක්තොම්බර් මස ගෙවීම් වාර්තාව මහා සභාවේ සළකා බලන ලදී.**

**08-02. 2025 සැප්තැම්බර් මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව**

**2025 සැප්තැම්බර් මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව මහා සභාවේ සලකා බලන ලදී.**

**08-03. 2025 සැප්තැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය.**

**2025** සැප්තැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය මහා සභාවේ සලකා බලන ලදී.

**08- 04. 2025** සැප්තැම්බර් මස ඒකාබද්ධ වැය සාරාංශය.

**2025** සැප්තැම්බර් මස ඒකාබද්ධ වැය සාරාංශය මහා සභාවේ සලකා බලන ලදී.

**09.** සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

අපි සභා තින්දුවක් ගත්තාම ඒකේ ප්‍රගතියක් ඕනි. කනුගල්ල අවහිරතාවය ගැන කතා කලා. නිශ්චිතව සිදුවූ දෙයක් නෑ. ආපදාවක් ඉවත් කිරිමක්. කාර්මික නිලධාරිට වගකීමක් තියෙනවා. මේක විසඳන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ විජේසුන්දර මහතා -

**මිනිස්සුත් බලා ඉන්නවා. සභාව මැදිහත්වෙලා මේ කටයුත්ත කරයි කියලා. සභාවෙන් මේකටයුත්තට එනවා කියලා ලිපියකුත් එවලා තිබුනා. නමුත් ආවේ නෑ. ඒ නිවසේ කාන්තාව තණකොළ ටික එලි කරලා. මාත් බැළුවා. ඒ ජනතාව හිතන්නේ ඒ තණකොල ටික එලිකරපු තමා උනේ කියලා. දැඩි අනතුරක් තියෙනවා. ජීවිත හානිවෙයි. මේකටයුතු කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

**මලව උක්වත්ත මාර්ගය පිලිබඳව පැමිණිලි කරලා ජනාධිපතිතුමාට ලිපියක් ඇරලා. මටත් එවලා. අහල පහල අයත් මේගැන කතා කලා. මමත් සෑහීමකට පත්වෙන්නේ නෑ. මේ පිලිබඳව පරීක්ෂනයක් ඕනි. සභාවේ මුදල් අවභාවිතයක් වෙයි. මේ කර්මාන්තයට මුදල් ගෙව්වත් ජනතාව වෙනුවෙන් ජනතාව මට කිව්ව දේ වෙනුවෙන් මම විමර්ශනයක් ඉල්ලනවා මේ කර්මාන්තය ට.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා අතුකෝරළ මිය -

**මගේ යෝජනාවක්. පාරට වැලි යොදලා නැළු. ඒ පාරවල් දෙකේ වැඩ කරද්දි හැරුවාම මඩ ඇවිල්ලා. ඒ ආපු මඩ වතුර ගලලා පාර දිගේ . එතන වැලි පිලිබඳව ගැටළුවක් නෑ. දේවින්ද මන්ත්‍රිතුමාට නිර්නාමික ලිපියක් ඇවිල්ලා. නම ගම මොකතු නෑ. දූෂන විරෝධි හඬ කියලා. ඒවැනි පෙත්සම් වලංගුද? ඒවැනි පෙත්සම් වලට පරික්ෂා කරනවද? ඒ ව්‍යාපෘති දෙක හොඳටම කරපුවා. මේ විධිහට කටයුතු කරනවානම් මාත් පෙත්සම් ගහනවා. බිල් ගෙවන්න පෙර හැමදේම සභාවට දාන්න. 46 ට ම එක වගේ කරන්න. වෙනස් විධිහට සලකන්න එපා. මම පුද්ගලිකව කව්ද මේ පෙත්සම ගැහුවේ හොයනවා. නමක් ගමක් නෑ. මේ තත්වය හොඳ නෑ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

**එක කර්මාන්තයක් හොඳට කරලා. රණවිරු එක. සංවර්ධන යෝජනාවක්. උක්වත්තමාර්ගය විතරයි ගැටළුව. විඩියෝවත් බැළුවා. මඩවල උතුරලාළු. ගමේ අය**

පෙත්සම් ගහලා. මටත් ලැබුනා. මම ඒ වෙනුවෙන් පෙනී සිටිනවා ජනතාවගේ දැනුම්දිම මත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා අතුකෝරළ මිය.-</u>

උක්වත්තමාර්ගයට මුදලගෙවනවාද?

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අදාල මුදල ගෙවීම සිදුකරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රොෂාන් මධුශංක මහතා -</u>

වැයශිර්ෂ මගින් ප්‍රතිපාදන දිම පිලිබඳව ස්තුතියි. ඒ පිලිබඳව කටයුතු කල සියළු දෙනාට ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රන්ජන් ප්‍රදීප් මහතා -</u>

ඊයේ පාර්ලිමේන්තුවේ අයවැය සම්මත කලා. පළාත් පාලනයටත් මුදල් වෙන් කරලා. මේ සභාවටත් ජේසීබී එකක් ඉල්ලන්න. තියෙන එක හරිමදි. අපිට විශාල ප්‍රතිලාභයක් වෙයි. අපේ කටයුතු වලට විශාල සහායක් වෙයි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සභාවටත් ජේසිබිඑකක්, ජල බවුසර්, ට්‍රැක්ටර් ට්‍රේලර්, ඉල්ලුවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>

එරත්න ආනන්ද විද්‍යාලයේ ළමයි 300 ක් විතර ඉන්නවා. යම් කෙනෙක් ආණ්ඩුකාරතුමියට පෙත්සමක් ගහලා පාසැලට ළමයින්ට එන්න අවහිරයි ප්‍රවාහනයත් නෑ කියලා. විද්‍යාලය තියෙන තැන සුදුසු නෑ කියලා. වෙන තැනකට ගන්න කියනවා. මමත් මුල්උනා මේ ප්‍රාථමිකය ගන්න. ළමයි 35 හිටපු විද්‍යාලයේ දැන් ළමයි 350 ක් විතර ඉනක්නවා. දෙමව්පියන්ගේ ඉල්ලිම අනුවයි මේ විද්‍යාලය හැදුවේ. ශිෂ්‍යත්වය පාස් ළමයි ඉන්නවා. මේ පෙත්සම ගැන සාකච්ජා වෙනවව. භෞතික සම්පත් තියෙන හොඳට යන පාසැලක් නතරකිරීම සුදුසු නෑ. ගමේ ප්‍රජාව පාසැල එක්ක ඉන්නවා. මේ පාසැලට මාර්ග දෙකක් තියෙනවා. කුරුගඟ එරත්න පාළම පළල්. වටේ පාරේ බස්රථයක් යන්න පුළුවන්. මේ කටයුත්තට මැදිහත්වෙන්න. ආණ්ඩුකාරතුමා එක්ක ස්ථාන පරික්ෂාවක් කරන්න. විදුහල්පතිතුමා අපි ත් සහභාගී වෙන්නම්.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

පාසැල් වහන්න කටයුතු කරන්නේ නෑ. මේ සම්බන්ධව කරුණු අරන් කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මේ සභාවට මාධ්‍ය ලෙස සහභාගී වෙන්නේ කව්ද? මේ ස්ථානයේ අද සිටින අය කුමණ මාධ්‍යයෙන්ද?

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**එකම දිනයේ මහා සභා රැස්වීම් නිසා මාධ්‍යට සහභාගී වීමේ අපහසුවක් තියෙනවා. අපි ඉදිරියේදී සහභාගීවන නොදන්නා අයගේ මාධ්‍ය හැඳුනුම්පත බලමු.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>

**මෙදිනට නියමිත මහා සභාවේ කටයුතු අවසන් වූ අතර ගරු සභාපතිතුමා විසින් සභාවේ සියළු කටයුතු සඳහා සහාය දුන් සියළු ගරු මන්ත්‍රී තුමන්ලාට හා ගරු උප සභාපති තුමාට , මාධ්‍ය හිතවතුන්ට, කාර්ය මණ්ඩලයට ස්තුතිය පළ කරන ලදි.**

**මහා සභා රැස්වීමේ කටයුතු ප.ව.5.30 ට පමණ අවසන් කරන ලදී.**

එම්.විකසිත පුෂ්පසූරිය ,
සභාපති,
ප්‍රාදේශීය සභාව, කුරුවිට

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී